වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
ANNUAL REPORT 2017

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව
இலங்கை ஒலிபரப்புக் கூட்டுத்தாபனம்
Sri Lanka Broadcasting Corporation

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව

වාර්ෂික වාර්තාව
සහ
ගිණුම් ප්‍රකාශනය

2017 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා

ගරු මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
කොළඹ.

ගරු අමාත්‍යතුමනි,

1971 අංක 38 දරන මුදල් පනතේ 14 (1) වගන්තිය ප්‍රකාරව 2017 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය වෙනුවෙන් පහත සඳහන් ලේඛන ඇතුළත් සංස්ථාවේ වාර්ෂික වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරමි.

1. 2017 ජනවාරි මස 01 වන දින සිට 2017 දෙසැම්බර් මස 31 වන දින දක්වා වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව ඉටු කළ කාර්යයන් පිළිබඳ පාලන වාර්තාව.
2. 2017 ජනවාරි මස 01 දින සිට 2017 දෙසැම්බර් මස 31 වන දින දක්වා වූ ගිණුම් වර්ෂය සඳහා ගිණුම් සම්බන්ධ වාර්තාව.
3. 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අවසන් ගිණුම් සම්බන්ධයෙන් වූ විගණකාධිපති වාර්තාව.
4. 2017 වර්ෂයේ විගණකාධිපති වාර්තාව සඳහා සංස්ථාව ඉදිරිපත් කළ පරිකථනය.

මෙයට - විශ්වාසී,

සභාපති
ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව
කොළඹ 07

පටුන

		පිටු අංක
1.	පාලන වාර්තාව	01 - 10
2.	වාර්ෂික ගිණුම් ප්‍රකාශය	11 - 35
3.	මූල්‍ය ප්‍රකාශය පිළිබඳ විගණකාධිපති වාර්තාව	37 - 66
4.	2017 විගණකාධිපති වාර්තාව සඳහා සංස්ථාවේ පරිකථනය	67 - 76

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව

දැක්ම

ප්‍රමුඛ ශ්‍රී ලාංකික ගුවන්විදුලි සන්නිවේදකයා වීම.

මෙහෙවර

ශ්‍රාවකයාගේ ජීවිතයට බලපාන ආර්ථික, සමාජීය, සංස්කෘතික, සදාචාරාත්මක, අධ්‍යාපනික, විනෝදාත්මක යනාදී විවිධ ක්ෂේත්‍ර ඇසුරෙන් ඔවුන්ගේ ජීවන තත්ත්වය වඩාත් උසස් මට්ටමකට ගෙන වීමෙන් ඔවුනගේ ජීවිත ආලෝකමත් කිරීමක් උදෙසා දැනුම, ආකල්ප සහ කුසලතා වර්ධනයට සමත්වන ආකාරෙයන් ගුවන්විදුලි මාධ්‍ය මෙහෙයවීම.

අරමුණු

1. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා තුන සඳහා ශ්‍රාවක පිරිසක් සහිත ගුවන්විදුලි නාලිකා පවත්වාගෙන යන ආයතනය ලෙස කටයුතු කිරීම.

2. වගකීමෙන් යුතුව සමබර තොරතුරු කඩිනමින් ලබාදෙන, ශ්‍රී ලාංකික මාධ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා ලෙස කටයුතු කිරීම.

3. දේශීය සංස්කෘතියේ අභිවෘද්ධිය පිණිස උසස් සහ නිර්මාණාත්මක වැඩසටහන් නිෂ්පාදනය කර ඉදිරිපත් කිරීම.

4. දැනුම, ආකල්ප සහ කුසලතාවන්ගෙන් පිරිපුන් ස්වයං අභිප්‍රේරණ කාර්ය මණ්ඩලයක් බිහි කිරීමට අවශ්‍ය පුහුණුව ලබාදීම.

5. නිෂ්පාදන සහ විකාශන තාක්ෂණය නිසි පරිදි යාවත්කාලීන කරමින් දෙස් විදෙස් ශ්‍රාවකයන්ට පැහැදිලි ශ්‍රවණ තත්ත්වයක් ලබාදීම.

6. ආචාරධර්ම පද්ධතියකට අනුව හරවත් ගුවන්විදුලි මාධ්‍ය සම්ප්‍රදායක් බිහි කිරීම උදෙසා පුරෝගාමී ආයතනය ලෙස ක්‍රියා කිරීම.

7. ජාතික ගුවන්විදුලිය ලෙස රාජ්‍ය ප්‍රතිපත්ති හා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධව ජනතාව දැනුවත් කිරීම සඳහා නිර්මාණශීලි දායකත්වය සැපයීම.

8. යහපත් මූල්‍ය පාලනයක් හා මානව සම්පත් කළමනාකාරීත්වයක් පවත්වාගෙන යාම.

9. තරගකාරී වෙළෙඳපොළ උපායශීලීව ජය ගැනීම.

පාලන වාර්තාව - 2017

පාලන වාර්තාව - 2017

හැඳින්වීම

1966 අංක 37 දරන පාර්ලිමේන්තු පනත යටතේ ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව 1967 ජනවාරි මස 05 වන දින සිට ක්‍රියාත්මක වන ලෙසට ප්‍රතිෂ්ඨාපනය කරන ලද්දකි.

2017 ජනවාරි මස 01 වෙනි දින සිට දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා වූ මාස 12 ක කාල පරිච්ඡේදය මෙම වාර්තාවෙන් ආවරණය වේ.

සමාලෝචනයට ලක්වන කාල පරිච්ඡේදය තුළ පහත දැක්වෙන සාමාජිකයන් සංස්ථා මණ්ඩලයට ඇතුළත් වූහ.

2018 ජනවාරි මස සිට

1.	නීතීඥ නන්ද මුරුත්තෙට්ටුවේගම මහතා	- සභාපති/ සංස්ථා මණ්ඩල සාමාජික
2.	එස්. ඒ. සී. කුලතිලක මිය	- භාණ්ඩාගාර නියෝජිත
3.	ආචාර්ය අරුන්දතී ශ්‍රී රංගනාදන් මිය	- සංස්ථා මණ්ඩල සාමාජික
4.	වරලත් ඉංජිනේරු කිත්සිරි සමරසිංහ මහතා	- සංස්ථා මණ්ඩල සාමාජික
5.	ඩබ්. ජයසිරි මහතා	- සංස්ථා මණ්ඩල සාමාජික
6.	විශාරද දීපිකා ප්‍රියදර්ශනී පීරිස් මෙනවිය	- සංස්ථා මණ්ඩල සාමාජික

2018 ජූලි මස සිට

1.	නීතීඥ සුදර්ශන වික්‍රමසිංහ ගුණවර්ධන මහතා	- සභාපති/ සංස්ථා මණ්ඩල සාමාජික
2.	ධනුෂ්ක රාමනායක මහතා	- සංස්ථා මණ්ඩල සාමාජික/ ක්‍රියාකාරී අධ්‍යක්ෂ
3.	එම්. ජේ. ආර්. ඩේවිඩ් මහතා	- සංස්ථා මණ්ඩල සාමාජික
4.	සිද්දි එම්. ෆාරුක් මහතා	- සංස්ථා මණ්ඩල සාමාජික
5.	ඩබ්. ජයසිරි මහතා	- සංස්ථා මණ්ඩල සාමාජික

2018 ජූලි මස සිට

1.	සිද්දි එම්. ෆාරුක් මහතා	- සභාපති/ සංස්ථා මණ්ඩල සාමාජික
2.	ධනුෂ්ක රාමනායක මහතා	- සංස්ථා මණ්ඩල සාමාජික/ ක්‍රියාකාරී අධ්‍යක්ෂ
3.	සුදර්ශන ගුණවර්ධන මහතා	- සංස්ථා මණ්ඩල සාමාජික
4.	එම්. ජේ. ආර්. ඩේවිඩ් මහතා	- සංස්ථා මණ්ඩල සාමාජික
5.	ඩබ්. ජයසිරි මහතා	- සංස්ථා මණ්ඩල සාමාජික
6.	බී. කේ. ආර්. බාලසූරිය මහතා	- භාණ්ඩාගාර නියෝජිත

පාලන වාර්තාව

විද්‍යුත් මාධ්‍ය ක්ෂේත්‍රයේ පුරෝගාමී රාජ්‍ය මාධ්‍ය ආයතනය වන ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව 2017වර්ෂයේ ජාතික නාලිකා 6 ක්, ප්‍රාදේශීය සේවා 6 ක් සහ එක් ප්‍රජා ගුවන්විදුලියක් ක්‍රියාත්මක කර තිබේ. ශ්‍රාවකයන්ගේ දැනුම, රසවින්දනය උදෙසා හරවත් වැඩටසහන් විකාශය කිරීම ප්‍රමුඛතම කාර්යය සේ සලකා ඔවුන්ගේ පීවන තත්ත්වය නගා සිටුවීමේ අරමුණින් 2017 වර්ෂය ගුවන්විදුලි සංස්ථාව තම ජාතික වගකීම ඉටුකර ඇත.

■ සිංහල ස්වදේශීය සේවය

ලාංකීය ගුවන්විදුලි ඉතිහාසයේ හඳ ලකුණ සේ සැලකෙන සිංහල ස්වදේශීය සේවය, ගුවන්විදුලියේ ආරම්භයේ සිටම අද දක්වා තම අනන්‍යතාවය රැකගනිමින් සදාචාරවත් මාධ්‍ය සම්ප්‍රදායක් ජාතියට දායාද කිරීමේ ජාතික අරමුණ පෙරදැරිව 2017 වර්ෂයේ තම වැඩසටහන් පෙළගැස්ම සකසා තිබුණි.

ගීතය, සාහිත්‍ය, කලා, සිනමා, නාට්‍ය ආදී සෞන්දර්යාත්මක ප්‍රවේශයන්ගෙන් ජනමනස ආමන්ත්‍රණය කිරීමේ අරමුණින් සිංහල ස්වදේශීය සේවය 2017 වර්ෂය තුළ "ගී හර සරණිය", "රූපණ", "රන් ගී සර", "උල්පත් අසල", "විශ්ව මධුර" ආදී නව වැඩසටහන් හඳුන්වා දී ඇත. සන්නිවේදනය පිළිබඳ නව මානයන් හා සාකච්ඡාමය වැඩසටහනක් 'සංකථන' වැඩසටහන ද වාර් තාක්ෂණය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් යුතුව 'වාරි මණ්ඩපය' වැඩසටහන ද වස විස නැති දේශීය ගොවිතැන ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් 'තිරසර ගොවිතැනක් සුරක්ෂිත හෙටක්' වැඩසටහන ද කාන්තාවගේ සමාජ, ආර්ථික, දේශපාලනික දැනුම පුළුල් කිරීමේ අරමුණින් 'කාන්තා ප්‍රබෝධය' වැඩසටහන ද ශ්‍රාවකයා නොදකින මානයකින් ශ්‍රාවක මනසට සමීපවීමේ අරමුණින් 'සමීප රූප' වැඩසටහන ද ජනතාවට බලපාන විවිධ සෞඛ්‍ය ගැටලු හා රෝහල් සම්බන්ධ ගැටලු සජීවී ලෙස සෞඛ්‍ය අමාත්‍යවරයාට යොමු කිරීමේ අරමුණින් 'ඇමතිතුමාගෙන් අහන්න' වැඩසටහන ද දෙමළ භාෂාව කතා කිරීම හා ප්‍රචලිත කිරීමේ අරමුණින් 'දන්නවනම් උගන්වන්න දන්නැත්නම් ඉගෙන ගන්න' වැඩසටහන ද දිවයින පුරා රාජමහා විහාරස්ථානවල සිට මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ දරුවන් දැනුවත් කිරීමේ අරමුණින් 'දැහැමි පරපුරක් මතින් නිදහස් රටක්' වැඩසටහන ද 2017 වසරේ සිංහල ස්වදේශීය සේවය හඳුන්වා දුන් නව වැඩසටහන් වේ.

ස්වදේශීය සේවය මඟින් 2017 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලද ප්‍රවර්ධන වැඩසටහන් වශයෙන් 'ස්වදේශීය රටා' 'සරසවි හඬ' 'ප්‍රබුද්ධ ගී' 'ලෝ අතැඹුල' 'හිමවි අරණ' 'නව ගී පද සංකල්පනා' 'සත්‍යෙක්ෂණය' පෙන්වාදිය හැක.

ඊට අමතරව ස්වදේශීය සේවයේ ඉලක්කගත ශ්‍රාවකයන් වෙනුවෙන් දීර්ඝ කාලයක සිට විකාශය කරන ලද 'ගුවන්විදුලි රඟ මඩල' 'ලෝකාවලෝකනය' 'රසාංජලී' 'ආලෝචනා' 'සම්භාවනා' 'ඉරිදා සංග්‍රහය' 'ආවර්ජනා' 'ගොවිතැනට පැයක්' 'මිහිතලය' 'තිරසර දියවර' 'ඉඳුරු දොර' 'විශ්වයේ වින්දනීය හෝරාව' ආදී 30 කට ආසන්න ප්‍රමාණයක් වූ වැඩසටහන් 2017 වර්ෂයේ දී ද ශ්‍රාවක ප්‍රසාදය දිනා ගැනීමට ඉවහල් වූ බව කිව මනාය.

■ අධ්‍යාපන සේවය

2017 වර්ෂයේ ද පෙර වර්ෂයන්හි මෙන්ම ගුවන්විදුලි සංස්ථා අධ්‍යාපන සේවය, ස්වදේශීය සේවා ගුවන්කාලය තුළ දිනපතා ප.ව. 3.00 සිට 4.00 දක්වා ද සෙනසුරාදා පමණක් තවත් අමතර විනාඩි 30 ක කාලයක් ද දෙමළ ස්වදේශීය සේවය ඔස්සේ සතියේ දින 5 දී ප.ව. 5.00 සිට 5.30 දක්වා ද අධ්‍යාපන සේවා වැඩසටහන් ප්‍රචාරයට යොදා ඇත. උසස් පෙළ විෂය නිර්දේශයට අදාළව දේශපාලන විද්‍යාව වැඩසටහන 2017 වර්ෂයේ දී හඳුන්වා දුන් නව වැඩසටහනකී. අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 5 වන ශ්‍රේණිය ශිෂ්‍යත්වය, අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාග ඉලක්ක කරගනිමින් 2017 වර්ෂයේ අධ්‍යාපන සේවය මඟින් විභාග උපකාරක සම්මන්ත්‍රණ පවත්වා ඇත. අධ්‍යාපන සේවා ගුවන්කාලය දරුවන්ට ශ්‍රවණය කිරීමට සුදුසු වේලාවකට ගෙන ඒම, පාසල් දරුවන්ට කෙරෙන වැඩසටහන් මෙන්ම පාසල් හැරගිය දරුවන්, උසස් අධ්‍යාපනය හදාරණ දරුවන්, වැඩිහිටියන් වැනි විවිධ ස්ථරයන් උදෙසා අධ්‍යාපන වැඩසටහන් ඉදිරිපත් කිරීම, ගුවන්විදුලි පරිශ්‍රයෙන් බැහැරව දුෂ්කර පාසල් ආශ්‍රිතව විවිධ අධ්‍යාපනික වැඩසටහන් නිර්මාණය කිරීම, දුෂ්කර පාසල් සඳහා අධ්‍යාපනික වශයෙන් සේවයක් සැපයීමට අවශ්‍ය කටයුතු කිරීම, ජාතික අධ්‍යාපන ආයතනය හා එක්ව කටයුතු කිරීමට පාලන අධිකාරියේ මැදිහත්වීම ආදී කරුණු 2017 වසරේ විශේෂතා ලෙස හඳුන්වා දිය හැක.

■ වෙළඳ සේවය

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ වෙළඳ සේවය 2017 වර්ෂයේ දී ද හරවත් කාලීන වැඩසටහන් හා නෝදාත්මක වැඩසටහන් රාශියක් ඉදිරිපත් කරමින් ශ්‍රාවක ප්‍රජාවගේ තොරතුරු දැනගැනීමේ අයිතිය තහවුරු කර ඇත. දෛනික කටයුතු ආරම්භ කරන ශ්‍රාවකයාගේ මනස ප්‍රබෝධමත් කිරීමේ අරමුණින් විද්වත් පුද්ගලයකුගේ විචාරශීලී අදහස් ද එක්කොට "දවසේ පිබිදෙන ගීතය" ශ්‍රාවක ගීත ඉල්ලීම් සඳහා අවස්ථාව ලබාදෙමින් "ඔබේ නමින් ගී" මිශ්‍ර ගීත රස විඳීමට කැමති ශ්‍රාවකයන් උදෙසා "ගීත සම්භාවනාව" ග්‍රැමෆෝන් තැටි ආශ්‍රයෙන් "HIS MASTER'S VOICE" උත්තර භාරතීය හින්දී ගී වැඩසටහනක් වන "ස්වර වසන්තය" 2017 වසරේ වෙළඳ සේවය ඔස්සේ ප්‍රචාරය කරන ලද සංගීත වැඩසටහන් වේ.

ශ්‍රාවක ප්‍රජාවගේ සෞඛ්‍ය දැනුම වර්ධනය කිරීමේ අරමුණින් නිරෝගී දිවියකට හුරුවීමේ අගය පෙන්වා දීම සඳහා විශේෂඥ වෛද්‍ය උපදෙස් ලබාදෙන "ආරෝග්‍යා පරමාලාභා" වැඩසටහන, "සුව අරණ" සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන හා "සතියේ වෛද්‍ය සායනය" සාකච්ඡාමය වැඩසටහන ප්‍රචාරයට යොදා ඇත.

චිත්‍රපට ප්‍රිය කරන හා ඒ පිළිබඳ තොරතුරු සොයා යාමට කැමැත්ත දක්වන ශ්‍රාවකයින් උදෙසා "සලරූ සේයා" වැඩසටහන ද රේඩියෝ විචිත්‍රාංගයක් වන "සොඳුරු සෙවන" වැඩසටහන ද අමරණීය මතකයන් ඉතිරි කළ කලාකරුවන් පිළිබඳ වැඩසටහනක් වන "නොමියෙන මිනිසුන්" වැඩසටහන ද කුසලතා පිරිපුන් කලාකරුවන්ගේ සාර්ථකත්වය සහ ජීවන අත්දැකීම් ඇතුළත් "සතුටු කැදැල්ල" වැඩසටහන ද සරසවි පරිකල්පනයන් ඉස්මතු කරන ප්‍රවීණ ගත්කතුවරුන්ගේ කෙටි කතා ඇසුරෙන් සැකසුනු විශ්ව විද්‍යාල සිසු සිසුවියන් ඉදිරිපත් කරන නාට්‍යමය වැඩසටහක් වන "සරස රඟමඬල" වැඩසටහන ද 2017 වසරේ වෙළඳ සේවා ගුවන් කාලය තුළ ප්‍රචාරය කරන ලද වැඩසටහන් වේ.

■ සිටි එෆ්. එම්. සේවය

සංකීර්ණ සමාජ රාමුවක් තුළ අභියෝග ජයගනිමින් ගුවන්විදුලි කෙෂ්ත්‍රයේ වඩාත්ම ඵලදායී හා ජනප්‍රියම වාණිජ ගුවන්විදුලි නාලිකාව බවට පත්වීමේ අභිලාෂයෙන් ක්‍රියාත්මක වන ගුවන්විදුලි සංස්ථා සිටි එෆ්. එම්. සේවය තරඟකාරී වෙළඳපොල උපායශීලීව ජයගැනීම, ජාතික වගකීමකින් යුතුව විශ්ව දැනුම සහ තොරතුරු නිවැරදිව සමබරව විශ්වසනීයත්වයෙන් යුතුව ශ්‍රාවකයා වෙත යොමු කිරීම, උසස් රුචිකත්වයක් සහිත ශ්‍රාවක සමාජයක් බිහි කිරීම තුළින් දේශීය සංස්කෘතියේ අභිවර්ධනය පිණිස නිර්මාණාත්මක වැඩසටහන් නිෂ්පාදනය කර ඉදිරිපත් කිරීම ආදී අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස 2017 වර්ෂයේ දී සිටි එෆ්. එම්. සේවය වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කර ඇත.

අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ගුවන්විදුලි සංස්ථා දිනය වන ජනවාරි මස 5 වන දින සංස්ථාවේ 50 වන සංවත්සරය සමරමින් නව ගොඩනැගිල්ල විවෘත කිරීම හා ඊට සමගාමීව පැවැත් වූ සර්ව රාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනය සිටි එෆ්. එම්. සේවය ඔස්සේ සජීවීව ප්‍රචාරය කිරීම 2017.01.05 වන දින සිදුවිය.

කාලීන සිදුවීම් හා ජනතා ප්‍රශ්න කේන්ද්‍ර කරගනිමින් 'සීතල ඊතල' වැඩසටහන ද රසවින්දනාත්මක වැඩසටහනක් වශයෙන් මාසිකව ප්‍රචාරයට යොදා ඇති 'මිහිර මනරම්' වැඩසටහන ද නව වැඩසටහන් වශයෙන් 'කැෆේ කයිවාරුව, අහස් ගව්ව, සහෘද ගීත දහය, කලාබර හැන්දෑව, නෑසෙන ගී 10, කොලිවුඩ් සිහින, නිව්ස් ප්‍රින්ට්' ආදී වැඩසටහන් ද 2017 වර්ෂයේ සිටි එෆ්. එම් සේවය ඔස්සේ ජනගත කළ විශේෂ වැඩටසහන් ලෙස හඳුන්වා දිය හැක. ඊට අමතරව ජාතික, ආගමික, සංස්කෘතික වශයෙන් වැදගත්වන නිදහස් දින උළෙල, සිංහල දෙමළ අලුත් අවුරුද්ද, වෙසක් උත්සවය, නත්තල් උත්සවය ආදී මූලික කරගනිමින් විශේෂ වැඩසටහන් පෙර වර්ෂයන්හි මෙන්ම 2017 වර්ෂයේ ද ප්‍රචාරයට යොදා ඇත.

■ දෙමළ ස්වදේශීය සේවය

දමිළ ජනතාවගේ සංස්කෘතික අනන්‍යතාවයන් අනුව යමින් ඔවුන්ගේ ජීවිතයට බලපාන සමාජීය, ආර්ථික, දේශපාලන, අධ්‍යාපනික හා රසවින්දනාත්මක වැඩසටහන් ප්‍රචාරය කිරීම 2017 වර්ෂයේ ද දෙමළ ස්වදේශීය සේවය ඔස්සේ සිදුකර ඇත.

ඒ අතර තෙපොංගල් දිනය, සරස්වතී පූජාව සංස්කෘතිකමය වැදගත්කමින් යුතු විශේෂ අවස්ථාවන් සම්බන්ධයෙන් වැඩසටහන් ප්‍රචාරය කර ඇති අතර, ඒ හා බැදුණු විවිධ විචිත්‍රාංගයන් නිෂ්පාදනය කර ඇත. හින්දු ආගම හා වෙනත් ආගම් අදහන දමිළ ජනතාව ඉලක්ක කරගනිමින් විශේෂ ආගමික වැඩසටහන් ප්‍රචාරය කර ඇත. 2017 වර්ෂයේ දී ප්‍රචාරය කළ ආගමික වැඩසටහන් ලෙස 'යාවයි තිරකදර්ශනම්' බයිබල් වැඩසටහන ද 'දීපම්' ක්‍රිස්තියානි ආගමික වැඩසටහන ද විශේෂයෙන් හඳුන්වාදිය හැකිය. ඊට අමතරව වෙසක් උත්සවය හා පොසොන් උත්සවය නිමිතිකොට ජාතික උත්සව අවස්ථා ප්‍රචාරයට යොදා ඇත. හජ්ජි උත්සවය සම්බන්ධයෙන් වැඩසටහන් ප්‍රචාරයට යොදා ඇත.

ජාත්‍යන්තර වශයෙන්, ජාතික වශයෙන් හා සමාජීය වශයෙන් වැදගත්වන විවිධ දින මූලික කරගනිමින් විශේෂ වැඩසටහන් ප්‍රචාරයට යෙදීම සහ ඒවා සම්බන්ධයෙන් පැවති ජාතික උත්සව ආවරණය කිරීම 2017 වසරේ ද සිදු කර ඇත. එම වැඩසටහන් ලෙස "රටවටා අවුරුදු" සිංහල හින්දු අලුත් අවුරුදු වැඩසටහන, නිදහස් දින සැමරුම, මැයි දින සැමරුම, මත්ද්‍රව්‍ය නිවාරණ දින වැඩසටහන, ලෝක ළමා දින වැඩසටහන, කාන්තා දින වැඩසටහන දැක්විය හැක.

■ තෙන්ඩ්‍රල් සේවය

තරුණ ප්‍රජාව ඉලක්ක කරගනිමින් ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව ආරම්භ කර ඇති දෙමළ මාධ්‍ය ගුවන්විදුලි නාලිකාව වන්නේ තෙන්ඩ්‍රල් සේවයයි. 2017 වසරේ ද තෙන්ඩ්‍රල් සේවයේ අනන්‍යතාවය රැකගනිමින් විවිධ ජාතික, ආගමික, සමාජීය වැදගත්කම් සහිත දිනයන් හි විශේෂ වැඩසටහන් ප්‍රචාරය කිරීම සිදුකර ඇත. ඒ අනුව තෙපොංගල් දිනය හා සරසවතී පූජාව සඳහා විශේෂත්වයක් ලබා සංස්ථා පරිශ්‍රය තුළ උත්සව සංවිධානය කිරීම පෙර වර්ෂවල සේ ම 2017 වර්ෂයේ ද උත්කර්ෂවත් අන්දමින් සිදුවිය. සිංහල හින්දු අලුත් අවුරුදු දිනය, රාමසාන් උත්සව සමය, හජ්ජි උත්සවය, නිදහස් දිනය, කාන්තා දිනය, ලෝක ළමා දිනය ආදිය සඳහා විශේෂ වැඩසහන් ප්‍රචාරය කර ඇත. ඊට අමතරව නල්ලූර් පූජා සමය තුළ තත්ත්ව විස්තර වාර්තා සැපයීමද සිදු කර ඇත.

දෙමළ භාෂාව කතා කරන ශ්‍රාවකයාගේ දැනුම විනෝදය සඳහා 'පාට්ටක්ක පාට්ට' නමින් පටිගත කරන ලද ගීතයෙන් ගීතය වැඩසටහන ද දැක්විය හැකිය. ගීත, නාට්‍ය, විකට ජවනිකා වැනි විවිධ විචිත්‍රාංගයන් ඇතුළත් දැනුම, විනෝදය

සපිරි වැඩසටහන් රාශියක් 2016 වර්ෂයේ ශ්‍රාවක ජනතාව වෙත තිළිණ කර ඇත.

ක්‍රිස්තියානි ආගමික වැදගත්කමකින් යුතු තලවිල හා මඩු දේවස්ථාන වන්දනා සමයන්හි විශේෂ වැඩටසහන් සහ තත්ත්ව විස්තර වාර්තා ලබාදීම සිදුකරනු ලැබිණි. එසේම ක්‍රිස්තියානි / කතෝලික ආගමික වැඩසටහන් රාශියක් සේවාදායක අනුග්‍රහය යටතේ තෙන්ඩ්‍රල් සේවය ඔස්සේ ප්‍රචාරයට යොදා ඇත.

- **මුස්ලිම් සේවය**

වසර 67 ක පමණ ඉතිහාසයක් ඇති ශ්‍රී ලංකාවේ මුස්ලිම් ප්‍රජාව වෙනුවෙන් මුස්ලිම් සංස්කෘතික හා ඉස්ලාම් ආගමික පසුබිම පදනම් කරගෙන විකාශය වන එකම ගුවන්විදුලි නාලිකාව ගුවන්විදුලි සංස්ථා මුස්ලිම් සේවයයි. ලාංකීය මුස්ලිම් සමාජය තුළ මෙන්ම දකුණු ඉන්දියානු මුස්ලිම් ජනයා අතර ද මෙම සේවය ප්‍රසාදයට පත්ව ඇත. අන්තර්ජාලය ඔස්සේ ලොව වටා මුස්ලිම් ප්‍රජාව ශ්‍රවණය කරන මුස්ලිම් සේවයේ වැඩසටහන්වලින් 85% ක් පමණ අනුගාහක දායකත්වය ඇතිව ප්‍රචාරය කෙරෙන වැඩසටහන් වේ. ජනවර්ගයක් මූලික කරගනිමින් සිය විකාශන කටයුතු සිදු කරනු ලැබුව ද ගුවන්විදුලි සංස්ථා මුස්ලිම් සේවය සැමවිටම ජාතීන් අතර සහජීවනය සහ සහයෝගීතාවය වර්ධනය කිරීම ප්‍රධානතම අරමුණක් වශයෙන් සලකා වැඩසටහන් සම්පාදනය කර ඇති අතර 2017 වසර ද මුස්ලිම් ප්‍රජාවට සේ ම සමස්තයක් ලෙස ශ්‍රී ලාංකික ජනතාව වෙත සිය සහයෝගීතාවය ප්‍රධානය කළ වසරකි. ඒ අතර ආගමික වැඩසටහන්, ළමා හා කාන්තා වැඩසටහන්, සංගීතමය හා නාට්‍ය වැඩසටහන්, තරුණ ප්‍රජාව සඳහා වැඩසටහන්, ජාතික වැදගත්කමින් යුත් වැඩසටහන්, මැලේ මැගසින්, උර්දු මැගසින් ආදී වැඩසටහන් හදුන්වා දිය හැක. ඊට අමතරව සිංහල ස්වදේශීය සේවය ඔස්සේ සිංහල භාෂාවෙන් ඉස්ලාම් ආගමික වැඩසටහනක් ද ප්‍රචාරයට යොදා ඇත.

- **ඉංග්‍රීසි සේවය**

ගුවන්විදුලි සංස්ථා ඉංග්‍රීසි සේවය සංස්කෘතික, ආගමික, සාමාජීය, රසවින්දනාත්මක හා කාලීන වැදගත්කමක් ඇති වැඩසටහන් මඟින් හා සංගීතම වැඩසටහන් තුළින් ඉංග්‍රීසි සේවය වටා එක්රොක් වූ අති විශාල ශ්‍රාවක ප්‍රජාව පිනවීම 2017 වසරේ ද සාධනීය ලෙස ඉටුකර ඇත. පැරණි සහ සංගීතමය වශයෙන් වැදගත්කමක් සහිත ඉංග්‍රීසි ගීත පුස්තකාලයක් ගුවන්විදුලි සංස්ථාව සතුවන අතර ඒවා ආශ්‍රයෙන් සැකසුණු වැඩසටහන් රාශියක් 2017 වර්ෂයේ ප්‍රචාරයට යොදා ඇත. සංගීතමය වැඩසටහන්වලට අමතරව විවිධ රටවල ජාතික දින උත්සව, එම රටවල විශේෂ සිදුවීම් ආශ්‍රයෙන් සැකසුණු වැඩසටහන්, ජාත්‍යන්තර වශයෙන් වැදගත් වූ විවිධ දිනයන් සම්බන්ධ වැඩසටහන්, මැයි දිනය, නිදහස් දිනය ආදී විවිධ ජාතික වැදගත්කමක් සහිත වැඩසටහන් පෙර වර්ෂයන්හි මෙන්ම 2017 වර්ෂයේ ද ප්‍රචාරය කර ඇත. ජාතික හා සංස්කෘතික වශයෙන් වැදගත්වන විවිධ උත්සව ආදිය පිළිබඳව සැකසුනු විශේෂ වැඩසටහන් ද 2017 වර්ෂය තුළ ඉදිරිපත් කර ඇත.

- **රජරට සේවය**

රජරට ප්‍රදේශය ආවරණය කරමින් විකාශය වන ප්‍රාදේශීය ගුවන්විදුලි නාලිකාව වන රජරට සේවය 2017 වසර තුළ විශේෂ වැඩසටහන් රාශියක් ප්‍රචාරයට යොදා ඇත. රජරට සේවය යනු ලාංකීය කලා ලෝකයට බොහෝ කලා කරුවන් දායාද කරන ලද ප්‍රාදේශීය ගුවන්දුලි නාලිකාවයි. එම කලාකරුවන් යොදා ගනිමින් විශේෂ වැඩසටහන් රාශියක් 2017 වසරේ රජරට සේවය මඟින් විකාශය කර ඇත.

පූජා නගරයක් වන අනුරාධපුර නගරයේ පවතින විශේෂ ආගමික උත්සව සඳහා මාධ්‍ය අනුග්‍රහය දැක්වීම 2017 වසර පුරා සිදු වූ කටයුත්තකි. ඒ අනුව විශේෂයෙන්ම පොසොන් පොහොය මූලික කරගනිමින් වැඩසටහන් රාශියක් නිෂ්පාදනය කෙරුණු අතර අනෙක් පුර පසළොස්වක පොහොය දිනයන්වල පෝදා වැඩසටහන්, විශේෂ පෙරහැර සම්බන්ධ වැඩසටහන්, වෙසක් කලාප සඳහා මාධ්‍ය අනුග්‍රහය ලබා දීම ආදිය දැක්විය හැක.

පොලිස්පතිවරයා සම්බන්ධ කරගනිමින් "පොලිසියයි ඔබයි" වැඩසටහන ආරම්භ කිරීම 2017 වසරේ සිදු වූ අතර එම වැඩසටහන අඛන්ඩව ප්‍රචාරය වීම සිදු විය.

ප්‍රවෘත්ති හා කාලීන වැදගත්කමින් යුත් තොරතුරු ඇසුරු කරගනිමින් වැඩසටහන් නිෂ්පාදනය කර ප්‍රචාරයට යෙදූ අතර ප්‍රවෘත්ති ප්‍රකාශය අතරතුර හඬ කොටස් විකාශය කිරීම ද 2017 වසරේ ආරම්භ විය.

විශේෂ ජාතික උත්සව මූලික කරගමින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදුවූ අතර නිදහස් දිනය, කම්කරු දිනය, අලුත් අවුරුදු උත්සවය, නත්තල් දිනය ආදිය සඳහා විශේෂ අවධානයක් යොමු කර වැඩසටහන් නිෂ්පාදනය කර ඇත.

විශේෂ පුද්ගලයින්ගේ ගුණානුස්මරණ වැඩසටහන් ද 2017 වසරේ ප්‍රචාරය කර ඇත.

- **වයඹ හඬ**

වයඹ හඬ, වයඹ ප්‍රදේශය ආවරණය කරමින් පවත්වා ගෙන යන ප්‍රාදේශීය ගුවන්විදුලි නාලිකාවයි. ප්‍රාදේශීය වශයෙන් සහ ජාතික වශයෙන් සුවිශේෂ අවස්ථාවන් ජනතාව වෙත දැනුම, රසවින්දනය ඔස්සේ ලබාදීම අරමුණු කරගනිමින් 2017 වර්ෂය තුළ වයඹ සේවය සිය කටයුතු මෙහෙයවා ඇත. ජාතික වශයෙන් වැදගත් වන විශේෂ දිනයන් හා විශේෂ ජාතික උත්සව පිළිබඳව පෙර වර්ෂයන්හි මෙන්ම මෙම වර්ෂයේ ද විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති අතර ඊට අමතරව හෘද රෝග, වකුගඩු රෝග, මත්ද්‍රව්‍ය, කුරුණෑගල ආපදා කම්ටුව, පරිසර සතිය, දුම්වැටි විරෝධී දිනය,

ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැර කිරීම ආදී ඉතා වැදගත් ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි වැඩසටහන් නිෂ්පාදනය කොට ප්‍රචාරය කිරීමට කටයුතු යොදා ඇත. විජය කුමාරණතුංග, අජන්තා රණසිංහ, එච්. ආර්. ජෝතිපාල, විජය නන්දසිරි, එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක, සුනිල් දයානන්ද කෝණාර ආදී සුවිශේෂී පුද්ගලයන් සම්බන්ධව විශේෂ වැඩසටහන් ප්‍රචාරය කර ඇත. මලියදේව විද්‍යාලයේ උසස් පෙළ විශිෂ්ඨයින් සම්බන්ධ වැඩසටහන, පාසල් දරුවන්ට සුභාවිත ගීතය හදුන්වාදීමේ වැඩසටහන, දේශීය නර්ථන කලාව සම්බන්ධ වැඩසටහන ආදී පාසල් දරුවන්ට වැඩදායී වැඩසටහන් රැසක් හා මලියදේව ආදි ශිෂ්‍ය සංගමය සංවිධානය කළ මලිදෙව් මේලා ප්‍රදර්ශනය සඳහා මාධ්‍ය අනුග්‍රහය ලබාදීම ද 2017 වර්ෂයේ දී ඉටු කළ කාර්යයන්ය. ඊට අමතරව වයඹ හඬ 8 වන සංවත්සරය වෙනුවෙන් ආශිර්වාද වැඩසටහන්, සුබ පැතුම් හා ගීත ආදී වැඩසටහන් ඉදිරිපත් කර ඇත.

■ රේඩියෝ දඹාන

රේඩියෝ දඹාන ගුවන්විදුලි නාලිකාව, මුලිකව ශ්‍රී ලංකාවේ ආදිවාසීන් වන වැදි ජනතාව ඉලක්ක කරගනිමින් සහ දඹාන ආශ්‍රිත ප්‍රජාව සඳහා ශ්‍රී ලංකාවේ තුළ ක්‍රියාත්මකවන වෙළෙඳ අභිප්‍රායෙන් මිදුණු එකම ගුවන්විදුලි නාලිකාව වේ. 2017 වර්ෂයේ දී ද ආදිවාසීන්ගේ අනන්‍යතාවය, ඇදහිලි හා විශ්වාස, කලා කෘති ආදිය සංරක්ෂණය කරමින් ඔවුන්ගේ ජන ජීවිතයට වැදගත්වන ක්ෂේත්‍රයන් ආවරණය කිරීම රේඩියෝ දඹාන ඉටු කර ඇත. විශේෂයෙන් ම 2017 වසරේ සංස්ථා ප්‍රකාශන අංශය හා එක්ව 'වනයෙන් ඇසෙන ගී' නමින් සංයුක්ත තැටියක් නිෂ්පාදනය කර ඇත. ලෝක ආදිවාසී දිනය වෙනුවෙන් පැවති උත්සවය සංවිධානය කිරීම හා මාධ්‍ය ආවරණ කටයුතු ඉටු කිරීම, ශ්‍රවණ කලාපයේ දරුවන් සඳහා සන්නිවේදන පුහුණුව ලබාදීම, රේඩියෝ දඹාන 9 වන සංවත්සර උත්සවය පැවැත්වීම, මහියංගන රාජ හා විහාරයේ ශ්‍රී සුමන සමන් දේවාල වාර්ෂික පෙරහැර නිල මාධ්‍ය ආවරණය 2017 වසරේ ඉටු කළ විශේෂ කටයුතු ලෙස හඳුන්වා දිය හැක.

■ ප්‍රවෘත්ති හා කාලීන වැඩසටහන් අංශය

ප්‍රවෘත්ති අංශයේ ප්‍රමුඛතම කාර්යය හා අරමුණ වනුයේ වඩාත් නිරවද්‍ය වූ ප්‍රවෘත්ති හා තොරතුරු වගකීමෙන් හා විශ්වාසයෙන් ජනතාව වෙත ලබාදීමයි. 2017 වසර තුළ ඒ වෙනුවෙන් දිනපතා ප්‍රවෘත්ති ප්‍රකාශ 04 ක් භාෂාත්‍රයෙන් ම ඉදිරිපත් කිරීම සිදුවිය. ප්‍රවෘත්තිවල විශ්වසනීයත්වය තීව්‍ර කිරීමේ අරමුණින් හඬ කොටස් එක් කිරීම කරන ලදී. මීට අමතරව පැයේ පුවත්, දිනපොත, ළමා ප්‍රවෘත්ති, බෞද්ධ ප්‍රවෘත්ති සංස්කරණය ද ප්‍රවෘත්ති අංශය ඉටු කරන ලද කටයුත්තකි.

සමාජයේ පවතින කාලීන සංවේදීතම සිද්ධීන්ට අදාළව දිනපතා සුභාරතී වැඩසටහන, රජයේ සංවර්ධන කටයුතු ජනතාව අතරට ගෙනයාමේ අරමුණින් ක්‍රියාත්මක ඇතුල් පැත්ත වැඩසටහන, අර්බුධ ගැටුම් මතවාද තුළින් නිවැරදි මගට යන තේමාව යටතේ "සතෙය්ක්ෂණය" වැඩසටහන, කාලීන අංශය මගින් නිෂ්පාදනය කරන ලද විශේෂ වැඩසටහන් වශයෙන් හදුන්වා දිය හැකිය.

2015 වසරේ සිට පාර්ලිමේන්තු සැසිවාර සජීවීව විකාශය කිරීම ආරම්භ වූ අතර 2017 වසරේ ද එය කටයුත්ත අඛන්ඩව සිදුවිය.

■ සංවර්ධන ඒකකය

අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා 2017.01.01 දින සිට 2017.12.31 දින දක්වා සහභාගී වූ විවිධ උත්සව සඳහා මාධ්‍ය ආවරණය ලබාදීමේ කටයුතු සංවර්ධන ඒකකය මගින් 2017 වසරේ ද සිදුකර ඇත. එම උත්සව අවස්ථාවල ජනාධිපතිතුමා විසින් පවත්වන ලද කතා සංරක්ෂණය කිරීම ද සංවර්ධන ඒකකයේ කාර්යයකි. මෙම උත්සව සම්බන්ධ පූර්ව ප්‍රචාරක කටයුතු ද සංවර්ධන ඒකකය මගින් සිදුකර ඇත. 2017 වසරේ ගරු ජනාධිපතිතුමන් සහභාගී වූ ඉන්දියානු සාගර කලාපීය රටවල රාජ්‍ය නායක සමුළුව, ඕස්ට්‍රේලියානු සංචාරය, එක්සත් ජාතීන්ගේ 72 වන මහා සම්මේලනය ආදියෙහි තත්ත්ව වාර්තා ලබාදීම හා ජනාධිපතිතුමාගේ කතා ප්‍රචාරය කිරීම 2017 වසරේ ඉටු කළ කටයුතු වේ.

■ සංගීත අංශය

2017 වර්ෂයේ දී ගුවන්විදුලි සංස්ථා සංගීත අංශය සංස්ථාවේ සෑම නාලිකාවක් ඔස්සේ ම ගුණාත්මක සංගීත වැඩසටහන් ඉදිරිපත් කිරීමට උපරිම දායකත්වය සපයා ඇති අතර ශාස්ත්‍රීය වැඩසටහන්, සරළ ශාස්ත්‍රීය වැඩසටහන්, නිර්මාණාත්මක වැඩසටහන් විචාරාත්මක වැඩසටහන් විශාල ප්‍රමාණයක් ඉදිරිපත් කර ඇත. ගුවන්විදුලි වාද්‍ය වෘන්දය ඉදිරිපත් කළ 'මියුරු සර' වැඩසටහන, සංගීත අධ්‍යාපනික වැඩසටහන් වශයෙන් පෙර වර්ෂයන්හි සිට නිෂ්පාදනය කෙරෙන 'ජන ගී, නූර්ති ගී, නාඩගම් ගී, විරිඳු බයිලා' වැඩසටහන් ද උතුරු ඉන්දියානු ශාස්ත්‍රීය සංගීතය ඇසුරින් නිෂ්පාදනය කළ 'සරස රාවය' වැඩසටහන ද ජන ගී හා ජන ගී ආශ්‍රිතව නිෂ්පාදනය කළ 'හෙළ ගී සිත්තම්' වැඩසටහන ද වියෝ වූ විශිෂ්ඨ සංගීතඥයින්ගේ අනුස්මරණ දින අළලා 'ආවර්ජනා' වැඩසටහන ද පුර පසලොස්වක පොහෝ දිනයන්හි 'ශ්‍රද්ධාංජලී' නමින් බෞද්ධ ගීත විචාරාත්මක වැඩසටහන ද 'ධම්ම පද ගී' වැඩසටහන ද 2017 වසරේ සංගීත අංශය මගින් ඉදිරිපත් කර ඇත. ඊට අමතරව 'සේවක සංග්‍රහය' 'විශ්වයේ වින්දනීය ප්‍රතිරාව' 'සරළ ගී' 'පුංචි පුංචි තරු වගේ' 'නිදහස් අනුස්මරණ කවි' 'සංගීතානන්දය' 'අහසින් වහා' 'ගීයක අසිරිය'ආදී වැඩසටහන් ද ගුවන්විදුලි සංස්ථා සංගීත අංශයේ නිර්මාණ වන අතර පෙර වසරවල මෙන්ම 2017 වසරේ ද එවා ප්‍රචාරයට යොදා ඇත.

■ ප්‍රකාශන අංශය

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ ප්‍රකාශන සම්බන්ධයෙන් ක්‍රියාත්මක ප්‍රකාශන අංශය සංයුක්ත තැටි සඟරා ආදිය නිෂ්පාදනයකොට ආදායම් උපයනු ලබයි. 2017 වසරේ ද විශේෂ අලෙවි ආදායම් ලබා ඇති ප්‍රකාශයන අංශය, "සිනිදු සුදු මුදු තලාවේ" "වලාකුළින් බැස" " සීතල පිණිමත" "උතුරු සළු ඇඳ" "ජීවිතේ අමදාරා" "ඇසුරු සැනින්" "ලිහිණියේ" ආදී නව සංයුක්ත තැටි නිෂ්පාදනය කර ඇත. විශේෂ උත්සව වල දී සංයුක්ත තැටි අලෙවිකොට ආදායම් ඉපයීම 2017 වසරේ ද සිදුකර ඇත. ඊට අමතරව ගුවන්විදුලි සංස්ථා පරිශ්‍රයේ ඇති අලෙවි කුටියෙන් හා දිවයින පුරා විසිරී සිටින අලෙවි නියෝජිතයින් මගින් සංයුක්ත තැටි අලෙවි කිරීම සිදුකර ඇත. ප්‍රකාශන අංශය මගින් "හිමව් අරණ" නමින් ගීත සමීක්ෂණ මණ්ඩලයක් මගින් තෝරාදෙන නව ගී නිර්මාණ ඉදිරිපත් කරන වැඩසටහනක් වෙළෙඳ සේවය ඔස්සේ ද ප්‍රවීණ ගීත රචකයකු සමඟ ඔහුගේ ගීත පිළිබඳ රසවින්දනාත්මක වැඩටසහනක් ලෙස "පන්හිඳ" වැඩසටහන ස්වදේශීය සේවය ඔස්සේ ද නිෂ්පාදනය කර ප්‍රචාරයට යොදා ඇත.

■ ශ්‍රවණ පර්යේෂණ අංශය

2017 වර්ෂය තුළ ශ්‍රවණ පර්යේෂණ අංශය මඟින් පැවැත් වූ සමීක්ෂණ පහතින් දක්වා ඇත.

1. ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ දේශීය සේවාවන්හි වැඩසටහන් පිළිබඳ ශ්‍රාවක තෘප්තිමත් භාවය හඳුනා ගැනීම සඳහා වූ සමීක්ෂණය.
2. ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ දේශීය සේවාවන්වල ශ්‍රවණ තත්ත්වය පිළිබඳ ශ්‍රාවක ප්‍රතිචාර.
3. ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ දේශීය සේවාවන්වල වැඩසටහන් පිළිබඳ ශ්‍රාවක ප්‍රතිචාර.

ගුවන්විදුලි වැඩසටහන් හි ගුණාත්මක හා ප්‍රමාණාත්මක ඇගයීම, දෛනිකවැදගත් තොරතුරු සැපයීම, ගුවන්විදුලි ස්වර්ණ ජයන්තිය සඳහා වූ ශාස්ත්‍රීය ග්‍රන්ථය සඳහා තොරතුරු සැපයීම, ගුවන්විදුලි කෞතුකාගාරයට අවශ්‍ය තොරතුරු හා ඡායාරූප රැස් කිරීම, ගුවන්විදුලි සංස්ථාව පිළිබඳ අත්පත්‍රිකාව සැකසීම ශ්‍රවණ පර්යේෂණ අංශය මඟින් 2017 වර්ෂයේ දී සිදු කළ කාර්යයන් වේ.

■ මධ්‍යම ක්‍රියාකාරී අංශය

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ මැදිරි මෙහෙයුම් කටයුතු සහ පටිගත කිරීම් කටයුතු සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන අංශය වන්නේ මධ්‍යම ක්‍රියාකාරී අංශයයි. සංස්ථාව සතු සම්බන්ධතා මැදිරි, සංරක්ෂණ මැදිරි සහ පටිගත කිරීමේ මැදිරි සඳහා ක්‍රියාකාරී සහයකවරුන් යෙදවීම සහ අනෙකුත් පහසුකම් සැලසීම මධ්‍යම ක්‍රියාකාරී අංශයේ කාර්ය භාරය වේ. 2017 වර්ෂයේ ද වැඩසටහන්වල ස්වභාවය අනුව ඊට ගැළපෙන ක්‍රියාකාරී සහායකවරුන් ලබාදීම මඟින් සංස්ථාවේ වැඩසටහන්වල ගුණාත්මක භාවය පවත්වා ගැනීම සඳහා මහඟු දායකත්වයක් මධ්‍යම ක්‍රියාකාරී අංශය විසින් දක්වා ඇත. ශ්‍රාවකයන්ට හාධා ඇති නොවන පරිදි විශ්වසනීය ගුවන්විදුලි විකාශයක් පවත්වා ගැනීම ක්‍රියාකාරී සහායකයන් සතු ප්‍රධානතම වගකීම වන අතර මෙම වර්ෂය තුළ එම කාර්යය කිසිදු හාධාවකින් තොරව ඉටු කර ඇත.

ස්ථිරියෝ තාක්ෂණය අනුව උපරිම පහසුකම් සහිතව ගීත මෙන්ම වැඩසටහන් ද පටිගත කිරීම සඳහා මධ්‍යම ක්‍රියාකාරී අංශය දායක වී ඇති අතර බාහිර පුද්ගලයින් සඳහා සහ බාහිර ආයතන සඳහා ගෙවීමේ පදනම මත ආනන්ද සමරකෝන් මැදිරිය සහ අංක 5 සහ අංක 6 මැදිරි ලබාදීම සඳහා මධ්‍යම ක්‍රියාකාරී අංශයේ නොමසුරු දායකත්වය 2017 වර්ෂයේ දී ද ලබා දී ඇත.

■ අභ්‍යාස ආයතනය

2016 වර්ෂය තුළ අභ්‍යාස ආයතනය විසින් ඉටු කර ඇති කාර්යයන් පහත පරිදි වේ.

- බාහිර අභ්‍යාසලාභීන් 20 දෙනෙකු සඳහා ගුවන්විදුලි නිෂ්පාදන හා සන්නිවේදන සහතික පත්‍ර පාඨමාලාව
- යුද හමුදා සාමාජිකයන් 25 දෙනෙකු සඳහා නිෂ්පාදන හා සන්නිවේදන සහතික පත්‍ර පාඨමාලාව

ඊට අමතරව මැදිරිගිරිය මධ්‍ය මහා විද්‍යාලයීය මාධ්‍ය අංශයේ සිසුන් 25 දෙනෙකු සඳහා මාධ්‍ය පුහුණුව, ප්‍රාදේශීය අලෙවි විධායක නිලධාරීන් 10 දෙනකුගේ පුහුණුව, සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය, සබරගමුව විශ්ව විද්‍යාලය හා ශ්‍රී පාලි විශ්ව විද්‍යාලයේ සිසුන් සඳහා පුහුණු අවශ්‍යතා සපුරාදීම, ගුවන්විදුලි සංස්ථා සහන නිවේදක පුහුණුව, ගුවන්විදුලි සංස්ථා කාර්මික නිලධාරී පුහුණුව, දෙමළ නිවේදකයන් සඳහා භාෂා භාවිතය සම්බන්ධ පුහුණුව අභ්‍යාස ආයතනය මඟින් ඉටු කළ වෙනත් සේවාවන් වේ.

■ ඉංජිනේරු අංශය

2016 වර්ෂය තුළ ගුවන්විදුලි සංස්ථා ඉංජිනේරු අංශය මගින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති පහත ආකාරයෙන් වේ.

1. හපුතලේ එෆ්. එම් විකාශනාගාරය යාවත්කාලීන කිරීමේ ව්‍යාපෘතියේ දෙවන අදියර ක්‍රියාත්මක කිරීම - ව්‍යාපෘතියේ වටිනාකම රුපියල් මිලියන 91.75 කි. ඒ යටතේ සිදු කරනු ලැබූ ක්‍රියාකාරකම්.

- ඇන්ටනා පද්ධතිය මිලදී ගෙන ස්ථාපනය කිරීම.
- 250kVA ජනක යන්ත්‍රයක් මිල දී ගෙන ස්ථාපනය කිරීම.

2. සම්බන්ධතා මැදිරි (C1 - C12 දක්වා) යාවත්කාලීන කිරීමේ ව්‍යාපෘතියේ දෙවන අදියර - ව්‍යාපෘතියේ වටිනාකම රුපියල් මිලියන 40කි. සම්බන්ධතා මැදිරි යාවත්කාලීන කිරීමේ ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ C1 - C6 මැදිරි යාවත්කාලීන කිරීම සිදුකර ඇත.
3. තොරතුරු තාක්ෂණික පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ පළමු අදියර ක්‍රියාත්මක කිරීම. ව්‍යාපෘතියේ වටිනාකම රුපියල් මිලියන 70 කි.
4. කඳුරට සේවය යාවත්කාලීන කිරීමේ ව්‍යාපෘතිය - ව්‍යාපෘතියේ වටිනාකම රුපියල් මිලියන 10 කි.

■ අලෙවි අංශය

ගුවන් කාල විකිණුම් ආදායම් වර්ධන උපනතියක් 2017 වර්ෂය තුළ පෙන්නුම් කර ඇත. ICC ක්‍රිකට් තරගාවලිය ඇතුළු ක්‍රිකට් තරගාවලි රැසක ගුවන් විදුලි විස්තර ප්‍රචාරය සිදු කර ඇති අතර, ඒ මගින් ආදායම් ප්‍රවර්ධනය සිදුවී ඇත. සිංහල හින්දු අලුත් අවුරුදු සමය තුළ රටවටා අවුරුදු ඇතුලු නැකැත් දැනුම්දීමේ ප්‍රචාරක කටයුතු සඳහා සේවාදායක අනුග්‍රය ලබාගැනීම සිදුවිය. වෙසක් කලාප, මහනුවර දළඳා පෙරහැර, සබරගමු සමන් දේවාල පෙරහැර ආදිය මගින් 2017 වසරේ ආදායම් උපයා ගැනීම සිදුවිය. 2017 වසරේ සංවිධානය කළ 'කණ්ඩායම් ගී ප්‍රසංගය' නව ප්‍රසාංගික අත්දැකීමක් මෙන්ම ආදායම් උත්පාදනයට ද දායක විය.

ගිණුම් ප්‍රකාශන - 2017

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

(සියලුම මුදල් ප්‍රමාණයන් ශ්‍රී ලංකා රුපියල්වලින්)

	සටහන	2017 දෙසැම්බර් 31	2016 දෙසැම්බර් 31
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත හා උපකරණ	**9**	2,293,423,537	2,229,394,908
විලම්බිත බදු වත්කම්	**8**	6,536,768	1,277,887
සිදුකරමින් පවතින ප්‍රාග්ධන වැඩ	**9**	1,251,063	
විකිණීම සඳහා ඇති	**10**	54,762,028	187,241,019
	11	1,000,000	1,000,000
ජංගම වත්කම්		**2,356,973,395**	**2,418,913,814**
තොග			
වෙළෙඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ	**17**	27,677,332	25,907,733
මාර්ගස්ථ භාණ්ඩ	**12**	251,158,960	241,475,741
මුදල් සහ මුදල් සමාන දෑ	**Sh 18**	93,202,706	30,512,997
	13	351,718,918	320,286,094
මුළු වත්කම්		**723,757,917**	**618,182,565**
		3,080,731,312	**3,037,096,379**
ස්කන්ධය සහ බැරකම්			
ප්‍රාග්ධනය සහ සංචිත			
ප්‍රකාශිත ප්‍රාග්ධනය		307,386,085	307,386,085
ප්‍රත්‍යාගණන සංචිත		19,997,092	
රඳවා ගත් ඉපැයුම්		14,421,999	14,421,999
ජංගම නොවන බැරකම්	**14**	(36,060,404)	(108,694,335)
නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්		**305,744,772**	**213,113,749**
විලම්බිත ආදායම් (ජපාන ප්‍රදානය)			
රජයේ ප්‍රදාන	**Sh 19**	224,904,536	241,582,628
ට්‍රින්කෝ ප්‍රදාන		70,849,537	75,218,347
විලම්බිත බදු බැරකම්		863,445,527	722,868,845
කල්බදු ගිණුම (රථ වාහන)		1,128,190,137	1,283,596,811
	8	79,401,520	70,970,003
ජංගම බැරකම්		**2,366,791,257**	**2,394,236,634**
වෙළෙඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ			
මූල්‍යම නොවන බැරකම්	**15**	266,335,226	257,847,404
	16	141,860,056	171,898,592
මුළු බැරකම්		**408,195,282**	**429,745,996**
මුළු ස්කන්ධය සහ බැරකම්		**3,080,731,312**	**3,037,096,379**

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති, 1971 අංක 38 දරන මූල්‍ය පනත සහ 1966 අංක 37 දරන ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථා පනත සමඟ අනුකූල වන පරිදි මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇති බව මුදල් අධ්‍යක්ෂ සහතික කරයි.

.....
අධ්‍යක්ෂ මුදල්

දිනය : 2016.00.00

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ. මෙම මූල්‍ය ප්‍රකාශ 2017 අප්‍රේල් මස 00 වෙනි දින අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන ලදී.

.....
සභාපති
දිනය : 2016.00.00

.....
අධ්‍යක්ෂ මණ්ඩලය
දිනය : 2016.00.00

පිටු අංක 05 සිට 25 දක්වා ඇති වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අනුකලන කොටසක් සම්පාදනය කරයි.

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

(සියලුම මුදල් ප්‍රමාණයන් ශ්‍රී ලංකා රුපියල්වලින්)

	සටහන	2017 දෙසැම්බර් 31	2016 දෙසැම්බර් 31
විකුණුම්	1	694,202,792	663,142,415
විකුණුම් පිරිවැය	2	619,161,702	621,764,705
දළ ලාභය		**75,041,090**	**41,377,710**
අනෙකුත් මෙහෙයුම් ආදායම්	3	325,836,839	292,596,221
බෙදාහැරීමේ පිරිවැය	4	5,361,316	5,743,906
අනෙකුත් මෙහෙයුම් වියදම්	5	336,245,865	321,745,130
පරිපාලන වියදම්	6	329,451,940	317,162,912
මෙහෙයුම් ලාභය		**(270,181,192)**	**(310,678,018)**
මූල්‍ය පිරිවැය	7	5,952,777	5,555,448
රජයේ ප්‍රධානයන්ට පෙර ලාභය / (අලාභය)		**(276,133,969)**	**(316,233,466)**
රජයේ ප්‍රධානය	3.1	350,690,000	365,000,000
රජයේ ප්‍රධානයන්ට පසු ලාභය / (අලාභය)		**74,556,031**	**48,766,534**
බදු වියදම්	8	(3,172,636)	6,450,961
බදුවලින් පසු ලාභය		**71,383,395**	**55,217,495**
මුළු විස්තීර්ණ ආදායම		**71,383,395**	**55,217,495**

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

(සියලුම මුදල් ප්‍රමාණයන් ශ්‍රී ලංකා රුපියල්වලින්)

	සටහන	ප්‍රකාශිත ප්‍රාග්ධනය	ප්‍රාග්ධන සංචිතය	ප්‍රත්‍යාගණන සංචිතය	-	රඳවා ගත් ඉපැයුම්	එකතුව
2016 ජනවාරි 01 වෙනි දිනට ශේෂය		307,386,085		14,421,999		-	321,808,084
විස්තීර්ණ ආදායම							
වසර සඳහා විස්තීර්ණ ආදායම						55,217,495	55,217,495
ආදායම් සංචිත ගැලපීම - 2016						(163,911,830)	(163,911,830)
2016 දෙසැම්බර් 31 වෙනි දිනට ශේෂය		**307,386,085**	**-**	**14,421,999**		**(108,694,335)**	**213,113,749**
විස්තීර්ණ ආදායම			19,997,092				19,997,092
ආදායම් සංචිත ගැලපීම						71,383,395	71,383,395
කාලසීමාව සඳහා විස්තීර්ණ ආදායම						(107,443,799)	
2017 දෙසැම්බර් 31 වෙනි දිනට ශේෂය		**307,386,085**	**19,997,092**	**14,421,999**		**(36,060,404)**	**305,744,772**

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව
ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය

(සියලුම මුදල් ප්‍රමාණයන් ශ්‍රී ලංකා රුපියල්වලින්)

විස්තරය	2017		2016	
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය				
පොළී සහ බදුවලට පෙර ශුද්ධ ලාභය		74,556,031		50,960,289
ගැලපීම්				
රජයේ ප්‍රදානය ක්‍රමක්ෂය	(77,916,361)		(67,476,968)	
ප්‍රදානය ක්‍රමක්ෂය ත්‍රීකුණාමලය	(155,406,674)		(155,406,674)	
ක්ෂයවීම	62,529,891		45,687,595	
ක්ෂයවීම ත්‍රීකුණාමලය	159,297,421		158,236,740	
පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදනය	25,814,868		21,300,257	
බොල් ණය සඳහා ප්‍රතිපාදනය	5,361,316		5,743,906	
විනිමය මත ලාභ/(අලාභ)	129,895		265,004	
කල්බදු පොලිය			176,345	
අ.සේ.ගාස්තු	3,398,792	23,209,146	916,796	9,443,001
		97,765,177		60,403,290
ආදායම් සංචිතය ගැලපීම		(362,500)		867,406
කාරක ප්‍රාග්ධනයට පෙර මෙහෙයුම් ලාභය				
තොග භාණ්ඩ අඩුවීම / වැඩිවීම	(1,769,599)		1,121,071	
වෙළෙඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ අඩුවීම / වැඩිවීම	(12,217,155)		(41,105,579)	
මාර්ගස්ථ භාණ්ඩ අඩුවීම / වැඩිවීම	(62,689,709)		(25,660,928)	
වෙළෙඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ අඩුවීම / වැඩිවීම	8,487,821		22,362,706	
මූල්‍ය නොවන බැරකම් අඩුවීම / වැඩිවීම	(30,038,536)	(98,227,178)	30,409,515	(12,873,215)
ගෙවන ලද පාරිතෝෂිකය		(42,492,960)		(19,039,367)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල්		(43,317,461)		29,358,114
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ				
රජයේ ප්‍රදානය (ප්‍රාග්ධනය - 2017)	185,612,000		165,629,400	
රජයේ ප්‍රදානය (ප්‍රාග්ධනය - 2016)	28,696,671			
දේපල, පිරියත හා උපකරණ මිල දී ගැනීම	(86,952,149)		(67,720,498)	
සිදුකරමින් පවතින ප්‍රාග්ධන වැඩ	(52,606,237)		(53,946,740)	34,962,162
ආයෝජන ක්‍රියාකාරකම්වල දී භාවිතා කළ ශුද්ධ මුදල්		74,750,285		
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ				
කල්බදු කුලී ගෙවීම			(4,885,634)	
මූල්‍ය ක්‍රියාකාරකම්වල දී භාවිතා කළ ශුද්ධ මුදල්		-		(4,885,634)
මුදල් සහ මුදලට සමාන දෑ ශුද්ධ අඩුවීම / වැඩිවීම		31,432,824		59,434,642
කාලසීමාව ආරම්භයේ මුදල් හා මුදලට සමාන දෑ		320,286,094		260,851,452
කාලසීමාව අවසානයේ මුදල් හා මුදලට සමාන දෑ		**351,718,918**		**320,286,094**
(සටහන 13)				

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

1. සාමාන්‍ය තොරතුරු

1.1 වාර්තාකරණ අස්තිත්වය

1966 අංක 37 දරන ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථා පනත යටතේ නිසි පරිදි සංස්ථාගතකොට ස්ථාපනයකොට ඇති ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ ලියාපදිංචි කාර්යාලය කොළඹ 07 නිදහස් චතුරශ්‍රයේ ඇති අතර එහි ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය කොළඹ 07 නිදහස් චතුරශ්‍රයේ පිහිටා ඇත.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

වසර තුළදී සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ ගුවන් කාලය විකිණීමයි.

1.3 නිකුත් කිරීම සඳහා බලය පැවරූ දිනය

2017 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශ 2018 මාර්තු 31 වන දින අනුමතිය සඳහා ඉදිරිපත් කරන ලදී.

1.4 සේවක සංඛ්‍යාව

වසර අවසානයේ දී ස්ථීර සේවක සංඛ්‍යාව 803 කි.
වසර අවසානයේ දී කොන්ත්‍රාත් සේවක සංඛ්‍යාව 85 කි.
(2016.12.31-921)

2. පිළියෙල කිරීමේ පදනම හ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති යොදා ගැනීම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ල.ගි.ප්‍ර.) සහ 1995 අංක 19 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති පනත ප්‍රකාරව සංස්ථාව සිය මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇත.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති නව වෙළුමක් නිකුත් කර ඇති අතර 2012 ජනවාරි 01 සිට හෝ ඉන් පසුව ආරම්භ වන වසර සඳහා බලාත්මක වන පරිදි ව්‍යවසායන් මෙම ප්‍රමිති ආදේශ කිරීම අවශ්‍ය කරනු ලබයි.

3.1 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී යොදාගත් මූලික ගිණුම්කරණ ප්‍රත්පත්ති පහත විස්තර කොට ඇත. අන්‍යාකාරයෙන් සඳහන් කර ඇත්තේ නම් මිස මෙම ප්‍රතිපත්ති ඉදිරිපත් කර ඇති සියලු වසර සඳහා මෙම ප්‍රතිපත්ති සංගතව ආදේශ කර ඇත.

පිටු 05 සිට 23 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අනුකලන කොටසක් සම්පාදනය කරයි.

3.1.1 පිළියෙල කිරීමේ පදනම

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇත්තේ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලවය. මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සහ පසුව පැහැදිළිකොට ඇති අනෙකුත් නිශ්චිත මැනුම් යටතේ පිළියෙල කර ඇත.

මූල්‍ය ප්‍රකාශ කෙරෙහි බලපාන උද්ධමනීය සාධක සඳහා ගැලපීම් සිදු කර නොමැත.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පිණිස තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු භාවිතා කිරීම අවශ්‍ය වේ. එසේම සංස්ථාවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති ආදේශ කිරීමේ ක්‍රියාදාමයේදී කළමනාකාරිත්වය සිය විනිශ්චය ක්‍රියාවට නැංවීම අවශ්‍ය වේ. මූල්‍ය ප්‍රකාශන කෙරෙහි උපකල්පන සහ ඇස්තමේන්තු වැදගත් වන ක්ෂේත්‍ර සටහන් 4 හි හෙළිදරව්කොට ඇත. ඊට වත්කම් සහ බැරකම් වාර්තාකොට ඇති ප්‍රමාණ සහ මූල්‍ය වාර්තාකරණ දිනයට අසම්භාව්‍ය වත්කම් සහ බැරකම් හෙළිදරව් කිරීම සහ වාර්තාකරණ කාල සීමාව තුළ ආදායම සහ වියදම් ප්‍රමාණ පිළිබඳ වාර්තාව අයත් වේ. වත්මන් සිදුවීම් සහ ක්‍රියාමාර්ග පිළිබඳ කළමනාකාරිත්වයේ උපරිම දැනුම මත මෙම ඇස්තමේන්තු පාදක වුවත් අවසානයේ දී තථ්‍ය ප්‍රතිඵල මෙම ඇස්තමේන්තු වලට වඩා වෙනස් විස හැක.

3.1.2 අඛණ්ඩ පැවැත්ම

ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පැවතීමට සමාගමට ඇති හැකියාව පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය ඇගයීමක් සිදුකර ඇති අතර ඈවර කිරීමට හෝ වෙළඳ කටයුතු නැවැත්වීමට ඔවුන් අදහස් නොකරයි.

3.1.3 පශ්චාත් ශේෂ පත්‍ර සිදුවීම්

ශේෂ පත්‍ර දිනයට පසුව සිදුවූ සියළු ද්‍රව්‍යමය සිදුවීම් සලකා බලා අවශ්‍ය තැන් හි දී මූල්‍ය ප්‍රකාශනයන් හි ගැලපීම් සිදුකොට හෝ හෙළිදරව් කිරීම් සිදුකර ඇත.

3.1.4 සංසන්දනාත්මක තොරතුරු

සංස්ථාව විසින් සංගතව යොදාගෙන ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති අන්‍යාකාරයෙන් සඳහන් කර ඇත්තේ නම් මින් පෙර වසරේ ප්‍රතිපත්ති සමග සංගත වේ. ප්‍රවර්තන වසරේ ඉදිරිපත් කිරීම හා අනුකූල වන පරිදි අවශ්‍ය තැන් හි දී පෙර වසරේ සංඛ්‍යා නැවත සකස් කර ඇත.

3.1.5 විදේශ ව්‍යවහාර මුදල්

(අ) කෘත්‍යාත්මක සහ ඉදිරිපත්කිරීමේ ව්‍යවහාර මුදල් ඒකකය

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුලත් කර ඇති අයිතම මණිනු ලබන්නේ අස්තිත්වය ක්‍රියාත්මක වන ප්‍රාථමික ආර්ථික පරිසරයේ මුදල් ඒකකය යොදා ගනිමිනි (කෘත්‍යාත්මක මුදල් ඒකකය). මෙම මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරනු ලැබ ඇත්තේ සංස්ථාවේ කෘත්‍යාත්මක සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලිනි.

(ආ) විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු සහ ශේෂය

විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු, ගනුදෙනුව සිදුකළ දිනයන් හි දී පැවති විනිමය අනුපාතය හෝ අයිතම මනිනු අවස්ථාවන් හි දී වටිනාකම යොදාගනිමින් කෘත්‍යාත්මක මුදල් ඒකකයට පරිවර්තනය කරනු ලැබේ. එබඳු ගනුදෙනු බේරුම් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සහ විදේශ මුදලින් අභිධාන කර ඇති මූල්‍ය වත්කම් සහ බැරකම් වසර අවසාන විනිමය අනුපාතයන්ට පරිවර්තනය කිරීමේ දී ඇතිවන විදේශ විනිමය ලාභ හෝ අලාභ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

පිටු 05 සිට 23 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අනුකලන කොටසක් සම්පාදනය කරයි.

3.2 අනෙකුත් වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

3.2.1 වත්කම් සහ ඒවායේ මැනීමේ පදනම

ශේෂ පත්‍රයේ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය ඇති වත්කම් වනුයේ මුදල් සහ සංස්ථාවේ ව්‍යාපාරික කටයුතුවල සමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුල හෝ ශේෂ පත්‍ර දිනයේ සිට වසරක් තුල යන දෙකින් වඩා කෙටි කාලසීමාව තුල මුදලින් උපලබ්ධිවීමට අපේක්ෂිත දෑ වේ. ජංගම වත්කම් හැර අනෙකුත් වත්කම් වනුයේ ශේෂ පත්‍ර දිනයේ සිට එක් වසරක කාල සීමාවක් ඉක්මවා රඳවා ගැනීමට සංස්ථාව අදහස් කරන වත්කම් වේ.

3.2.1.1 දේපල, පිරියත හා උපකරණ

ඉඩම් සහ ගොඩනැගිලි සමන්විත වනුයේ මූලිකවම ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය සහ සම්ප්‍රේෂණ මධ්‍යස්ථානවලිනි. සියලූ දේපල, පිරියත හා උපකරණ චේතිහාසික පිරිවැයට ප්‍රකාශ කරනු ලැබ ඇත. දේපල පිරියත හා උපරකණවල පිරිවැය යනු අත්කර ගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැය සමගින් අපේක්ෂිත පරමාර්ථය සඳහා අදාළ වත්කම වැඩ කරන තත්වයට ගෙන ඒම සඳහා දැරීමට සිදුවන ආනුෂංගික වියදම් ද වේ. වත්කම්වල ඉපැයුම් ධාරිතාවය දිගමට පවත්වා ගනු හෝ ඉහළ නැංවීම පිණිස ස්ථීර ස්වභාවයේ වත්කම් අත්කර ගැනීම, ව්‍යාප්ත කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා දරන ලද ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ. අනෙකුත් තදනන්තර පිරිවැය වත්කමේ ධාරණ අගයට ඇතුලත් කරනු ලබන්නේ හෝ වෙනම වත්කමක් ලෙස පිළිගනු ලබන්නේ එම අයිතමය තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලා ඒමට හැකියාවක් ඇත්නම් සහ අයිතමයේ පිරිවැය විශ්වාසනීය ලෙස මැණිය හැකි නම් පමණි.

3.2.1.2 ප්‍රතිසංස්කරණ පිරිවැය

ආරම්භයේදි තක්සේරු කරනු ලැබූ කාර්යසාධන ප්‍රමිතියෙන් අපේක්ෂා කළ අනාගත ආර්ථික ප්‍රතිලාභ යථා තත්ත්වයට පැමිණවීම හෝ පවත්වාගෙන යාම පිණිස දේපල, පිරියත සහ උපකරණ අළුත්වැඩියා කිරීමට හෝ නඩත්තු කිරීමට දරන ලද වියදම, වලෙස වියදම දැරූ අවස්ථාවේ වියදමක් ලෙස පිළිගනු ලැබේ.

3.2.1.3 ක්ෂයවීම

ඉඩම් ක්ෂය කරනු නොලැබේ. ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදනය ගණනය කර ඇත්තේ සියලු දේපල, පිරියත සහ උපකරණවල පිරිවැය හෝ තක්සේරුව මත සරල රේඛීය පදනම යොදා

ගනිමිනි. මේ සඳහා යොදා ගත් ප්‍රධාන වාර්ෂික අනුපාත වනුයේ,

ගොඩනැගිලි	2.5%
පිරියත හා යන්ත්‍රසූත්‍ර	7.5%
ශ්‍රව්‍ය සංඛ්‍යාන උපකරණ	7.5%
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් සහ උපකරණ	10%
සම්ප්‍රේෂක	7.5%
රථ වාහන	25%
සංගීත භාණ්ඩ	10%
පරිගණක උපකරණ	50%
පටිගත කිරීමේ පටි	33.33%
සුළු උපකරණ	50%

සෑම වාර්තාකරණ කාල සීමාවක් අවසානයේ දී ම, උචිත නම් වත්කමේ අවශිෂ්ඨ වටිනාකම් ප්‍රයෝජ්‍ය ආයු කාල සහ ක්ෂය කිරීමේ ක්‍රමවේදය සමාලෝචනයකොට ගලපනු ලැබේ.

වත්කමක ධාරණ මුදල එහි ඇස්තමේන්තු ගත අය කර ගත හැකි මුදලට වඩා වැඩි වන්නේ නම්, එය වහාම එහි අයකරගත හැකි මුදලට පොත් කරනු ලැබේ.

දේපල, පිරියත හා උපකරණ බැහැර කිරීම මත ලාභය හෝ අලාභය නිශ්චය කරනු ලබන්නේ ඒවායේ ධාරණ වටිනාකමට සාපේක්ෂව වන අතර මෙහෙයුම් ලාභය නිශ්චය කිරීමේ දී සැලකිල්ලට ගනු ලැබේ. ප්‍රත්‍යාගණනය කරන ලද විකුණනු ලබනවිට දී, අනෙකුත් සංචිතවල ඇතුලත් කර ඇති වටිනාකම් රඳවාගත් ඉපැයුම්වලට මාරුකරනු ලැබේ.

3.2.2 නොනිමි ප්‍රාග්ධන වැඩ

නොනිමි ප්‍රාග්ධන වැඩ යනු වත්කමක් ඉදිකිරීමකට සෘජුවම ආශ්‍රිත ද්‍රව්‍යමය පිරිවැය සහ අනෙකුත් පිරිවැය වේ. නොනිමි වැඩ එය සාරනුකූලව සම්පූර්ණ කරනු ලැබූවිට දී සහ එහි අපේක්ෂිත භාවිතය සඳහා සූදානම්විට දී අදාළ වත්කම් ගිණුම්වලට මාරුකරනු ලැබේ.

3.2.3 මූල්‍ය වත්කම්

3.2.3.1 වර්ගීකරණය

3.2.3.2 ණය සහ ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ සක්‍රීය වෙළෙඳපොළක මිල ගණන් ඉදිරිපත් කර නොමැති ස්ථාවර සහ නිශ්චයනීය ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. වාර්තාකරණ කාල සීමාව අවසානයේ දී මාස 12 කට වඩා වැඩි කල්පිරීම් සඳහා හැරුණු විට, ඒවා ජංගම වත්කම්හි ඇතුලත් කරනු ලැබේ. මේවා ජංගම නොවන වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. සමාගමේ ණය සහ ලැබිය යුතු දෑ ශේෂ පත්‍රයේ වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දේ සහ මුදල් සහ මුදලට සමාන දේවලින් සමන්විත වේ. (සටහන් 3.8 සහ 3.9)

3.2.5.4 පිළිගැනීම සහ මැනීම

ලාභ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට දැක්වෙන මූල්‍ය වත්කම් ආරම්භයේ දී සාධාරණ වටිනාකමට පිළිගනු ලබන අතර ගනුදෙනු පිරිවැය ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස හිලව්කොට දක්වනු ලැබේ. ආයෝජනවලින් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය අවසන් වී ඇති විට දී හෝ හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ පරිදාන සැලකිය යුතු ලෙස පවරනු ලැබ ඇති විට දී මූල්‍ය වත්කම් පිළිගැනීම අවසන් කරනු ලැබේ. අලෙවියට තිබෙන මූල්‍ය වත්කම් සහ ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමට දක්වා ඇති මූල්‍ය වත්කම් තදනන්තරව සාධාරණ වටිනාකමට දක්වනු ලැබේ. සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් ණය සහ ලැබිය යුතු දෑ තදනන්තරව ක්‍රමක්ෂිත මිලට දක්වනු ලැබේ.

"ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමට දක්වා ඇති මූල්‍ය වත්කම්" කාණ්ඩයේ සාධාරණ වටිනාකමේ වෙනස්වීම් වලින් මතුවන ලාභහෝ අලාභ ඒවා මතුවන කාල සීමාව තුල "අනෙකුත් (අලාභ)/ලාභ - ශුද්ධ" හි ආදායම් ප්‍රකාශයේ ඉදිරිපත් කරනු ලැබේ.

අලෙවියට තිබෙන මූල්‍ය වත්කම් වර්ගීකරණය කර ඇති මුදල් හෝ මුදල් නොවන සුරුකුම්පත්වල සාධාරණ වටිනාකමේ වෙනස් වීම් අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ පිළිගනු ලැබේ. අලෙවියට තිබෙන ලෙස වර්ගීකරණය කර ඇති සුරුකුම්පත් විකුණනු ලබනවිට දී හෝ හානි වූ විට දී, ස්කන්ධයේ පිළිගනු ලබන සමුච්චිත සාධාරණ වටිනාකමේ

ගැලපීම් "ආයෝජන සුරුකුම්පත්වලින් ලාභ හෝ අලාභ" ලෙස ආදායම් ප්‍රකාශයේ ඇතුළත් කරනු ලැබේ. සළුල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් ගණනය කරනු ලබන අලෙවියට තිබෙන සුරුකුම්පත් මත පොළිය අනෙකුත් ආදායමේ කොටසක් ලෙස ආදායම් ප්‍රකාශනයේ පිළිගනු ලැබේ.

3.2.5.5 මූල්‍ය වත්කම් හානි

(අ) ක්‍රමක්ෂිත පිරිවැයට දැක්වෙන වත්කම්

සෑම වාර්තාකරණ කාලසීමාවක් අවසානයේ දී ම මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිවීමේ වාස්තවික සාක්ෂි ඇත්දැයි සමාගම තක්සේරු කරයි. මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානි වී, හානි අලාභ දැරීමට සිදුවනුයේ වත්කම් ආරම්භක පිළිගැනීමෙන් පසුව සිදුවන තනි හෝ බොහෝ සිද්ධීන් හි (හානි සිද්ධියක්) ප්‍රතිඵලයක් ලෙස හානියක් සිදුව ඇති බවට වාස්තවික සාක්ෂි ඇත්නම් සහ එම හානි සිද්ධිය (හෝ සිද්ධි) මූල්‍ය වත්කමෙහි හෝ මූල්‍ය වත්කම් සමූහයෙහි ඇස්තමේන්තු ගත අනාගත මුදල් ප්‍රවාහයන්ට විශ්වාසනීය ලෙස මිණිය හැකි බලපෑමක් ඇති කරන්නේ නම් පමණි.

ණය හිමියෝ හෝ ණය හිමියන් සමූහයක් සැළකිය යුතු මූල්‍ය දුෂ්කරතා අත්විඳින බවට වන ඇඟවීම්, ඔවුන් වස්තු භංගත්වයට හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයක් සඳහා එළඹීමේ සම්භාවිතාව සහ පැහැර හැරීම් හා සහසම්බන්ධ වන හිඟ මුදල් වෙනස්කම් හෝ ආර්ථික තත්වයන් බඳු ඇස්තමේන්තු ගත අනාගත මුදල් ප්‍රවාහයන්හි මිණිය හැකි අඩුවීමක් තිබෙන බවට නිරීක්ෂණය කළ හැකි දත්ත පෙන්නුම් කිරීම ආදිය හානි පිළිබඳ සාක්ෂිවලට ඇතුළත් විය හැක.

ණය සහ ලැබිය යුතු දේ කාණ්ඩය සඳහා, හානියේ ප්‍රමාණය මණිනු ලබනුයේ වත්කමෙහි ධාරණ මුදල සහ මූල්‍ය වත්කමෙහි මුල් සළුල පොළී අනුපාතයට වට්ටම් කරන ලද ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්හි (දැරීමට සිදුව නොමැති අනාගත ණය අලාභ හැර) වර්තමාන වටිනාකම අතර වෙනස ලෙසයි. ඒකාබද්ධ ආදායම් ප්‍රකාශයේ වත්කමෙහි ධාරණ මුදල අඩු කර අලාභයේ ප්‍රමාණය පිළිගනු ලැබේ. යම් ණයක හෝ කල්පිරීම දක්වා රඳවා ගත් ආයෝජනයක විචල්‍ය ණය අනුපාතයක් තිබේ නම්, කිසියම් හානි අලාභ මැණිම සඳහා වට්ටම් අනුපාතය වනුයේ ගිවිසුම යටතේ නිශ්චය කර ඇති වර්තමානෙහි ක්‍රියාත්මක පොළී අනුපාතයයි. ප්‍රායෝගික ක්‍රියාමාර්ගයක් ලෙස, නිරීක්ෂණය කළ හැකි වෙළෙඳපොල මිලක් යොදා ගනිමින් සාධන පත්‍රයක සාධාරණ වටිනාකම පාදකව සංස්ථාව හානිය මැනීමට ඉඩ තිබේ.

තදනන්තර කාල සීමාවක දී, හානියේ අලාභයේ ප්‍රමාණය අඩුවී වම අඩුවීම හානිවීම පිළිගැනීමෙන් පසු සිදු වූ සිද්ධියකට වාස්තවිකව සම්බන්ධ වන්නේ නම් (ණය හිමියාගේ ණය ප්‍රමාණ කිරීම වැඩි දියුණුවීමක් බඳු), කළින් පිළිගත් හානිවීමේ අලාභයේ ප්‍රතිවර්තනය ආදායම් ප්‍රකාශයෙහි පිළිගනු ලැබේ.

3.2.5.6 වෙළඳ ලැබිය යුතු දෑ

වෙළඳ ලැබිය යුතු දෑ අපේක්ෂිත උපලබ්ධි කළ හැකි වටිනාකමට දක්වනු ලැබේ. ලැබිය යුතු දෑ පිළිබඳ මුල් නියමයන් ප්‍රකාරව අයවිය යුතු සියලු මුදල් ප්‍රමාණ සංස්ථාවට එකතු කර ගැනීමට නොහැකි විය හැකි බවට වාස්තවික සාක්ෂි ඇති විට දී වෙළෙඳ අයවිය යුතු දේවල හානි වීම සඳහා ප්‍රතිපාදනයක් ස්ථාපිත කෙරේ. ණයගැතියා මුහුණදෙන සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතා, ණයගැතියා බුන්වත් බවට පත්වීම හෝ මූල්‍ය ප්‍රතිසංවිධානය සඳහා ඇති ඉඩකඩ ආදිය වෙළඳ ලැබිය යුතු දෑ දුර්වල වී ඇති බවට දර්ශකයක් වශයෙන් සලකනු ලැබේ. දීමනා ගිණුමක් භාවිතා කිරීම මගින් වත්කමේ ධාරණ වියදම අඩුකරනු ලබන අතර විස්තීරණ ආදායම් ප්‍රකාශයේ බෙදාහැරීමේ පිරිවැය තුළ පාඩු මුදල පිළිගනු ලැබේ. වෙළෙඳ ලැබීමක් එකතු කර ගත නොහැකි වන විට ලැබිය යුතු වෙළෙඳ මුදල් සඳහා දීමනා ගිණුමෙන් එය කපා හරිනු ලැබේ. කලින් ලියා හරින ලද මුදල් තදනන්තරව ආපසු අයකර ගැනීම් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ බෙදා හැරීමේ පිරිවැයට බැරකරනු ලැබේ.

වෙළෙඳ ලැබිය යුතු දෑ ආරම්භයේ දී සාධාරණ අගයට පිළිගනු ලබන අතර ඉන්පසුව ඒවා හානිවීම සඳහා වන ප්‍රතිපාදන අඩු කිරීමෙන් පසු සළුල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් ක්‍රමක්ෂිත පිරිවැයට මණිනු ලැබේ.

3.2.6 තොග

වට්ටෝරු භාණ්ඩ ප්‍රකාශ කර ඇත්තේ වඩා අඩු පිරිවැයට හෝ ශුද්ධ උපලබ්ධි කළ අගයටය. ශුද්ධ උපලබ්ධි කළ අගය යනු සාමාන්‍ය ව්‍යාපාරික ඇස්තමේන්තු ගත සම්පූර්ණ කිරීමේ සහ විකුණුම් වියදම් අඩුකිරීමෙන් පසු ඇස්තමේන්තු ගත විකුණුම් මිල ය.

3.2.7 මුදල් හා මුදලට සමාන දෑ

මුදල් ප්‍රවාහ පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශයන් හි, මුදල් හා මුදලට සමාන දෑට අතැති මුදල්, බැංකු වල ඇති ඉල්ලූම් තැන්පතු මාස තුනක් හෝ ඊට අඩු මූලික කල්පිරීමක් සහිත අනෙකුත් කෙටි කාලීන ඉහළ ද්‍රවශීලතාවක් ඇති ආයෝජන සහ බැංකු අයිරා අයත් වේ. මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ බැංකු අයිරා පෙන්නුම් කරනු ලබන්නේ ජංගම වගකීම් තුළ ණය ගැනුම් ලෙස ය.

3.2.8 ණය ගැනුම් පිරිවැය

ඒවායේ අපේක්ෂිත භාවිතයට හෝ විකිණීමට සූදානම් කිරීම සඳහා අවශ්‍යයෙන් ම සැළකිය යුතු කාලසීමාවක් ගන්නා වූ වත්කම් වන "සුදුසුකම් ලබන වත්කම්" අත්පත් කරගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනය වෙත් සෘජුව ම ආරෝපණය සාමාන්‍ය හෝ නිශ්චිත ණය ගැනුම් පිරිවැය, එකී වත්කම් ඒවායේ අපේක්ෂිත භාවිතයට හෝ විකිණීමට සාරනුකූලව සූදානම් කරන කාලය තෙක් එම වත්කම්වලට පිරිවැයට එකතු කරනු ලැබේ.

නිශ්චිත ණය ගැනුම්හි තාවකාලික අයෝජන මත උපයනු ලැබූ ආයෝජන ආදායම, සුදුසුකම් ලබන වත්කම් මත ඒවායේ වියදම තීරණය කරන තෙක් ප්‍රාග්ධනීකරණය සඳහා සුදුසුකම් ඇති ණය ගැනුම් පිරිවැයෙන් අඩුකරනු ලාබේ.

අනෙකුත් සියලු ණය ගැනීමේ පිරිවැය ඒවා දරන ලද කාලසීමාව තුළ ලාභ හෝ අලාභයන් හි පිළිගනු ලැබේ.

3.2.8 ජංගම සහ විලම්බිත බදු

මෙම කාලසීමාව තුළ බදු වියදම් සමන්විත වන්නේ ජංගම සහ විලම්බිත බදු වලිනි. ආදායම් ප්‍රකාශය තුල බදු පිළිගනු ලබන්නේ අනෙකුතු විස්තීරණ ආදායම්වල හෝ කෙළින්ම කොටස්වල ගණන් ගනු ලබන අයිතම වලට ඒවා අදාළ වන ප්‍රමාණයට හැර ඉතිරි ප්‍රමාණයට ය. මෙහිදී පිළිවෙලින් අනෙකුත් විස්තීරණ ආදායම්වල හෝ කෙළින්ම කොටස්වල ද බදු ගණන් ගැනේ.

අ) ජංගම බදුකරණය

2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ සහ එහි සංශෝධනවල විධිවිධාන අනුව සමාගමට ජංගම බදු බැරකම් ඇතිවේ. සැබෑ බැරකම් පිළිබිඹු කරන්නක් වශයෙන් කළමනාකාරිත්වය විශ්වාස කරන යතෝක්ත ප්‍රතිපාදන යොදා ගනිමින් මූල්‍ය ප්‍රකාශවල මේ බැරකම් සඳහා ප්‍රතිපාදන සපයනු ලැබේ. ගනුදෙනු පිළිබඳව සංස්ථාව විසින් ගනු ලැබූ ස්ථාවරය අදායම් අධිකාරීන් විසින් අභියෝගයට ලක්කරන අවස්ථා තිබිය හැක. මෙම කරුණු නිසා ඇතිවන කවර හෝ අතිරේක පිරිවැයක් සංස්ථාව මත බැරකම තහවුරු කරන අවස්ථාවේ බදු වියදමක් ලෙස ගිණුම් ගත කරනු ලැබේ.

ප්‍රවර්තන වසර සහ පෙර කාලසීමාවන් සඳහා ජංගම බදු වත්කම් සහ බැරකම් මණිනු ලබන්නේ ආදායම් අධිකාරියට ආපසු අයකර ගැනීමට හෝ ගෙවීමට අපේක්ෂා කරන ප්‍රමාණයන්ගෙනි. ප්‍රමාණය ගණනය කිරීම සඳහා භාවිතා කළ බදු අනුපාත හෝ බදු නීතිවනුයේ ශේෂ පත්‍ර දින වනවිට පනවනු ලබන හෝ සත්තාවීව පනවනු ලබන ඒවාය. ජංගම බදු සඳහා ප්‍රතිපාදන පදනම් වනුයේ මූල්‍ය ප්‍රකාශනයන්හි වාර්තා කර ඇති පරිදි ආදායම් සහ වියදම් අංග පදනම්ව ය.

ආ) විලම්බිත බදුකරණය

වත්කම් සහ බැරකම්වල බදු පදනම සහ මූල්‍ය වාර්තාකරණ කාර්යයන් සඳහා ඒවායේ ධාරණ වටිනාකම අතර ශේෂ පත්‍ර දිනට ඇති තාවකාලික වෙනස්කම් මත ශේෂ පත්‍ර ක්‍රම වේදය භාවිතා කරමින් විලම්බිත බදු පිළිගනු ලැබේ. ව්‍යාපාර සංයෝජනයක් නොවන සහ ගිණුම්කරණයට හෝ බදු අයකළ හැකි ලාභයට බල නොපාන ගනුදෙනුවක දී වත්කම් සහ බැරකම් ආරම්භක පිළිගැනීමෙන් මතුවන තාවකාලික වෙනස්කම් සහ පූර්වේක්ෂිත අනාගතයේ ප්‍රතිවර්තනය නොවීමට ඩට ඇති ප්‍රමාණයට අයෝජන ආශ්‍රිත වෙනසකම් සඳහා විලම්හිත බදු බැරකම් පිළිගනු නොලැබේ. ඊට අමතරව, කීර්ති නාමය ආරම්භක පිළිගැනීම මත මතුවන බදු අය කළ හැකි තාවකාලික වෙනස්කම් සඳහා ද විලම්හිත බදු බැරකම් පිළිගනු නොලැබේ. වාර්තාකරණ දිනය වනවිට පනවා ඇති හෝ සත්තාවීව පැනවීමට ඉඩ ඇති නීති මත පදනම්ව තාවකාලික වෙනස්කම් ප්‍රතිවර්තනය වනවිට දී යොදා ගැනීමට අපේක්ෂා කරන ලබන බදු අනුපාතයන්ට විලම්හිත බදු ගණනය කෙරේ. ජංගම බදු බැරකම් සහ වත්කම් හිලව් කිරීම පිණිස නෛතිකව

බලාත්මක කළ යුතු හිමිකමක් වේ නම් සහ එම බදු අයකළ හැක අස්තිත්වයට එහ බදු අධිකාරීන් විසින් ම අයකරනු ලබන අදායම් බදුවලට ඒවා අදාළ වන්නේ නම් විලඹිහිත බදු වත්කම් සහ බැරකම් හිලව් කරනු ලැබේ.

විලම්හිත බදු වත්කම් පිළිගනු ලබන්නේ තාවකාලික වෙනසකම් උපයෝජනය සඳහා යොදා ගත හැකි අනාගත බදු අය කළ හැකි ලාභ ඇතිවිය හැකි තාක් දුරට පමණි. එක් එක් වාර්තාකරණ දිනයට විලම්හිත බදු වත්කම් සමාලෝචනය කරනු ලබන අතර ආශ්‍රිත බදු ප්‍රතිලාභ උපලබ්ධි වීම තවදුරටත් සිදු නොවිය හැකි ප්‍රමාණයට අඩු කරනු ලැබේ.

3.2.10 සේවක ප්‍රතිලාභ

3.2.10.1 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

අ) නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම - විශ්‍රාම පාරිතෝෂික ප්‍රතිපාදනය

නිර්වචිත ප්‍රතිලාභ සැලැස්මක් යනු නිර්වචිත දායක සැලැස්මක් හැරුණුකොට පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලැස්මකි. නිර්වචිත ප්‍රතිලාභ සැලැස්මට අදාළව මූල්‍ය ප්‍රකාශනයේ පිළිගනු ලබන බැරකම වනුයේ වාර්තාකරණ දිනයට නිර්වචිත බැඳීමේ වත්මන් වටිනාකමයි. නිර්වචිත ප්‍රතිලාභ බැඳීම ගණනය කරනු ලබන්නේ ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමවේදය භාවිතා කරමිනි. නිර්වචිත ප්‍රතිලාභ බැඳීමේ වත්මන් වටිනාකම නිර්ණය කරනු ලබන්නේ ඇස්තමේන්තුගත අනාගත මුදල් ගලායාම වට්ටම් කිරීම මගිනි.

ප්‍රතිලාභ ගෙවනු ලබන මුදල් ඒකකයන්හි සහ ආශ්‍රිත බැරකමේ කාල සීමාවන්ට සමීප වන්නා වූ කල්පිරීමේ කාලසීමා සහිත පොළී අනුපාත භාවිතා කරමින් ප්‍රතිලාභ ගෙවනු ලැබේ.

විශ්‍රාමික ප්‍රතිලාභ පිරිවැය පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 (2006 ප්‍රතිශෝධිත) අනුකූල වන පරිදි සියලු ස්ථිර සේවකයන් සඳහා සේවයේ පළමු වසර සම්පූර්ණ කිරීමේ සිට විශ්‍රාමික පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සලසා ඇත. කෙසේ වෙතත්, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත සමග සේවකයකු සඳහා වන වගකීම ඇති වනුයේ පස් වසරක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීමේදී පමණි. බැරකම් සඳහා බාහිරින් අරමුදල් සපයනු නොලැබේ.

මෙම බැරකම සඳහා බාහිරින් අරමුදල් සපයනු නොලැබේ. ආයුගණකගේ ප්‍රධාන උපකල්පනයන්ට පහත දෑ ඇතුළත් වේ.

(1) 11% ක පොළී අනුපාතය

(2) 5% ක වැටුප් වර්ධක අනුපාතය

(3) සියලු සේවකයන්ගේ විශ්‍රාම ගන්නා වයස - අවරුදු 60

(ආ) නිර්වචිත දායක සැලසුම් සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් සහ සේවක භාරකාර අරමුදලේ දායක මුදල් සඳහා සුදුසුකම් සහිත සියලුම සේවකයන් ඒ ඒ ප්‍රඥප්ති සහ රෙගුලාසි ප්‍රකාරව අදාළ දායක අරමුදල්වලින් ආවරණය කෙරේ. නිර්වඩචිත දායක සැලැසුම් සඳහා සේවායෝජකගේ දායකත්වය, දරන ලැබූ විටදී ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස හඳුනා ගනු ලැබේ.

3.2.11 රජයේ ප්‍රදාන

ප්‍රදානයට අදාළ කොන්දේසිවලට සමාගම අනුකූල වන බවට සහ ප්‍රදානය ලැබෙන බවට සාධාරණ සහතිකයක් ඇත්නම් රජයේ ප්‍රදාන ඒවායේ සාධාරණ වටිනාකමට පිළිගනු ලැබේ.

පිරිවැයට අදාළ රජයේ ප්‍රදාන විලම්හනය කරනු ලබන අතර හානිපූරණය කිරීමට අපේක්ෂා කරන පිරිවැය සමග ඒවා ගැලපීම පිණිස අවශ්‍ය කාලසීමාව පුරා විස්තීරණ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

දේපල, පිරියත සහ උපකරණ සහ ජීව විද්‍යාත්මක වත්කම්වලට අදාළ ප්‍රදාන විලම්හිත ආදායමක් ලෙස ජංගම නොවන වගකීම්වල ඇතුලත් කරනු ලබන අතර ආශ්‍රිත වත්කම්වල අපේක්ෂිත ආයු කාලය පුරා සරල රේඛීය පදනමක් මත ආදායම් ප්‍රකාශයට බැර කරනු ලැබේ.

ක්‍රමක්ෂය අනුපාත පහත දැක්වේ.

ගොඩනැගිලි	2.5%
පිරියත හා යන්ත්‍රෝපකරණ	7.5%
ශ්‍රව්‍ය සංඛ්‍යාත උපකරණ	7.5%
ගෘහභාණ්ඩ සහ සවිකිරීම් සහ උපකරණ	10%
සම්ප්‍රේශක	7.5%
රථ වාහන	25%

3.2.12 ප්‍රතිපාදන

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වත්මන් නෛතික හෝ සම්මුතික බැඳීමක් සංස්ථාව සංස්ථාව සතු විටදී එම බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ මූර්තිමත් කරමින් සම්පත් ගලා යාමක් අවශ්‍ය විම සිදුවිය හැකි විටකදී සහ බැඳීමේ වටිනාකමට විශ්වසනීය ඇස්තමේන්තුවක් සිදු කළ හැකි විටිදී ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ.

3.2.13 අසම්භාව්‍ය බැරකම් සහ අසම්භාව්‍ය වත්කම්

අසම්භාව්‍ය බැරකමක් යනු සංස්ථාවේ පාලනයෙන් පරිබාහිර වන අවිනිශ්චිත අනාගත සිදුවීම් එකක් හෝ කිහිපයක් හට ගැනීම හෝ හට නොගැනීම මගින් සිය පැවැත්ම සනාථ වන අතීත සිදුවීම් වලින් හෝ එකී බැඳීමෙන් නිදහස් වීම සඳහා සම්පත් බැහැරට ගලා යාමක් සිදුවීම සඳහා සම්පත් බැහැරට ගලා යෑමක් සිදුවීමේ හැකියාවක් නැති නිසා පිළිනොගැනෙන වර්තමාන බඳීමකින් හෝ පැන නැගීමට හැකියාවක් ඇති බැඳීමකි. විශ්වසනීය ලෙස මැනිය නොහැකි බැරකමක් පවතින බෙහෙවින් දුර්ලභ අවස්ථාවලදී ද බැරකමක් හඳුනා නොගන්නා නමුත් එවැන්නක පැවැත්ම මූල්‍ය ප්‍රකාශවලින් අනාවරණය කරයි. අසම්භාව්‍ය බැරකමක් සංස්ථාව පිළිනොගන්නා නමුත් එය පැවතීම මූල්‍ය ප්‍රකාශනයන්හි අනාවරණය කරනු ලැබේ.

අසම්භාව්‍ය වත්කමක් යනු සංස්ථාවේ පාලනයෙන් පරිබාහිර අවිනිශ්චිත අනාගත සිදුවීම් එකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හට ගැනීමෙන් සිය පැවැත්ම සනාථ වන අතීත සිදුවීම්වලින් පැන නැගීමට ඉඩ ඇති වත්කමකි. සංස්ථාව අවිනිශ්චිත වත්කම් හඳුනා නොගන්නා නමුත් ආර්ථික ප්‍රතිලාභ ඇතුළට ගලා ඒම් සිදුවිය හැකි වූවත් එය සැබවින්ම ස්ථිර නොවන අවස්ථාවලදී එවැනි දේවල පැවැත්ම අනාවරණය කරයි.

3.2.14 වෙළෙඳ ගෙවිය යුතු දෑ

සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී සැපයුම්කරුවන්ගෙන් ලබා ගන්නා ලද භාණ්ඩ හෝ සේවා වෙනුවෙන් ගෙවීම් කිරීමට ඇති බැඳීම්ය. ගෙවීම් කළ යුතු වන්නේ වසරක් තුළ හෝ ඊට අඩු කාලයක් තුළ නම් (හෝ ඊට වඩා කාලය දිගුවේ නම් ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ දී) ගෙවිය යුතු ගිණුම් ජංගම බැරකමක් වශයෙන් වර්ගීකරණය කරනු ලැබේ.

වෙළෙඳ ගෙවිය යුතු දෑ ආරම්භයේදී සාධාරණ අගයට පිළිගනු ලබන අතර ඉන් පසුව සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් ක්‍රමක්ෂිත පිරිවැයට මණිනු ලැබේ.

3.2.15 මූල්‍ය කල්බදු බැඳීම්

කල්බදු ගත් අයිතමවල හිමිකමට ආනුෂංගික සියලූ අවදානම් සහ ප්‍රතිලාභ සැළකිය යුතු ලෙස සංස්ථාවට පවරන්නා වූ මූල්‍ය කල්බදු මත ලබාගත් දේපල, පිරියත හා උපකරණ කල්බද්ද ආරම්භයේදි කල්බදු ගත් දේපලේ සාධාරණ වටිනාකමට හෝ වඩා අඩුනම් සමුච්චිත ක්ෂය වීම අඩුකොට ආරම්භයේ දි අවම කල්බදු ගෙවීමේ වටිනාකමේ වර්තමාන අගයට ප්‍රාග්ධනායිත කරනු ලැබේ.

ගෙවිය යුතු මුළු පොළිය අවිනිශ්චිත පොළියක් සේ ගිණුම් ගත කරනු ලැබේ. අනුරූපී ණය බදු දීමනාකරුට ගෙවිය යුතු මුදලක් සේ වාර්තා කරනු ලැබේ. ගෙවන ලද වාරික බැරකම අඩුකිරීම සඳහා යොදා ගනු ලැබේ.

වසර සඳහා අයකරන පොළිය පොළී අවිනිශ්චිත ගිණුමේ සිට ආදායම් ප්‍රකාශනයට මාරු කරනු ලැබේ.

3.2.16 ආදායම් ප්‍රකාශනය

3.2.16.1 ආදායම පිළිගැනීම

ලැබුණු හෝ ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවේ සාධාරණ වටිනාකමට අනුව ආදායම ගණන් ගනු ලබන අතර සපයන ලද සේවා සඳහා ලැබිය යුතු මුදල් ප්‍රමාණ පෙන්නුම් කරන අතර වට්ටම් සහ වටිනාකම එකතු කළ බදු අඩුකොට සඳහන් කරනු ලැබේ. ආදායම් ප්‍රමාණ විශ්වසනීය ලෙස මැණිය හැකි විටදීඃ අනාගත ආර්ථික ප්‍රතිලාභ සංස්ථාව වෙත ප්‍රවාහය වීමට ඉඩ ඇති විට දී සහ සංස්ථාවේ එක් එක් ක්‍රියාකාරකම සඳහා නිශ්චිත නිර්ණායක සපුරා ඇති විටදී සංස්ථාව ආදායම පිළිගනියි. පහත විස්තර කර ඇති පරිදි, ගනුදෙනුකාර වර්ගය, ගනුදෙනු වර්ගය සහ එක් එක් සැකසුමේ නිශ්චිත තොරතුරු සැලකිල්ලට ගනිමින් සංස්ථාව සිය ප්‍රතිලාභ ඇස්තමේන්තු වෙතිහාසික ප්‍රතිඵල මත පදනම් කර ගනී.

(අ) ගුවන් කාලය අලෙවිය

ආදායම ගුවන් කාලය විකි□මෙන් සමන්විත වෙයි. වෙළඳ දැන්වීම් ප්‍රචාරය වනවිට දී ගුවන් කාලය විකිණීමේ ආදායම පිළිගනු ලැබේ.

(ආ) පොළි ආදායම

එකතු කර ගැනීමට හැකි බව පිළිබඳ සැකයක් ඇත්නම් මිස කාල පදනමින් උපචිතවූ පොළිය ලෙස (වත්කමේ සඵල ඵලදාව සැලකිල්ලට ගනිමින්) පොළී ආදායම පිළිගනු ලැබේ.

(ඇ) දේපල, පිරියත හා උපකරණ බැහැර කිරීම් මත ශුද්ධ ලාභ සහ අලාභ

දේපල, පිරියත හා උපකරණ බැහැර කිරීම් මත ශුද්ධ ලාභ සහ අලාභ නිර්ණය කරනු ලබන්නේ ශුද්ධ විකුණුම් ආදායම දේපල, පිරියත හා උපකරණවල ධාරණ වටිනාකම සමග සැසඳීමෙන් වන අතර ආදයම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

(ඈ) වෙනත් ආදායම්

අනෙකුත් සියලූ ආදායම් පිළිගනු ලබන්නේ උපචිත පදනමක් මතය.

3.2.17.1 වියදම් පිළිගැනුම

අ) මෙහෙයුම් වියදම්

ආදායම් ප්‍රකාශනයේ වියදම් පිළිගනු ලබන්නේ දරන ලද පිරිවැය සහ නිශ්චිත ආදායම් අයිතමයක ඉපැයුම අතර සෘජු සබඳතා පදනම මතය. ව්‍යාපාරය පවත්වා ගෙන යාමේදී සහ කාර්යක්ෂම තත්ත්වයක් තුළ දේපල, පිරියත සහ උපකරණ නඩත්තු කිරීමේදී දරනු ලබන සියලූ වියදම් වර්ෂය සඳහා ලාභ / පාඩු නිගමනය කිරීමේදී ආදායමෙන් අඩු කරනු ලැබ ඇත. බොල් සහ අඩමාන ණය, දන්නා සියලූ බැරකම් සහ දේපල, පිරියත හා උපකරණ මත ක්ෂයවීම සඳහා ද ප්‍රතිපාදන සලසා ඇත.

ආ) මූල්‍ය වියදම්

පොළී ආදායම් උපචිත පදනමකින් පිළිගනු ලැබේ. ණයගැනුම් පිරිවැය ඒවා දරන ලද කාල සීමාවේදීවියදමක් ලෙස පිළිගනු ලැබේ.

3.2.18 තුලනාත්මක සංඛ්‍යා

අවශ්‍ය අවස්ථාවල දී ප්‍රවර්තන වර්ෂය තුළ කරනු ලබන ඉදිරිපත් කිරීම්වලට අනුකූල වනු පිණිස තුලනාත්මක සංඛ්‍යා ගලපනු ලැබ ඇත.

පිටු 05 සිට 23 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අනුකලන කොටසක් සම්පාදනය කරයි.

4. තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු සහ විනිශ්චයන්

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගැනීම කෙරෙහි බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සහ වාර්තා වූ වත්කම්, බැරකම්, ආදායම් සහ වියදම් ප්‍රමාණයන් සහ වාර්තාකරණ දිනයට අසම්භාව්‍ය බැරකම් හෙළිදරව් කිරීම් සැලකිල්ලට ගැනීමට කළමනාකාරිත්වයට සිදු වේ. කෙසේ වෙතත් මෙම උපකල්පන සහ ඇස්තමේන්තු පිළිබඳ අවිනිශ්චිතතාව, අනාගත කාල සීමාවන්හි සිදුකරනු ලබන වත්කම් හෝ බැරකම්වල ධාරණ වටිනාකමට ප්‍රමාණාත්මක වෙනස්කම් අවශ්‍ය කරන්නා වූ ප්‍රතිඵල ඇතිකිරීමට හැකිය.

විනිශ්චයන්, ඇස්තමේන්තු සහ පාදක වූ ඇස්තමේන්තු වෙතිහාසික අත්දැකීම් සහ අනෙකුත් මූලාශ්‍රයන්ගෙන් පහසුවෙන් හඳුනාගත නොහැකි වත්කම්, බැරකම් සහ අසම්භාව්‍ය බැරකම්වල ධාරණ ප්‍රමාණ පිළිබඳ විනිශ්චයන්,

ඇස්තමේන්තු සහ උපකල්පන සිදුකිරීමේදී පදනම සකස්කරන්නා වූ අවස්ථානුගත තත්වයන් යටතේ සාධාරණයැයි විශ්වාස කරනු ලබන අනෙකුත් විවිධ සාධකවල ප්‍රතිඵල මත පදනම් වී ඇත.

විනිශ්චයන්, ඇස්තමේන්තු සහ පාදක වූ ඇස්තමේන්තු අඛණ්ඩ පදනමකින් සමාලෝචනය කරනු ලැබේ. ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා ප්‍රතිශෝධන, එකී ප්‍රතිශෝධන වත්මන සහ අනාගත කාල සීමා සඳහා බලපාන්නේ නම් එම ඇස්තමේන්තු ප්‍රතිශෝධනය කරනු ලබන කාල සීමාවේදී පිළිගනු ලැබේ. ශ්‍රී.ල.ගි.ප්‍ර යොදා ගැනීමේදී කළමනාකාරිත්වය විසින් සිදුකරන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ ඇස්තමේන්තු මූල්‍ය ප්‍රකාශ කෙරෙහි සැළකිය යුතු බලපෑමක් ඇති කළ හැක.

(අ) විශ්‍රාම ප්‍රතිලාභ

විශ්‍රාම බැඳීම්වල වර්තමාන වටිනාකම උපකල්පන ගණනාවක් භාවිත කරමින් ආයුගණක පදනමක් මත නිර්ණය කරනු ලබන සාධක ගණනාවක් මත රඳා පවතී. විශ්‍රාම වැටුප් සඳහා ශුද්ධ පිරිවැය (ආදායම) නිශ්චය කිරීමේදී යොදා ගනු ලබන උපකල්පනවලට වට්ටම් අනුපාතය ඇතුලත් වේ. මෙම උපකල්පනයන්හි කවර හෝ වෙනසක් විශ්‍රාම වැටුප් බැඳීම්වල ධාරණ මුදල් ප්‍රමාණය කෙරෙහි බලපානු ඇත.

උචිත වට්ටම් අනුපාතය සෑම වසරක් අවසානයේදීම සංස්ථාව නිශ්චය කරනු ලැබේ. විශ්‍රාම වැටුප් බැඳීම් පියවීමට අවශ්‍ය යැයි අපේක්ෂා කරනු ලබන අනාගත මුදල් ගලායාම්හි වර්තමාන වටිනාකම නිශ්චය කිරීම සඳහා භාවිතා කළ යුතු පොළී අනුපාතය වන්නේ මෙයයි. උචිත වට්ටම් අනුපාතය නිශ්චය කිරීමේදී සංස්ථාව ආයතනික බැඳුම්කරවල පොළී අනුපාත සැලකිල්ලට ගනියි. විශ්‍රාම වැටුප් බැඳීම් අනෙකුත් ප්‍රධාන උපකල්පන වත්මන් වෙළෙඳපොල තත්වයන් මත ද අර්ධ වශයෙන් පාදක වේ.

(ආ) ආදායම් බදු ආදායම

සංස්ථාව ආදායම් බදුවලට යටත් වේ. ආදායම් බදු සඳහා ප්‍රතිපාදනය නිශ්චය කිරීමේ දී සැළකිය යුතු විනිශ්චයක් අවශ්‍ය වේ. බොහෝ ගනුදෙනු සහ ගණනය කිරීම් ඇති අතර ඒ සඳහා අවසාන බදු නිශ්චය කිරීම අවිනිශ්චිතය. අතිරේක බදු ලැබීමට නියමිත ද යන්න පිළිබඳ ඇස්තමේන්තු මත පාදකව අපේක්ෂිත බදු විගණන ගැටළු සඳහා සංස්ථාව බැරකම් පිළිගනු ලැබේ. මෙම කරුණුවල අවසාන බදු ප්‍රතිඵලය ආරම්භයේ දී වාර්තා කළ ප්‍රමාණයන්ට වඩා වෙනස්වන විටදී, එම වෙනස්කම් එවැනි නිශ්චයකිරීම් සිදුකරනු ලැබූ කාල සීමාව තුල පංගම සහ විලම්භිත ආදායම් බදු වත්කම් සහ බැරකම් කෙරෙහි බලපානු ඇත.

පිටු 05 සිට 23 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අනුකලන කොටසක් සම්පාදනය කරයි.

5. මූල්‍ය අවදානම් කළමනාකරණය

5.1 මූල්‍ය අවදානම් සාධක

සංස්ථාවේ ක්‍රියාකාරකම් වය මූල්‍ය අවදානම් මිශ්‍රණයකට නිරාවරණය කරයි. වෙළඳපොළ අවදානම, (ව්‍යවහාර මුදල්, සාධාරණ වටිනාකම පොළී අනුපාත අවදානම, මුදල් ප්‍රවාහ පොළී අනුපාත අවදානම සහ මිල අවදානම ඇතුළුව) ණය අවදානම සහ ද්‍රවශීලතා අවදානම ඒ අතර වේ. සංස්ථාවේ සමස්ත ණය කළමනාකරණ වැඩසටහන් සංස්ථාවේ මූල්‍ය කාර්යසාධනය මත අහිතකර බලපෑම් ඇතිකළ හැකි අහිතකර ප්‍රතිඵල අවම කිරීමට ඉලක්ක ගත වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත ප්‍රතිපත්ති යටතේ මූල්‍ය අංශය විසින් අවදානම් කළමනාකරණය සිදුකරනු ලැබේ.

(අ) වෙළඳපොළ අවදානම්

(i) විදේශ විනිමය අවදානම

සංස්ථාව තමන්ට අවශ්‍ය උපකරණ ජාත්‍යන්තරව ආනයන කරන අතර මූලිකවම ඇමෙරිකානු ඩොලර්වලට අදාළව ව්‍යවහාර මුදල් නිරාවරණයන්ගෙන් මතුවන විදේශ විනිමය අවදානම් වලට නිරාවරණය වේ. අනාගත වාණිජ ගනුදෙනුවලින් සහ පිළිගත් වත්කම් සහ බැරකම් වලින් මතුවන සිය විදේශ විනිමය අවදානම් කළමනාකාරණය කිරීම පිණිස සමාගම දේශීය නියෝජිතයන් සමග ගිවිසුම්වලට එළඹේ.

(ii) මිල අවදානම

වෙළෙඳ භාණ්ඩ මිල අවදානමට සංස්ථාව නිරාවරණය වේ. ප්‍රධාන සැපයුම්කරුවන් සමග ගිවිසුම්වලට එළඹීම මගින් සංස්ථාව අවදානම් අවමකරයි.

(iii) ණය අවදානම්

ණය අවදානමට නිරාවරණය වනුයේ මුලිකවම වෙළඳ ලැබීය යුතු දෑ වලින් වන අතර

සේවා සැපයීමට පෙර සිය නව ගනුදෙනුකරුවන් සෑම කෙනෙකුම සඳහාම ණය අවදානම කළමනාකරණය කිරීමේ සහ විශ්ලේෂණය කිරීමේ වගකීම සංස්ථාව සතුය.

ණය අවදානම මතුවනුයේ මුදල් හා මුදලට සමාන දෑ, බැංකු සහ මූල්‍ය ආයතනවල ඇති තැන්පතු මෙන්ම ගනුදෙනුකරුවන්ගේ ලැබීය යුතු දෑ සහ වාණිජ ගනුදෙනු වෙත ණය නිරාවරණය වීම් මගිනි. බැංකු සහ මූල්‍ය ආයතන සඳහා, ස්වාධීනව ශ්‍රේණිගත කරනු ලැබූ අවම වශයෙන් ශ්‍රේණිගත කිරීම සහිත පාර්ශව පමණක් පිළිගනු ලැබේ. අවදානම් පාලනය ගනුදෙනුකරුගේ මූල්‍ය තත්වය, අතීත අත්දැකීම් සහ අනෙකුත් සාධක සැලකිල්ලට ගනිමින් ණය ගුණාත්වය තක්සේරු කරනු ලැබේ. අභ්‍යන්තර හෝ බාහිර ශ්‍රේණිගත කිරීම් මත පාදකව කේවල ණය සීමා පනවනු ලැබේ. ණය සීමා උපයෝජනය නිරන්තරයෙන් අධික්ෂණය කරනු ලැබේ.

(iv) ද්‍රවශීලතා අවදානම්

සංස්ථාව විසින් මූල්‍ය පූර්වකථනය සිදුකරනු ලබන අතර සංස්ථාවේ ද්‍රවශීලතා අවශ්‍යතා සහතික කිරීම පිණිස නිරතුරුව සමාලෝචනය කරනු ලැබේ. එබඳු පූර්වකථනයන් හි දී සංස්ථාවේ ණය මූල්‍යකරණ සැලසුම්, ප්‍රඥප්ති අනුකූලතාව සැලකිල්ලට ගනු ලැබේ. කාරක ප්‍රාග්ධන කළමනාකරණය සඳහා අවශ්‍ය කරනු ලබන ශේෂයට වඩා සහ ඉහළින් සංස්ථාව විසින් රඳවාගෙන ඇති අතිරික්ත මුදල්, බැඳීම් සපුරාලීම සඳහා යෝග්‍ය කල්පිරීම් සහිත පොළී ආදායම් උපයනු පිණිස කාල තැන්පතුවලට මාරු කරනු ලැබේ.

6. ආශ්‍රිත පාර්ශව ගනුදෙනු

සබඳතාවයේ නම	*තනතුර*	*ගනුදෙනුවේ ස්වභාවය*
සිද්දික් ඒ. ෆාරුක් මයා	සභාපති	නැත
සුදර්ශන ගුණවර්ධන	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	නැත
එම්. ජේ. ආර්. ඩේවිඩ් මයා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	නැත
ඩබ්ලිව්. ජයසිරි මහා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	කලාකරු
බී.කේ.ආර්. බාලසූරිය මයා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	නැත
ධනුෂ්ක රාමනායක මයා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	නැත

සටහන - 1

ආදායම

විස්තරය	2017	2016 ගලපන ලද	ගැලපුම	2016 අනුමත කරන ලද
ගුවන් කාලය විකිණීම ආසියානු සේවය	9,995,273	11,891,588		11,891,588
ගුවන් කාලය විකිණීම T.W.R.	87,213,294	87,816,670		87,816,670
ගුවන් කාලය විකිණීම දේශීය ගුවන්විදුලි සේවා	447,967,196	411,490,841	(1,625,640)	413,116,481
නිෂ්පාදන ගාස්තු දේශීය ගුවන්විදුලි සේවා	5,797,736	4,986,309		4,986,309
ආදායම ත්‍රිකුණාමල ව්‍යාපෘතිය	136,055,907	140,731,469		140,731,469
අවමංගල්‍ය දැන්වීම	4,015,157	4,096,908		4,096,908
ගුවන්කාලය විකිණීම FEBA	3,158,229	2,128,630		2,128,630
	694,202,792	**663,142,415**	**(1,625,640)**	**664,768,055**

සටහන - 2

විකුණුම් පිරිවැය

විස්තරය	2017	2016
වැටුප්, වේදන සහ දීමනා	311,412,493	313,401,377
සේවක අර්ථසාධක අරමුදල	33,642,153	32,696,029
සේවක භාරකාර අරමුදල	6,231,252	6,253,413
ගමන් සහ යැපුම් දීමනා	594,179	729,201
වැඩසටහන් වියදම්	8,096,193	15,332,877
සහන කාර්ය මණ්ඩලය	5,993,254	6,213,542
වාහන කුලියට ගැනීමේ ගාස්තු	7,016,262	3,975,371
නඩත්තු පිරිවැය	7,154,606	4,742,199
සම්බන්ධ කිරීමේ ගාස්තු	4,685,473	6,111,988
විදුලිය	168,280,801	168,462,025
ව්‍යාපාර ප්‍රවර්ධන වියදම	4,008,371	4,312,221
ගුවන් කාලය විකිණීමේ කොමිස් මුදල (දේශීය)	61,209,216	58,729,448
ගුවන් කාලය විකිණීමේ කොමිස් මුදල (විදේශීය)	837,449	805,014
	619,161,702	**621,764,705**

සටහන - 3

අනෙකුත් මෙහෙයුම් ආදායම්

විස්තරය	2017	2016 ගලපන ලද	ගැලපුම	2016 අනුමත කරන ලද
ණය මත පොළිය	6,867,807	5,187,266	977,626	4,209,640
විවිධ ආදායම් (වෙනත්)	72,534,847	52,989,091	1,698,618	51,290,473
ආපසු ලද චෙක් සඳහා ප්‍රවා. නියෝ. ආයතනවල දඩ මුදල්	48,967	469,884		469,884
ගෙවල් කුලී	136,671	111,863		111,863
සංචාරක බංගලා ආදායම	559,089	435,000		435,000
විශේෂ පටිගත කිරීම්	933,353	546,683		546,683
ආනයනකරුවන්, වෙළෙන්දන් සඳහා බලපත්‍ර ලබාදීම	7,979,249	7,890,389		7,890,389
කැසට් අලෙවිය	3,037,992	1,852,360		1,852,360
දඩ ගිණුම	-	1,900		1,900
සංචාරක බංගලා ආදායම - අඹේවෙල	389,725	172,596		172,596
ප්‍රකාශන අලෙවිය	26,104	55,545		55,545
උප එකතුව	**92,513,803**	**69,712,579**	**2,676,244**	**67,036,335**
රජයේ ප්‍රදානය ක්‍රමක්ෂය	77,916,361	67,476,968		67,476,968
ත්‍රිකුණාමල ප්‍රදාන ක්‍රමක්ෂය	155,406,674	155,406,674		155,406,674
උප එකතුව	**233,323,036**	**222,883,642**	**-**	**222,883,642**
මුළු එකතුව	**325,836,839**	**292,596,221**	**2,676,244**	**289,919,977**

සටහන - 3.1

රජයේ ප්‍රදානය

විස්තරය	2017	2016
බලපත්‍ර ගාස්තු සඳහා රජයේ ප්‍රදානය	350,690,000	365,000,000
	350,690,000	**365,000,000**

ගුවන් විදුලි බලපත්‍රවලට හිලව් වශයෙන් ප්‍රදානයක් ලෙස රජයෙන් ලැබුණු රු. මිලියන 350.69

සටහන - 4

බෙදාහැරීමේ පිරිවැය

විස්තරය	2017	2016 ගලපන ලද	ගැලපුම	2016 අනුමත කරන ලද
බොල් හා අඩමාණ ණය සඳහා ප්‍රතිපාදනය	5,361,316	5,743,906		5,743,906
	5,361,316	**5,743,906**	**-**	**5,743,906**

සටහන - 5

අනෙකුත් මෙහෙයුම් පිරිවැය

විස්තරය	2017	2016 ගලපන ලද	ගැලපුම	2016 අනුමත කරන ලද
බාහිර ගුවන්විදුලි සංවිධාන සඳහා දායකත්වය	976,347	788,302		788,302
පුවත් සේවා සහ පුවත් සාරාංශය	213,650	954,240		954,240
වෙළෙඳ දැන්වීම් සහ ප්‍රචාරණය	710,130	910,724		910,724
විදුලිය සහ බලශක්තිය	4,872,410	5,793,040	460,585	5,332,455
තැපැල් ගාස්තු සහ දුරකථන	12,937,963	14,183,473		14,183,473
මුද්‍රණ සහ ලිපිද්‍රව්‍ය	3,673,618	3,835,166		3,835,166
මෝටර් රථ ධාවන වියදම්	13,318,357	13,123,058		13,123,058
ගුවන්විදුලි උපකරණ අලුත්වැඩියාව සහ නඩත්තුව	10,686,070	10,869,464		10,869,464
සංගීත උපකරණ අලුත්වැඩියාව සහ නඩත්තුව	5,550	140,000		140,000
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් අලුත්වැඩියාව සහ නඩත්තුව	5,065,010	3,957,408		3,957,408
ගොඩනැගිල්ල සහ උද්‍යානය නඩත්තුව සහ අලුත්වැඩියාව	18,256,946	9,158,706		9,158,706
ක්ෂය වීම	62,529,891	46,187,595	500,000	45,687,595
ක්ෂය වීම - ත්‍රිකුණාමලය	159,297,421	158,236,740		158,236,740
ත්‍රිකුණාමලය වියදම්	22,301,224	28,017,049		28,017,049
කැසට්පට් වියදම	423,842	-	-	-
බදුකරණය (ආ. සේ. ගාස්තු)	3,398,792	3,200,569	2,283,773	916,796
ජාතිය ගොඩනැගීමේ බදු වියදම්	10,484,554	9,477,157		9,477,157
වාහන කුලියට ගැනීම් ගාස්තු	605,350	3,152,698		3,152,698
මුද්දර බද්ද	66,665	46,550		46,550
ගුවන් විදුලි සංඛ්‍යාත ගාස්තු	6,422,076	9,713,193	-	9,713,193
	336,245,865	**321,745,130**	**3,244,358**	**318,500,772**

සටහන - 6

පරිපාලන පිරිවැය

විස්තරය	2017	2016 ගලපන ලද	ගැලපුම	2016 අනුමත කරන ලද
දීමනා - සභාපති සහ සාමාජිකයින්	1,507,320	977,000		977,000
වැටුප්, වේතන හා දීමනා	172,603,708	177,644,083		177,644,083
සේවක අර්ථසාධක අරමුදල	24,247,104	23,370,923		23,370,923
සේවක භාරකාර අරමුදල	4,942,682	4,965,963		4,965,963
කාර්ය මණ්ඩලය සඳහා අතිකාල	20,502,348	21,287,568		21,287,568
සහන කාර්ය මණ්ඩලය	11,900,981	11,556,015		11,556,015
කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය පඩිනඩි	40,589,644	37,881,678		37,881,678
කාර්ය මණ්ඩල පුහුණු ගාස්තු (දේශීය)	8,800	25,500		25,500
ගමන් සහ යැපුම් දීමනා (දේශීය සහ විදේශීය)	2,611,444	2,848,980		2,848,980
නිවාඩු දින ගෙවීම්	2,604,961	1,960,928		1,960,928
පාරිතෝෂික	25,814,868	21,300,257		21,300,257
සභාපති සංග්‍රහ වියදම්	439,876	472,773		472,773
අධ්‍යක්ෂ මණ්ඩල සංග්‍රහ වියදම්	101,605	104,740		104,740
සුභසාධනය	1,960,129	1,737,466		1,737,466
වෛද්‍ය සේවා	132,958	191,023		191,023
පොදු ගාස්තු	1,600,529	964,946		964,946
පුද්ගලික ආරක්ෂක සේවා	5,526,700	538,050		538,050
කුලී ගාස්තු සහ බදු	6,328,397	6,078,588		6,078,588
රක්ෂණ	3,401,400	443,912		443,912
විගණන ගාස්තු	550,000	550,000		550,000
නෛතික ගාස්තු	1,474,415	1,108,418		1,108,418
ප්‍රකාශන සහ වාර ප්‍රකාශන	416,400	692,063		692,063
පාරිතෝෂික, නඩු සහ වෙනත් කරුණු සහ දඩ	185,672	462,037		462,037
	329,451,940	**317,162,912**	**-**	**317,162,912**

6.1) 2017 වසරේ දී කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ ඥාතීන්ගේ මරණ දැන්වීම් ප්‍රචාරය කිරීම වෙනුවෙන් සංස්ථාව රු.680,938 ක වියදමක් දැරීය. මෙම දැන්වීම් ප්‍රචාරය කරනු ලැබූයේ බලාත්මක දැනට පවතින යෝජනා ක්‍රමය යටතේ ය. මෙය සෑම වසරක ම සංස්ථාව අනුගමනය කළ ක්‍රියාදාමයයි.

විභාග වෙමින් පවතින නඩු 2017

ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාග වෙමින් පවතින නඩු සංඛ්‍යාව දෙකකි. ඉන් එක් නඩුවක තත්වය පහත දැක්වෙන පරිදිය.

එය දිස්ත්‍රික් උසාවියේ පැමිණිලිකරුවෙකු වෙනුවෙන් නඩු ගාස්තු සමඟ රු. 10,000,000 ප්‍රදානය කරන ලෙස දිස්ත්‍රික් උසාවි නඩු අංක 23089/MR තීන්දුව ඉවත දමන ලෙස අයැදීමකි. මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක 64296 හි තීන්දුව ඉවත දමන මෙන් සංස්ථාව විසින් ගොනු කළ එක් නඩුවක් අභියාචනා අධිකරණයේ විභාග වෙමින් පවතී.

මහාධිකරණයේ නඩු පහක් විභාග වෙමින් පවතී. දිස්ත්‍රික් අධිකරණයේ නඩු දෙකක් විභාග වෙමින් පවතින අතර, ඉන් නඩු දෙකක තත්වය පහත දැක්වෙන පරිදිය.

ඉන් එක් නඩුවකින් පොලිය සමඟ රුපියල් මිලියන 08 ක් ඉල්ලා සිටින අතර, අනෙක් නඩුවෙන් පොලිය සමඟ රු.5,917,275 ක් සහ ඇමෙරිකානු ඩොලර් 26,775 කින් 10% ක් කොමිස් මුදලක් ඉල්ලා සිටියි.

සටහන - 7

මූල්‍ය පිරිවැය

විස්තරය	2017	2016 ගලපන ලද	ගැලපුම	2016 අනුමත කරන ලද
බැංකු ගාස්තු	458,770	461,014		461,014
අයිරා පොලී	5,425,308	4,600,117		4,600,117
විනිමය මත ලාභ / (අලාභ)	(2,952)	256,004		256,004
ණයවර කාඩ්පත් කොමිස් මුදල්	71,650	52,969		52,969
කල්බදු පොලිය	-	176,345		176,345
	5,952,777	**5,555,448**	**-**	**5,555,448**

සටහන - 8

8 (i) ආදායම් බදු

විස්තරය	2017	2016
ගිණුම් අනුව ශුද්ධ ලාභය / අලාභය	**(276,133,969)**	**(316,233,466)**
එකතු කළා :		
ආදායම් බදු අඩු කළ නොහැකි වියදම්		
ක්ෂය වීම්	62,529,891	46,187,595
ක්ෂය වීම් ත්‍රිකුණාමලය	159,297,421	158,236,740
බොල් ණය සඳහා ප්‍රතිපාදන	5,361,316	5,743,906
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	25,814,868	21,300,257
සංග්‍රහ	541,480	577,513
ආර්ථික සේවා ගාස්තු	3,398,792	916,796
	256,943,767	**232,962,807**
අඩු කළා :		
ආදායම් බදු අඩු කළ හැකි වියදම්		
ප්‍රාග්ධන දීමනාව	221,309,776	182,631,352
කල්බදු කුලී	-	4,885,634
පාරිතෝෂික ගොවීම්	42,492,960	19,039,367
	263,802,736	**206,556,353**
බදු අය කළ හැකි ලාභය / අලාභය	(282,992,938)	(289,872,012)
ඉදිරියට ගෙනා බදු අලාභ	(3,395,727,025)	(3,105,900,013)
ඉදිරියට රැගෙන ගිය මුළු බදු අලාභ	(3,678,719,963)	(3,395,727,025)
ආදායම් බදු සඳහා ප්‍රතිපාදනය		

ආදායමෙන් ව්‍යුත්පන්න වන ලාභය මත 28% ක අනුපාතයකට ආදායම් බදු සඳහා සංස්ථාව යටත් වේ. සංස්ථාව ගලපන ලද බදු අය කළ හැකි ලාභ හේතුකොට ගෙන ආදායම් බදු සැලකිල්ලට ගනිමින් මෙම මූල්‍ය ප්‍රකාශනයන් හි ප්‍රතිපාදනයක් සලසා ඇත.

8 (ii) විලම්භිත බදුකරණය ශ්‍රී.ල.ගි.ප්‍ර.12 ප්‍රකාරව විලම්භිත බදුකරණය පිළිගැනීම ගණනය කර සලකා බලයි.

විලම්භිත බදු වත්කම් සහ බැරකම්

විස්තරය	2017	2016
මූල්‍ය තත්වය		
විලම්භිත බදු බැරකම්	79,401,520	79,401,520
විලම්භිත බදු වත්කම්	(6,536,768)	(6,536,768)
ශුද්ධ විලම්භිත බදු වත්කම්	72,864,752	72,864,752
විස්තීර්ණ ආදායම් ප්‍රකාශය		
විලම්භිත බදු බැරකම්	8,431,518	8,431,518
විලම්භිත බදු වත්කම්	(5,258,882)	(5,258,882)
ශුද්ධ විලම්භිත ආදායම් බදු ආදායම / (වියදම)	3,172,636	3,172,636

සටහන - 9

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ දේපල, පිරියත හා උපකරණ

දළ ධාරණ මුදල පිරිවැයට	2017.01.01 දිනට ශේෂය (රු.)	එකතු කිරීම්/ පැවරුම් (රු.)	බැහැර කිරීම්/ පැවරුම් (රු.)	2017.12.31 දිනට ශේෂය (රු.)	ක්ෂයවීම සඳහා ප්‍රතිපාදනය 2017.01.01 (රු.)	කාලසීමාව සඳහා ගාස්තු (රු.)	පෙර වසරේ ගැලපුම් (රු.)	ක්ෂයවීම සඳහා ප්‍රතිපාදනය 2017.12.31 (රු.)	2017.12.31 දිනට ශු.පො.වි (රු.)
ඉඩම	7,764,234		(2,908)	7,761,326			-		7,761,326
ගොඩනැගිලි	173,629,897	209,408,759		383,038,656	129,375,673	6,820,256	-	136,195,929	246,842,727
පිරියත හා යන්ත්‍රෝපකරණ	641,774,226	6,832,192		648,606,419	488,618,372	8,664,777	-	497,283,149	151,323,270
සංගීත භාණ්ඩ	7,241,190	-		7,241,190	6,821,962	68,092	-	6,890,054	351,136
මෝටර් රථ වාහන	76,715,695	11,850	(22,613,870)	54,113,675	72,879,104	1,611,568	(22,613,870)	51,876,802	2,236,874
මූල්‍ය කල්බදු මත වත්කම - රථ වාහන						-	-		
ලී බඩු, සවිකිරීම්	133,786,196	10,551,425		144,337,621	115,456,415	4,251,804	-	119,708,219	24,629,402
තැටි හා පටි	24,924,749	63,500		24,988,249	24,888,820	40,472	-	24,929,292	58,957
ශ්‍රව්‍ය සංඛ්‍යානය	885,333,519	36,368,347		921,701,866	744,205,781	10,916,099	-	755,121,880	166,579,986
සම්ප්‍රේශක	1,509,832,026	23,464,431	(8,996,000)	1,524,300,457	991,446,361	23,860,412	-	1,015,306,773	508,993,684
පරිගණක උපකරණ	43,709,462	4,954,594		48,664,056	35,676,506	6,277,056	-	41,953,562	6,710,494
පුස්තකාල පොත්	451,590		(250)	451,340		-	-		451,340
සුළු මෙවලම්	146,384			146,384	118,086	19,354	-	137,440	8,943
	3,505,309,170	**291,655,099**	**(31,613,028)**	**3,765,351,240**	**2,609,487,080**	**62,529,891**	**(22,613,870)**	**2,649,403,100**	**1,115,948,140**

දේපල, පිරියත හා උපකරණ - ත්‍රීකුණාමලය

දළ ධාරණ මුදල පිරිවැයට	2017.01.01 දිනට ශේෂය (රු.)	එකතු කිරීම්/ පැවරුම් (රු.)	බැහැර කිරීම්/ පැවරුම් (රු.)	2017.12.31 දිනට ශේෂය (රු.)	ක්ෂයවීම සඳහා ප්‍රතිපාදනය 2017.01.01 (රු.)	කාලසීමාව සඳහා ගාස්තු (රු.)	පෙර වසරේ ගැලපුම් (රු.)	ක්ෂයවීම සඳහා ප්‍රතිපාදනය 2017.12.31 (රු.)	2017.12.31 දිනට ශු.පො.ව (රු.)
පිරියත හා යන්ත්‍රෝපකරණ	178,847,308		-	178,847,308	67,035,477	13,413,549	-	80,449,025	98,398,282.82
මෝටර් රථ වාහන	4,344,000	3,200,000	-	7,544,000	4,344,000	400,000	-	4,744,000	2,800,000.00
ලී බඩු, සවිකිරීම්	2,839,794		-	2,839,794	1,064,923	212,985	-	1,277,908	1,561,886.32
කාර්යාල උපකරණ	7,782,753		-	7,782,753	3,891,378	778,275	-	4,669,653	3,113,100.31
විදුලි ජනක යන්ත්‍ර	206,429,150		-	206,429,150	77,409,868	15,482,186	-	92,892,054	113,537,095.96
ශ්‍රව්‍ය සංඛ්‍යාත	53,354,383		-	53,354,383	19,246,348	4,001,579	-	23,247,927	30,106,456.17
සම්ප්‍රේෂක	1,502,945,613		-	1,502,945,613	552,660,901	112,720,921	-	665,381,822	837,563,790.83
පරිගණක උපකරණ	52,624,075		-	52,624,075	52,624,075	-	-	52,624,075	-
සුළු මෙවලම්	4,632,471		-	4,632,471	1,737,176	347,435	-	2,084,611	2,547,859.87
උපකරණ	159,206,556		-	159,206,556	59,419,140	11,940,492	-	71,359,632	87,846,924.36
	2,173,006,103	**3,200,000**	**-**	**2,176,206,103**	**839,433,285**	**159,297,421**	**-**	**998,730,706**	**1,177,475,396.64**

අස්පෘශ්‍ය වත්කම්

විස්තරය	2017.01.01 දිනට ශේෂය (රු.)	එකතු කිරීම්/ පැවරුම් (රු.)	බැහැර කිරීම්/ පැවරුම් (රු.)	2017.12.31 දිනට ශේෂය (රු.)	ක්ෂයවීම සඳහා ප්‍රතිපාදනය 2017.01.01 (රු.)	කාලසීමාව සඳහා ගාස්තු (රු.)	පෙර වසරේ ගැලපුම් (රු.)	ක්ෂයවීම සඳහා ප්‍රතිපාදනය 2017.12.31 (රු.)	2017.12.31 දිනට ශු.පො.ව (රු.)
පරිගණක මෘදුකාංගය - ත්‍රීකුණාමලය ව්‍යාපෘතිය	**12,124,157**	**1,435,500**	-	**13,559,657**	**12,124,157**	**184,438**	-	**12,308,595**	**1,251,063**

සටහන - 10

නොනිමි ප්‍රාග්ධන වැඩ

විස්තරය	2017	2016 ගලපන ලද	ගැලපුම	2016 අනුමත කරන ලද
නොනිමි ප්‍රාග්ධන වැඩ	54,762,028	187,241,019	(584,178)	187,825,197
	54,762,028	**187,241,019**	**(584,178)**	**187,825,197**

සටහන - 11

සංස්ථාව ලංකා පුවත් සමාගමේ රුපියල් මිලියන එකක් ආයෝජනය කරන ලදී.

ආයෝජන

විස්තරය	2017	2016
ලංකා පුවත් සමාගමේ ආයෝජනය	1,000,000	1,000,000

සටහන - 12

වෙළෙඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ

විස්තරය	2017	2016 ගලපන ලද	ගැලපුම	2016 අනුමත කරන ලද
ණයගැති ගුවන් කාලය	233,610,423	221,673,715	(1,490,694)	223,164,409
අඩුකළා : මූල්‍ය වත්කම් හානි	(112,091,242)	(109,557,306)		(109,557,306)
කාර්ය මණ්ඩල සඳහා ණය	3,324,093	3,104,409	(4,011,805)	7,116,214
කාර්ය මණ්ඩල සඳහා අනෙකුත් අත්තිකාරම්	1,010,767	360,061	(7,684,737)	8,044,798
කාර්ය මණ්ඩල ණයගැතියෝ සේ. අ. අ.	283,755	306,530		306,530
පූර්ව ගෙවීම්	-	1,071,399		1,071,399
සැපයුම්කරුවන් සඳහා අත්තිකාරම් ගෙවීම	4,408,911	8,000,713		8,000,713
විවිධ ණයගැතියෝ	20,250,728	19,138,364	(3,613,149)	22,751,513
P.M.G ජංගම ගිණුම - අවමංගල්‍ය දැන්වීම්	-	0	(7,997,854)	7,997,854
ලක්හඬ ශාඛා ගිණුම්	12,807,862	12,807,862		12,807,862
G.S.T. පාලන ගිණුම	237,267	237,267		237,267
ලැබිය යුතු ආදායම (වෙනත්)	44,079,742	41,475,962	1,898,618	39,577,344
රඳවා ගැනීමේ බද්ද (ආදායම)	33,874,191	33,499,303		33,499,303
P.M.G ජංගම ගිණුම ගුවන්විදුලි බලපත්‍ර ගාස්තු	-	0	(195,700)	195,700
අනෙකුත් තැන්පතු	9,362,462	9,357,462		9,357,462
	251,158,960	**241,475,741**	**(23,095,321)**	**264,571,062**

සටහන - 13

මුදල් සහ මුදලට සමාන දෑ

විස්තරය	2017	2016 ගලපන ලද	ගැලපුම	2016 අනුමත කරන ලද
ලංකා බැංකුව - මාතර	18,878	48,457		48,457
මහජන බැංකුව ජාත්‍යන්තර අංශය	53,466,272	190,426		190,426
ලංකා බැංකුව - ටොරින්ටන් - ප්‍රධාන ගිණුම	(5,699,421)	21,118,762		21,118,762
ස්ටේට් බෑන්ක් ඔෆ් ඉන්ඩියා	402,609	402,609		402,609
ලංකා බැංකුව - අනුරාධපුර	-	(18,590)		(18,590)
ලංකා බැංකුව - මහනුවර	249,773	(290,954)		(290,954)
නේෂන්ස් ට්‍රස්ට් බැංකුව	11,175,433	16,392,792		16,392,792
ලංකා බැංකුව - ටොරින්ටන් - ගුවන්විදුලි බලපත්‍ර ගිණුම	31,999,146	8,527,932		8,527,932
ලංකා බැංකුව - ටොරින්ටන් - එෆ්.එම්. ව්‍යාපෘතිය	27,088	27,088		27,088
මුදල් අග්‍රිමය	111,708	88,577		88,577
ලංකා බැංකුව - ටොරින්ටන් - කැසට් අලෙවිය	7,886,948	13,188,431		13,188,431
ලංකා බැංකුව - මදුරාසිය	1,610,446	1,164,445		1,164,445
මුදල් පොත - ත්‍රිකුණාමල ව්‍යාපෘතිය	33,970,423	47,321,241		47,321,241
ලංකා බැංකුව - ඉතුරුම්	96,394	92,621		92,621
ස්ථාවර තැන්පතු	63,368,597	58,499,697		58,499,697
සැනසුම	15,053	60,053		60,053
ගිණුම් ආන්තිකය (මහජන බැංකුව)	153,019,572	153,472,508		153,472,508
	351,718,918	**320,286,094**	**-**	**320,286,094**

සටහන - 14

රඳවා ගත් ඉපැයුම්

විස්තරය	2017	2016
ආරම්භක ශේෂය	**(108,694,335)**	**(126,541,868)**
2016 ට පෙර ආදායම් සංචිතය		
+ ගැලපුම	42,026,922	(31,817,813)
(-) ගැලපුම	(8,015,353)	47,985,402
විස්තීර්ණ ආදායම	**71,383,395**	**(53,537,552)**
	(32,761,032)	**55,217,495**
එකතුව	**(36,060,404)**	**(108,694,335)**

සටහන - 15

වෙළෙඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ

විස්තරය	2017	2016 ගලපන ලද	ගැලපුම	2016 අනුමත කරන ලද
ණයහිමියාගේ ගුවන් කාලය විකිණීම	12,749,748	5,075,315	(165,537)	5,240,852
ආපසු ගෙවන විවිධ තැන්පතු	5,458,716	4,680,695		4,680,695
උපචිත වියදම්	240,372,845	232,503,730	5,846,709	226,657,021
සේ.අ.අ.	3,744,899	3,513,074		3,513,074
විවිධ ණයහිමියෝ	2,869,945	7,275,313	562,500	6,712,813
ජංගම ගිණුම - කලාපීය	354,980	21,500	21,500	
ආරක්ෂක තැන්පතුව	566,754	576,347		576,347
සැනසුම - සුනාමි	15,053	60,053		60,053
O. P. සඳහා පුහුණු පාඨමාලාව - කොත්මලේ ඇකඩමිය	-	590,283		590,283
ණයහිමි පාලන ගිණුම	-	3,438,710		3,438,710
රජරට සංචාරක බංගලාව	202,285	112,384		112,384
	266,335,226	**257,847,404**	**6,265,172**	**251,582,232**

සටහන - 16

මූල්‍ය නොවන බැරකම්

විස්තරය	2017	2016 ගලපන ලද	ගැලපුම	2016 අනුමත කරන ලද
ජා.ආ.බ.	15,007,806	15,007,806		15,007,806
ජාතිය බේරාගැනීමේ අරමුදල	(12,418)	(12,418)		(12,418)
ආදායක බද්ද	102,229	149,526		149,526
වැට් පාලන ගිණුම	42,176,103	46,477,679		46,477,679
ආ.සේ.ගා.	53,563,211	55,785,351	2,283,773	53,501,578
ජා.ගො. බද්ද	30,327,431	53,794,953		53,794,953
ජාතික ආරක්ෂක අරමුදල	2,835	2,835		2,835
ආදායම් බද්ද සඳහා ප්‍රතිපාදනය	692,759	692,759		692,759
දේ. ආ. බ. දෙ. ට ගෙවිය යුතු ආදායම් බදු	100	100		100
	141,860,056	**171,898,592**	**2,283,773**	**169,614,819**

සටහන - 17

තොග

විස්තරය	2017	2016
තොග කැසට් සහ සංයුක්ත තැටි	3,729,602	3,536,443
පාරිභෝජ්‍ය අයිතම	23,947,730	22,371,290
	27,677,332	**25,907,733**

2017 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය පිළිබඳ විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } එම්ඊඩී/ඒ/එස්එල්බීසී/1/17/477 මෙහි අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2018 නොවැම්බර් 19 දින.

සභාපති,

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1966 අංක 37 දරන ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පනතේ 27 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 –1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත දැක්වෙන අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01

ප්‍රමිතයේ 15 ඡේදය පරිදි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රාජ්‍ය ප්‍රදාන, නිමිකම් යටතේ වෙනම අයිතමයක් ලෙස හඳුනාගත යුතු වුවද, ජර්මන් රජයේ ප්‍රදාන රු.1,128,190,137 ක්, ජපන් ප්‍රදාන රු.70,849,537 ක් හා රාජ්‍ය ප්‍රදාන රු.863,445,527 ක් ජංගම නොවන වගකීම් යටතේ දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19

(i) පශ්චාත් සේවක ප්‍රතිලාභ වගකීම ඇස්තමේන්තු කිරීම සඳහා පුරෝකථනය කල ඒකක බැර ක්‍රමය භාවිතා කරන බව සඳහන් කර තිබුණද, ප්‍රමිතයෙහි 75 ඡේදය පරිදි යොදාගත් ආයුගණක උපකල්පන හෙලිදරව් කර නොතිබුණු අතර වර්ෂයට අදාල ආයුගණක ලාභයක් හෝ අලාභයක් හඳුනාගෙන නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 83 ඡේදය ප්‍රකාරව සේවාවෙන් පසු ප්‍රතිලාභ වට්ටම් කිරීම සඳහා භාණ්ඩාගාර බැඳුම්කර අනුපාතය පදනම්ව වට්ටම් අනුපාතය තීරණය කළයුතු වුවද, සංස්ථාව විසින් කිසිදු පදනමකින් තොරව සියයට 11 ක් ලෙස වට්ටම් අනුපාතය යොදාගෙන තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 21

(i) ප්‍රමිතයේ 23 (අ) ඡේදය ප්‍රකාරව 2007 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා සංස්ථාවේ විදේශ ණයගැතියන් ප්‍රමාණය වූ එක්සත් ජනපද ඩොලර් 20,035 ක් හා ඉන්දියානු රුපියල් 3,346 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති විනිමය අනුපාතය මත පරිවර්තනය කර රු. 3,070,427 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වනු වෙනුවට ණය ගැතියන් ඇති වූ වර්ෂයේ අවසාන දිනට පැවති විනිමය අනුපාතය මත පරිවර්තනය කර දැක්වීම නිසා සමාලෝචිත වර්ෂයේ විදේශ ණයගැතියන් රු.417,416 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ii) ප්‍රමිතයේ 23 (අ) ඡේදය ප්‍රකාරව විදේශ මුදලින් පවත්නා මූල්‍යමය අයිතම වාර්තා කරන කාලපරිච්ඡේදය අවසානයේ පවතින විනිමය අනුපාතය මත පරිවර්තනය කළයුතු වුවත් ලංකා බැංකුවේ චෙන්නායි බැංකු ගිණුමෙහි පවත්නා ශේෂය වන ඉන්දියානු රු.676,658 ක මුදල 2017 දෙසැම්බර් 31 වන දින විනිමය අනුපාතය වූ ඉන්දියානු රුපියලකට ශ්‍රී ලංකා රුපියල් 2.3854 මත පරිවර්තනය නොකිරීම නිසා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි එම ශේෂය රු.3,654 ක් අඩුවෙන් දක්වා තිබුණි. ඉහත කරුණු හේතුවෙන් හඳුනා ගත යුතු කාලච්ඡේදය සඳහා වූ විදේශ විනිමය විචලන වාසිය වූ රු.3,654 ක අගය ලාභය ගණනය කිරීමේදී හඳුනාගෙන නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 7 හි 7 ඡේදය හා ආයතනය විසින් හඳුනාගෙන ඇති ප්‍රතිපත්තිය අනුව ආයෝජන අත්පත් කරගත් දින සිට පරිණත වීමට ගතවන කාලය මාස 03 කට අඩු ආයෝජන පමණක් මුදල් හා මුදල් සමාන දෑ යටතේ දැක්විය හැකි වුවත් මාස 03 කට වඩා පරිනත කාලයක් ඇති රු.63,368,597 ක් වටිනා ස්ථාවර තැන්පතු 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුදල් හා මුදල්වලට සමාන අයිතම ලෙස දක්වා තිබුණි.

(ආ) ආයතනය විසින් හඳුනාගෙන ඇති ප්‍රතිපත්තිය අනුව බැංකු අයිරාව ණය මුදලක් ලෙස සලකා ජංගම වගකීම් යටතේ දැක්විය යුතු වුවත් ඊට පටහැනි ලෙස සමාලෝචිත වර්ෂය අවසානයේ පැවති බැංකු අයිරාව වූ රු.5,699,421 ක් මුදල් හා මුදල් සමාන අයිතම යටතේ සෘණ අගයක් ලෙස දක්වා තිබීම හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් හා ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සය මාසිකව කල් පිරෙන ස්ථාවර තැන්පතු 04 කට අදාළව ලැබිය යුතු පොලී ආදායම ගණනය කිරීමේදී අර්ධ වාර්ෂික පොලී අනුපාතය යොදා ගැනීම වෙනුවට වාර්ෂික පොලී අනුපාතය භාවිතා කිරීම හේතුවෙන් පොලී ආදායම හා ලැබිය යුතු පොලී ආදායම රු.344,481 කින් අධි තක්සේරු වී තිබුණි.

(ආ) සංස්ථාවට අයත් සීදුව පිහිටි ඉඩමෙන් කොටසක් 2005 වර්ෂයේදී විකිණීම මත ඇතිවූ රු.19,997,092 ක් වූ ප්‍රාග්ධන ලාභය රඳවා ගත් ඉපයීම් ගිණුමට බැර කිරීම වෙනුවට ප්‍රාග්ධන සංචිත ගිණුමට බැර කර තිබුණි.

(ඇ) මැනුම් කටයුතුවලදී භාවිතා කරන පිරිවැය රු.425,000 ක් වටිනා පවර් ලොගර් නම් වූ උපකරණය, 2016 වර්ෂයේදී අස්ථානගත වී තිබුණ ද යන්ත්‍ර හා උපකරණ ගිණුමෙන් ඉවත් කිරීමට විගණිත දිනය වූ 2018 සැප්තැම්බර් 3 දින දක්වාම කටයුතු නොකිරීමෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට යන්ත්‍ර හා උපකරණ ගිණුමේ දැක්වෙන ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) 1979 වර්ෂයේදී බද්දට ලබාගත් ගොඩනැගිල්ලේ අයිතිය වෙනුවෙන් මාර්ක්ෆේඩ් ආයතනයට ගෙවන ලද රු.250,000 ක මුදල ගොඩනැගිලි ගිණුමට හර කර තිබුණි. එම බදු ගිවිසුම 2015 ජූනි 01 දින අවසන් වී එහි අයිතිය නැවත නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් වෙත පැවරී තිබුණ ද ගොඩනැගිලි ගිණුමෙන් එම වටිනාකම සහ අදාළ ක්ෂය වෙන් කිරීම් ඉවත් කිරීමට කටයුතු නොකිරීමෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31

දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගොඩනැගිලි අගය එම වටිනාකමෙන් සහ ක්ෂය වෙන් කිරීම රු.250,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) 2017 වසරට අදාළ ජාතිය ගොඩනැගීමේ බද්ද ගණනය කිරීමේදී සැලකිල්ලට ගතයුතු බද්දට යටත් මුළු ආදායම රු.536,777,714 ක් වුවත්, සංස්ථාව විසින් රු.524,226,609 ක් පමණක් සැලකිල්ලට ගැනීම හේතුවෙන් 2017 වසරට ජාතිය ගොඩනැගීමේ බදු රු.251,022 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) එකතු කළ අගය මත බදුවලට යටත් වන ආදායම ගණනය කිරීමේදී රු.5,722,380 ක් වූ වාහන 04 ක් විකිණීමේ ආදායම සැලකිල්ලට ගෙන නොතිබීම හේතුවෙන් 2017 වසරේ සැප්තැම්බර් මාසයට අදාළ එකතු කළ අගය මත බදු ගෙවීම් රු.858,357 කින් අඩුවෙන් ගෙවා තිබුණි. මෙම වාහන කල්බදු ක්‍රමය යටතේ මිලදී ගැනීමේදී යෙදවුම් මත බද්ද ප්‍රතිපූර්ණය කරගෙන තිබූ ඒවා විය.

(උ) රාජ්‍ය බැංකු ජංගම ගිණුමක් සඳහා පිළියෙල කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශනයේ 2017 දෙසැම්බර් 31 දිනට බැංකුවේ තැන්පත් නොකර අත රැඳි රු.122,529 ක් අතැති මුදල් (Cash in hand) ගිණුමකට හර කර දැක්වීම වෙනුවට බැංකුවේ තැන්පත් කරන ලද මුදල් ලෙස මුදල් පොතේ සටහන් කර බැංකු සැසඳුම තුළ උපලබ්ධි නොවූ තැන්පතු ලෙස දක්වා තිබුණි.

(ඌ) 1959 මැයි 29 දින අත්පත් කරගත් ඉඩමක් 2009 වසරේදී ක්‍රීඩාංගනයක් සඳහා හෝමාගම ප්‍රාදේශීය ලේකම් වෙත පවරා දී රු.186,563 ක් වූ පොත් වටිනාකම සහ එහි පිහිටි රු.247,441ක් වූ ගොඩනැගිලි වටිනාකම හා එම ගොඩනැගිල්ලට අදාළ රු.235,069 ක ගොඩනැගිලි ක්ෂය වෙන්කිරීම් පොත් වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(එ) ත්‍රිකුණාමල ප්‍රතිවිකාශනාගාර විකුණුම් ආදායමට අයත් රු.22,301,224 ක විකුණුම් පිරිවැය වෙනත් මෙහෙයුම් වියදම් යටතේ දැක්වීම නිසා 2017 වසරේ දල ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඒ) සංස්ථාව විසින් දීර්ඝ කාලීන කල්බදු ක්‍රමයට විවිධ රාජ්‍ය ආයතනවලින් ලබා ගෙන තිබූ ඉඩම් වෙනුවෙන් රජයට ගෙවිය යුතු රු.122,614,833 ක් ගිණුම් ගතකර නොතිබුණි.

2.2.4 අසම්භාව්‍ය බැරකම්

පැමිණිලි පාර්ශවයට රු.මිලියන 10 ක්,රු.1,783,587 ක් හා රු.80,311 ක් ගෙවීමට නියෝග කරන ලද නඩු තීන්දු තුනට එරෙහිව සංස්ථාව විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට, අභියාචනාධිකරණයට හා මහාධිකරණයට අභියාචනා කර ඇති නමුත් එම නඩු වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

2.2.5 නොසැසඳූ පාලන ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද ගුවන් කාල ණයහිමි උපලේඛනවල දැක්වෙන ශේෂය රු.12,824,165 ක් වුවද, ගිණුම් අංශයේ ගුවන් කාල ණයහිමි පාලන ගිණුමේ ශේෂය රු.12,749,748 ක් විය. ඒ අනුව ගුවන් කාල ණයහිමි පාලන ගිණුමේ ශේෂය හා ණය හිමි උපලේඛනවල ශේෂ අතර රු.74,417 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද ගුවන් කාල ණයගැති උපලේඛනවල දැක්වෙන ශේෂය රු.226,557,638 ක් වුවද, ගිණුම් අංශයේ ගුවන් කාල ණයගැති පාලන ගිණුමේ ශේෂය රු.233,214,273 ක් විය. ඒ අනුව ණයගැති පාලන ගිණුමේ ශේෂය හා ණයගැති උපලේඛනවල ශේෂ එකතුව අතර රු.6,656,635 ක වෙනසක් නිරීක්ෂණය විය.

2.2.6 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විදේශ වෙළඳ ණයගැතියෝ සහ ලැබිය යුතු තැන්පතුවලට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය හා විගණනය වෙත ලබාදුන් උපලේඛන අනුව ශේෂය සැසඳීමේදී එකතුව රු.35,720,721 ක හඳුනා නොගත් ශේෂ ඇතුළත් කර එම උපලේඛන අනුව ශේෂ මූල්‍ය ප්‍රකාශනවල ශේෂයන්ට සමාන කර ඉදිරිපත්කර තිබුණි.

(ආ) 2016 වර්ෂයේ ඉන්දියානු රාජ්‍ය බැංකු ගිණුම සම්බන්ධව සිදුකළ විගණනයේදී බැංකු ශේෂ තහවුරු කිරීම් අනුව අදාළ බැංකු ගිණුමේ ශේෂය ඉන්දියානු රු.179,278 ක් වූ අතර, සංස්ථාවේ ගිණුම් අනුව එම ශේෂය ඉන්දියානු රු.182,176 ක් විය.

2.2.7 විගණනය සඳහා සාක්ෂි නොවීම

ගිණුම්වල වූ පහත දැක්වෙන එක් එක් වත්කම්, වගකීම් හා ගෙවීම්වලට අදාළව ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

	ගිණුම් විෂයය	වටිනාකම	ඉදිරිපත් නොවූ සාක්ෂි
		රු.	
(අ)	ඉඩම්	7,764,234	ස්ථාවර වත්කම් ලේඛනය, භෞතික සත්‍යාපන වාර්තා
(ආ)	ගොඩනැගිලි	168,923,977	භෞතික සත්‍යාපන වාර්තා, ස්ථාවර වත්කම් ලේඛනය, විදේශීය රට වලින් පරිත්‍යාග වශයෙන් ලැබුණු වත්කම් පිළිබඳ ලිපිගොනු
(ඇ)	ප්‍රධාන කාර්යාලීය නව ගොඩනැගිල්ල	189,338,449	ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාළ අනුමත සැලැසුම, වියදම් ඇස්තමේන්තු, කළ වැඩ සහතික කිරීම්, ඉන්වොයිස් පත්
(ඇ)	ලක්හඬ ශාඛා වෙළඳ ණයගැනියෝ	12,807,802	ලිපි ගොනු විස්තර හා වටිනාකම සෑදී ඇති ආකාරය දැක්වෙන උපලේඛන
(ඉ)	ගෙවීම්	33,613,157	ගෙවීම්වලට අදාළ වවුචර් 45 ක්
(ඊ)	ඉන්දියානු රාජ්‍ය බැංකු ගිණුම් ශේෂය	182,176	ශේෂ තහවුරු කිරීම.
		412,629,795	

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විදුලි සංදේශ නියාමන කොමිෂමට ගෙවිය යුතු එකතුව රු.149,420,035 ක් වූ ශේෂය තුළ 1981 සිට එනම් වසර 36 ක කාලයක සිට නිරවුල් කිරීමකින් තොරව පවතින ශේෂ පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.62,267,095 ක් වූ විදේශීය ණයගැති ශේෂ තුල ඇතුලත් රු.59,692,746 ක් වූ වර්ෂ 10 කට වඩා පැරණි ණය නිරවුල් කර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතු වටිනාකම රු. 82,612,880 ක් වූ වෙළෙඳ ණයගැතියන් 136 දෙනෙකු වෙත ශේෂ සනාථ කිරීමේ ලිපි යවා තිබූ අතර, ඉන් රු.1,063,687 ක් වටිනා ණයගැතියන් හත්දෙනෙකු පමණක් පිළිතුරු එවා තිබූ අතර, එම ණයගැතියන් විසින් සංස්ථාවට ගෙවීමට ණය ශේෂ නොමැති බව සනාථ කර තිබුණි.

2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව	අනුකූල නොවීම
(අ) 2013 අප්‍රේල් 30 දිනෙන් සංශෝධිත 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත	මෙම පනතේ 4(i) , (ii) වගන්ති අනුව ජාතිය ගොඩනැගීමේ බදු ගෙවීමේදී අදාළ මාසයේ බදු ඊළඟට එළඹෙන මාසයේ 20 දින හෝ ඊට පෙර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු අතර, පනතේ 8 (ඩී) වගන්තිය අනුව ඒ ඒ කාර්තුවට අදාළ බදු වාර්තා ඊළඟට එළඹෙන කාර්තුවේ 20 දින

		හෝ එදිනට ප්‍රථම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට යැවිය යුතුය. නමුත් සංස්ථාව සෑම මසකම ජාතිය ගොඩනැගීමේ බදු ගෙවා තිබුණේ ගෙවිය යුතු දිනට මාස 02 ක්ද ඉක්මවීමෙන් පසුවය. එමෙන්ම කාර්තුමය බදු වාර්තාද දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට නියමිත දින යවා නොතිබුණි.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
	(i) මුදල් රෙගුලාසි 177	ගිණුමේ 2017 දෙසැම්බර් 31 දිනට හඳුනා නොගත් රු.1,002,063 ක් වූ මුළු සෘජු හර කිරීම් 2018 මැයි 31 දින විටත් නිරවුල් කර නොතිබුණි. එම ශේෂය තුළ 2016 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එනු ලබන රු.49,318 ක ශේෂයක්ද විය.
	(ii) මුදල් රෙගුලාසි 396 (ii), (iii)	2018 මැයි 31 දින වන විට වලංගු කාලය අවසන් වී තිබූ මාස 06 ඉක්ම වී තිබූ නමුත් ගෙවීමට බැංකුවට ඉදිරිපත් නොකළ රු.918,136 ක් වටිනා චෙක්පත් 23 ක් සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි.
(ඇ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ඡේදය (අ),(ආ) වගන්ති	ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළයුතු අතර, අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු, ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මේ ලැයිස්තුගත කර තිබිය යුතු වුවද සංස්ථාව විසින් 2017 වර්ෂය සඳහා පමණක් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර තිබුණි.

(ඇ)	1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය 3 වැනි උපලේඛනය 2.11 ඡේදය	චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කර නොතිබුණු අතර ඒ වෙනුවට පරිගණකය මඟින් ස්ථාවර වත්කම් ලොඛණයක් පවත්වාගෙන ගොස් තිබුණද එම ස්ථාවර වත්කම් ලේඛනයේ ඉඩම්, ගොඩනැඟිලි, වාහන,විදුලි උත්පාදන යන්ත්‍ර(ජෙනරේටර්), ට්‍රාන්ස්මීටර් වැනි වැදගත් අයිතම රාශියකට අදාළ විස්තර අන්තර්ගත කර නොතිබුණි.
(ඉ)	2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය	පරිගණක, උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යා යුතු වුවත් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.
(ඊ)	2003 ජූනි 02 දිනැති පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	
	(i) 7.2 ඡේදය	2017 දෙසැම්බර් 31 දිනට රු.27,677,392 ක අගයක් තොග වශයෙන් පවතින සංස්ථාව විසින් තොග වාර්තා නඩත්තු කරනුයේ පොත් පත් භාවිතයෙන් පමණක් (manually) වන අතර, අදාළ රෙගුලාසිය ප්‍රකාර පරිගණකගත ගිණුම් පද්ධතියක් හෝ අවම වශයෙන් පැතුරුම්පත් පැකේජ (MS-Excel වැනි) හෝ භාවිතයෙන් තොග වාර්තා පවත්වා ගැනීමක් සිදු නොකෙරෙන බැවින් අවසන් තොග වාර්තා ලබාගැනීමට සැලකිය යුතු කාලයක් ගත වන බව නිරීක්ෂණය විය.
	(ii) 7.4.5 වගන්තිය	සංස්ථාව විසින් වාර්ෂිකව කමිටු පත් කර සෑම ස්ථාවර වත්කමකම භෞතික පැවැත්ම සත්‍යාපනය කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ වාහන භෞතිකව සත්‍යාපනය කර නොතිබුණි.

(උ)	2015 මැයි 25 දිනැති අංක පීඊඩී 01/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	(i)	නිල වාහන හෝ වාහන දීමනා සඳහා හිමිකාරත්වයක් ලැබීමට නම් එම පුද්ගලයා 2006 වසරේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ අංක එම්එස්ඩී 03 ප්‍රකාරව HM 1-1 සනය හෝ ඊට ඉහළ මට්ටමේ තනතුරක් දරන නිලධාරියකු විය යුතු මුත්, දැනට සංස්ථාවේ එම වැටුප් තලයට අන්තර්ග්‍රහනය කර නොමැති අධ්‍යක්ෂවරුන්ට 2017 දෙසැම්බර් 01 සිට මසකට රු.20,000 ක ප්‍රවාහන දීමනාවක් ගෙවා තිබුණි.
		(ii)	මෙම දීමනාව ගෙවූ අය අතර වැටුප් තලයට අන්තර්ග්‍රහනය කිරීමට සුදුසුකම් සපුරා නොමැති සහ ව්‍යාජ අධ්‍යාපන සහතික ඉදිරිපත් කර තිබූ දැනට අධ්‍යක්ෂ තනතුරේ කටයුතු කරමින් සිටින අධ්‍යක්ෂවරයකුද වන බව නිරීක්ෂණය විය.
(ඌ)	2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2 ඡේදය		අබලන් වූ වාහන හඳුනාගෙන අපහරණය කිරීම සඳහා කටයුතු කළයුතු නමුත් වසර 2 සිට වසර 10 ක් දක්වා අබලන්ව ධාවනයෙන් ඉවත් කර තිබෙන ප්‍රත්‍යාගණන අගය රු.1,300,000 ක් වූ වාහන 2 ක් සහ පිරිවැය හඳුනාගත නොහැකි වාහනයක් චක්‍රලේඛ ප්‍රකාරව අපහරණය කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.71,383,395 ක ලාභයක් වූ අතර, එයට අනුරූපීව ඉකුත් වසරේ ලාභය රු.55,217,495 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.16,165,900 ක වර්ධනයක් එනම් සියයට 29 ක වර්ධනයක් පෙන්නුම් කරයි. වෙනත් මෙහෙයුම් ආදායම් රු. 22,801,224 කින් එනම් සියයට 33 කින් වැඩි වීම ශුද්ධ ලාභය වැඩි වීමට ප්‍රධාන හේතුවක් වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂය හා 2014 වර්ෂයන්හීදී ශුද්ධ අලාභයක් ඇතිවී තිබූ අතර, 2015, 2016 හා සමාලෝචිත වර්ෂවලදී ශුද්ධ ලාභයක් ඇතිවී තිබුණි. මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී 2016 වර්ෂයේදී රු.813,039,252 ක් වූ දායකත්වය 2017 වසරේදී රු.812,076,634 ක් දක්වා අඩුවී තිබුණි.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ ගිණුම්වල දැක්වෙන සංඛ්‍යාත්මක අගයන් අනුව ජංගම අනුපාතය හා ක්ෂණික අනුපාතය පිළිවෙලින් 1.77 ක් හා 1.71 ක් වුවද ජංගම වත්කම්වල ඇතුළත් ණයගැතියන් තුළ වර්ෂ 02 සිට වර්ෂ 42ක් දක්වා වූ පැරණි දේශීය ණයගැති ශේෂ රු. 53,413,844 ක් හා විදේශීය ණයගැති ශේෂ රු.61,918,484 ක් ඇතුළත් වීමෙන් ණය අයකර ගැනීමේ හැකියාවක් සහ ද්‍රවශීලතාවයක් නොපවතින බව නිරීක්ෂණය විය.

(ආ) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ දළ ලාභ අනුපාතය සියයට 6.24 සිට සියයට 10.81 දක්වා වැඩි වී තිබූ අතර, ත්‍රිකුණාමල විකාශනාගාරයේ විකුණුම් ආදායමට අදාළ විකුණුම් පිරිවැය අනෙකුත් මෙහෙයුම් පිරිවැය යටතේ දක්වා තිබීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) පෙර වසර සමඟ සැසඳීමේදී ශුද්ධ ලාභ අනුපාතය සියයට 8.3 සිට සියයට 10.82 දක්වා වැඩි වී තිබූ අතර, පසුගිය වර්ෂයට සාපේක්ෂව අනෙකුත් විවිධ ආදායම් වැඩි වී තිබීම මෙයට හේතු වී තිබුණි.

3.3 සංස්ථාවට එරෙහිව හෝ සංස්ථාව විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධීන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පීපල්ස් ට්‍රස්ට් ක්‍රෙඩිට් ඉන්වෙස්ට්මන්ට් සමාගමෙන් සංස්ථාවේ ප්‍රචාරණය කරන ලද වැඩසටහන් සඳහා ලැබිය යුතු රු.150,000 අයකර ගැනීම සඳහා එම ආයතනයට එරෙහිව කොළඹ දිසා අධිකරණයේ නඩු පවරා තිබුණ ද, චිත්තිකරු පදිංචි ස්ථානය හැර ගොස් තිබීම හේතුවෙන් නඩුව පවත්වාගෙන යාමට නොහැකි වීම නිසා වසර 02 කට වැඩි කාලයක් අධිකරණය විසින් නඩුව බහා තිබුණි.

(ආ) ලංකා සිමෙන්ති සමාගමේ වැඩසටහන් ප්‍රචාරණය කිරීම වෙනුවෙන් සංස්ථාවට ලැබිය යුතු රු.471,715 ක් අයකර ගැනීම සඳහා එම ආයතනයට එරෙහිව සංස්ථාව විසින් කොළඹ දිසා අධිකරණයේ නඩු පවරා තිබුණ ද රිට් ආඥාවක් ගැනීමට චිත්තිකරුගේ වත්කම් ඉදිරිපත් කරන ලෙස අධිකරණයෙන් කරන ලද නියෝගයට අනුව සමාගමේ වත්කමක් පිළිබඳ විස්තර ඉදිරිපත් කිරීමට සංස්ථාව ක්‍රියා නොකිරීම නිසා වසර 02 කට වැඩි කාලයක් අධිකරණය විසින් නඩුව බහා තිබුණි.

(ඇ) අලෙවි විධායක නිලධාරියකු විසින් අවස්ථා 02 කදී සිදුකරන ලද වංචා හේතුවෙන් රු.4,716,813 ක් හා රු.7,551,750 ක් වූ මුදල් අයකර ගැනීම සඳහා සංස්ථාව විසින් කොළඹ දිසා අධිකරණයේ සහ කොළඹ පළාත්බද මහාධිකරණයේ නඩු 02 ක් පවරා තිබුණ ද චිත්තිකරු පදිංචි ස්ථානය හැර ගොස් ඇති නිසා ඉහත නඩු වසර 03කට වැඩි කාලයක් විභාගයට නොගෙන බහා තිබුණි.

(ඈ) ගිරාඳුරුකෝට්ටේ ප්‍රජා ගුවන් විදුලියේ සේවිකාවකට අර්ථසාධක මුදල් නොගෙවීමට එරෙහිව කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ පවරා තිබූ නඩුවේ තීන්දුවෙන් රු.80,311 ක දායක මුදල් සහ අධිභාරය ලෙස රු.80,311 ක් ගෙවන ලෙස දුන් නියෝගයට

එරෙහිව සංස්ථාව විසින් කොළඹ පළාත්බද මහාධිකරණයට අභියාචනය කර තිබූ අතර, මෙම නඩුව වෙනුවෙන් නඩු ගාස්තු සඳහා පමණක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු.245,000 ක් එනම් ගෙවිය යුතුව තිබූ වන්දි මුදල මෙන් තුන් ගුණයකටත් වැඩියෙන් ගෙවා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 සැලසුම් කිරීම

(අ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4(6) වගන්තියට අනුව ක්‍රියාකාරී සැලැස්ම සමඟ ඉදිරිපත් කළයුතු අභ්‍යන්තර විගණන සැලැස්ම ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 වගන්තිය ප්‍රකාරව 2017-2019 කාලපරිච්ඡේදය වෙනුවෙන් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. විගණනය වෙත ඉදිරිපත් කරන ලද්දේ 2012-2016 කාලපරිච්ඡේදය සඳහා වූ සංයුක්ත සැලැස්මය.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාව විසින් 1974 වර්ෂයේ සිට මිලදී ගත් වත්කම්වලින් විකුණා හෝ භාවිතයෙන් ඉවත් කර තිබුණු වත්කම්වල පිරිවැය හඳුනාගත හැකි ආකාරයට ලේඛන නඩත්තු නොකිරීම නිසා එකී වත්කම්වල පිරිවැය ගිණුම් වලින් ඉවත් කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ස්ථාවර වත්කම් ශේෂය හා භෞතිකව ආයතනයේ පවතින වත්කම්වල වෙනස්කම් නිරීක්ෂණය වූ අතර මෙම තත්ත්වය නිවැරදි කිරීම සඳහා වගකිව යුතු පාර්ශවයන් වාර්තාවේ දින දක්වාම ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) ගබඩා අංක 02 හි විගණනයට ලබාදුන් තොග සමීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව භාවිතයට නොගන්නා භාණ්ඩ කිහිපයක් අපහරණය කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස උපදෙස් ලබාදුන් බව සඳහන් කර තිබුණද, එලෙස අපහරණය කළයුතු භාණ්ඩ මොනවාද යන්න තොග ගණන් ගැනීමේ පත්‍රිකාවල සටහන් කර නොතිබුණි.

(ඇ) 2017 වර්ෂය සඳහා සංස්ථාව විසින් ලබාගත් බැංකු අයිරා වෙනුවෙන් රු.5,419,200 ක අයිරා පොලියක් ගෙවා තිබූ අතර, ස්ථාවර තැන්පතු පවත්වාගෙන යාම වෙනුවෙන් ලද පොලී ආදායම රු.4,868,900 ක් විය. ඒ අනුව අතිරික්ත මුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර අයිරා පවත්වාගෙන යාමෙන් සංස්ථාවට අහිමි වූ මුදල රු.550,300 ක් බව නිරීක්ෂණය විය.

(ඈ) දැනට සංස්ථා සේවයේ ඉල්ලා අස්වී ඇති, සංස්ථා සේවයේ යෙදී සිටියදී වෙනත් ආයතනවලට වරින් වර නිදහස් කර තිබූ පුද්ගලයකු සඳහා 2004 වර්ෂයේ සිට 2009 දක්වා ගෙවා තිබූ ප්‍රතිපූර්ණය කරගත යුතු රු.144,722 ක මුදල විගණිත දින වූ 2018 සැප්තැම්බර් 03 වන විටත් ප්‍රතිපූර්ණය කර නොතිබුණි.

(ඉ) වසර 21 කට වඩා පැරණි රු.221,965 ක මුදල් වංචාවක් සහ 2007 වර්ෂයේ සිදුව තිබූ රු.281,110 ක තවත් එවැනිම වංචාවක් හේතුවෙන් ආයතනයට අලාභයක් සිදු වී ඇති බවට තහවුරු වී තිබියදීත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද අදාළ හානි හා පාඩු නිරවුල් කර ගැනීමට ක්‍රියා කර නොතිබුණි.

(ඊ) ණයවර ලිපි විවෘත කිරීම සඳහා ආරම්භ කරන ලදැයි පැවසෙන බැංකු ගිණුමක රු.මිලියන 153ට වැඩි මුදලක් වර්ෂය පුරාම පවත්වාගෙන ගොස් තිබූ අතර, එම මුදල බැංකු ගිණුමෙහි පවත්වාගෙන යාම වෙනුවෙන් කිසිදු පොලී ආදායමක් ලැබී නොතිබුණි. එම මුදල් සාමාන්‍ය ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත් කර තිබුණේ නම් අවම වශයෙන් රු.14,356,565 ක පොලී ආදායමක් ඉපයීමට සංස්ථාවට හැකියාව තිබුණි.

(උ) සීනෝර් (CEYNOR) ආයතනය පිළිබඳව ගුවන් විදුලි සංස්ථාවේ විකාශය වූ ප්‍රවෘත්තියක් සම්බන්ධයෙන් සීනෝර් (CEYNOR) ආයතනයේ හිටපු සභාපති වරයෙකුට අපහාස වූ බව පවසමින් එම සභාපතිවරයා විසින් කොළඹ දිසා අධිකරණයට නඩු පවරා තිබූ අතර, ඒ අනුව සංස්ථාවට රු.මිලියන 10 ක් ගෙවීමට නියම වී ඇත. මේ අනුව සංස්ථාව විසින් සංස්ථාවේ අරමුණුවල ඇතුළත් පරිදි ආචාර

ධර්ම පද්ධතියකට අනුව හරවත් ගුවන් විදුලි මාධ්‍ය සම්ප්‍රදායක් බිහි කිරීම හා වගකීමෙන් යුතුව සමබර තොරතුරු ලබාදීම යන අරමුණු කඩ වන අයුරින් කටයුතු කර තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

තොග සමීක්ෂණ කටයුතු සඳහා සහභාගි වූ 2017 පෙබරවාරි 17 දිනය තුළ විගණනය විසින් තොග අයිතම් 99 ක ගණනය කිරීම් නිරීක්ෂණය කළ අතර, ඒ අතරින් අයිතම 12 ක පොත් ශේෂය හා භෞතික ශේෂය අතර, වෙනස්කම් නිරීක්ෂණය වූ නමුත් විගණනයට ඉදිරිපත් කළ භෞතික තොග සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව මෙම තොග වෙනස්කම් සඳහන්ව නොතිබූ අතර, භෞතික තොග ශේෂයක් හා පොත් ශේෂයන් සමාන ලෙස දක්වා තිබුණි. එසේම තොග සමීක්ෂණයේදී විගණනයට නිරීක්ෂණය වූ ගබඩා අංක 01 හි පැවති පාවිච්චියට නොගන්නා විදුලි උපාංග තොග අයිතම 19 ක් ද අදාළ වාර්ෂික තොග සමීක්ෂණ මණ්ඩල වාර්තාවේ සඳහන්ව නොතිබුණි.

4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස කටයුතු කරමින් සිටි නිලධාරියා 2015 ජනවාරි 19 දින සිට එම තනතුරෙන් මුදාහැර තිබුණ ද, ගුවන් විදුලි සංස්ථා පනතේ 19(3)(ආ) වගන්තිය ප්‍රකාරව එම නිලධාරියා පෙර සිටි නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුරෙහි පිහිටුවා නොතිබුණි. ඒ වෙනුවට අමාත්‍ය මණ්ඩල අනුමැතිය රහිතව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත 2015 ඔක්තෝම්බර් 19 දින සිට සංස්ථාවේ උපදේශක තනතුරක පිහිටුවා තිබූ නමුත්, ඔහු විසින් එම තනතුර භාර නොගන්නා බව දැනුම් දී තිබුණි. එහෙත් අධ්‍යක්ෂ ජනරාල් වරයෙකුට හිමි නිල නිවාස, නිල වාහන, ඉන්ධන, වැටුප්, සේවක අර්ථසාධක අරමුදල් හා දුරකථන දීමනා සඳහා 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.3,227,353 ක් ගෙවීම් කර තිබුණි. එම නිලධාරියා විශ්‍රාම යාමෙන් පසු සේවා කාලය මාස 06 ක් සඳහා කැබිනට් අනුමැතිය ඇතිව දීර්ඝ කර තිබූ අතර, නිශ්චිත කාර්යභාරයක් නොමැතිව විශ්‍රාම යාමට පෙර තිබූ වැටුප සහ වෙනත් පහසුකම්ද අනුමත කර තිබුණි.

(ආ) ස්පාඤ්ඤයේ සැපයුම්කාර ආයතනයේ විකුණුම් කළමනාකරුගේ 2017 ජනවාරි 25 දිනැති ලිපිය අනුව ශ්‍රව්‍ය මිශ්‍රක පරිහරණය පිළිබඳ කර්මාන්තශාලා පුහුණුවට සංස්ථාව වෙනුවෙන් සහභාගි වන නිලධාරි දෙදෙනාගේ සියලු වියදම් ස්පාඤ්ඤ සැපයුම්කරු විසින් දරන දක්වා තිබුණ ද, දේශීය නියෝජිත ආයතනයේ කළමනාකාර අධ්‍යක්ෂකගේ ලිපියක් පදනම් කරගෙන නිලධාරීන් දෙදෙනෙකු සඳහා ආහාර වියදම් වශයෙන් රු.341,848 ක් ගෙවා තිබුණි.

4.5 දෘශ්‍ය අක්‍රමිකතා

2016 වර්ෂයේදී ප්‍රධාන කාර්යාල සම්බන්ධතා මැදිරි අංක $C_1 - C_{12}$ නවීකරණය ව්‍යාපෘතිය ආරම්භ කරන අවස්ථාවේදීම මැදිරි සඳහා අවශ්‍යතාවය අනුව ශ්‍රව්‍ය මිශ්‍රක (Mixer Console) 12 ක් මිලදී ගැනීමට සැලසුම් කර ඒ සඳහා අරමුදල් වෙන්කර තිබියදී 2016 වර්ෂයේදී mixer console 06 ක් සහ 2017 තවත් 06 ක් මිලදී ගැනීමට කටයුතු කිරීමෙන් ආයතනයට රු.6,452,319 ක පාඩුවක් සිදුවී තිබුණි.

4.6 අරමුදල් ඌන උපයෝජනය

2017 වර්ෂයේ ප්‍රාග්ධන වියදම් සඳහා රාජ්‍ය ප්‍රදාන රු.මිලියන 214.3ක් ලැබී තිබුණ ද, ගෙවීම් වවුචර අනුව ප්‍රාග්ධන වියදම් සඳහා වැය කර තිබුණේ රු.මිලියන 175.6 ක් පමණි. ඒ අනුව ප්‍රාග්ධන වියදම් සඳහා ලද රාජ්‍ය ප්‍රධාන වලින් සියයට 18 ක් පමණ මුදලක් ඉතිරිව පැවතුණි.

4.7 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉරණවිල පිහිටා තිබූ ඇමරිකන් හඬ ගුවන් විදුලි ආයතනය පාවිච්චි කරන ලද සංස්ථාවට භාරදී ඇති ක්‍රියාකාරී තත්ත්වයේ පවතින කෙටි තරංග ට්‍රාන්ස්මීටර යන්ත්‍රයක් විගණන අවස්ථාව වූ 2018 සැප්තැම්බර් 3 දක්වා කිසිදු ප්‍රයෝජනයට නොගෙන නිසි ආරක්ෂාවද නොමැතිව ත්‍රිකුණාමලය සම්ප්‍රේෂණාගාර භූමියේ ගබඩා කර තිබුණි.

(ආ) අලුත්වැඩියා කර ධාවනයට යොදාගත හැකිව තිබූ මෝටර් රථයක් වසර 1 ½ ක් මුළුල්ලේ නිෂ්කාර්යව කොළඹ ප්‍රධාන කාර්යාලීය පරිශ්‍රයේ පැවතුණි.

4.8 අනාර්ථික ගනුදෙනු

නියමිත දිනට බදු නොගෙවීම නිසා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ හිඟ බදු වාර්තා අනුව විගණිත දිනය වූ 2018 සැප්තැම්බර් 17 වන විට හිඟ ආර්ථික සේවා ගාස්තු, ජාතිය ගොඩනැගීමේ බදු, එකතු කළ වටිනාකම මත බදු ප්‍රමාණය රු.90,054,857 ක් හා ඊට අදාළ රු.51,684,603 ක් වූ මුළු දඩ මුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතුව තිබුණි.

4.9 හඳුනාගන්නා ලද පාඩු

2018 මාර්තු මස හපුතලේ විකාශනාගාර පරිශ්‍රයේ තිබූ රූපවාහිනී ආයතනයකට අයත් ආරක්ෂා කිරීමේ වගකීම ගුවන් විදුලි සංස්ථාවට පැවරී තිබූ ආර්ථික් කේබලයක කොටසක් අනවසරයෙන් කපාගෙන යාම පිළිබඳ මූලික විමර්ශනයක් සිදුකර තිබුණ ද, අඟල් 3 ½ ක පමණ විශ්කම්භයක් ඇති මෙම තඹ කම්බිය අස්ථානගත වීමේ පාඩුව තක්සේරු කර වගකිව යුත්තන්ගෙන් අයකර ගැනීමට විගණිත දින වූ 2018 සැප්තැම්බර් 03 වන විටත් කටයුතු කර නොතිබුණි.

4.10 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්/ දේපලවල ව්‍යාපෘති ආරම්භ කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගුවන් විදුලි දෙපාර්තමේන්තුව පවත්වාගෙන ගිය වර්තමානයේ ගුවන්විදුලි සංස්ථාව පරිහරණය කරන කොළඹ ඇති හෙක්ටයාර 2.5036 ක භූමි ප්‍රමාණයකින් යුත් ඉඩම 1949 වර්ෂයේ සිට බුක්ති විඳින නමුත් මේ දක්වා නීත්‍යානුකූලව පවරා ගැනීමට ආයතනය අපොහොසත් වී තිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.1 ඡේදය පරිදි ගොඩනැගිලි ඉදිකිරීම් වලදී ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු සම්පූර්ණ කර ඇති බව සහ ව්‍යාපෘතිය බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වෙනත් සියලු කරුණු ඉටුකර ඇති බව සනාථ කරගැනීම ප්‍රසම්පාදන කමිටු නිලධාරීන්ගේ වගකීම් හා කාර්යය භාරයට ඇතුළත් වුවත් වගකිව යුතු නිලධාරීන්ගෙන් පැහැදිලි කිරීම් ලබා නොගෙන සංස්ථාවට සින්නක්කරව අයිති පැරණි ගොඩනැගිල්ලක් සහිත පර්චස් 23 ක වපසරියකින් යුත් "අනිවත්ත බහිරව කන්ද " ඉඩමට මීටර් 500 ක දුරින් තිබියදී

උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් ඉඩමක කඳුරට සේවය සඳහා දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට 2017 දෙසැම්බර් 31 දින වනවිට කොන්ත්‍රාත්කරුවෙකු වෙත රු.1,579,442 ක් ගෙවීම් කර තිබුණි.

(ඇ) ආයෝජන මණ්ඩලයෙන් ලබා දෙන ලද ධාවන තත්වයේ පවතින වාහනයක් 2010 වර්ෂයේදී රු.2,300,000 කට ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර තිබුණ ද එහි අයිතිය නිරවුල්ව සංස්ථාවට පවරා ගැනීමට විගණන අවස්ථාව වූ 2018 සැප්තැම්බර් 3 දින වනවිටත් කටයුතු කර නොතිබුණි.

4.11 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් ආයතනයේ සම්පත්

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.4 ඡේදය අනුව රාජ්‍ය සංස්ථාවල සේවකයන් අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව වෙනත් ආයතනයට මුදාහැරිය නොහැකි නමුත් පාලක (ග්‍රාමීය) නිලධාරියකු හා පළමු ශ්‍රේණියේ වාර්තාකරුවකු අමාත්‍ය මණ්ඩල අනුමැතිය නොමැතිව වෙනත් අමාත්‍යාංශ දෙකකට මුදාහැර තිබුණි.

4.12 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරුණු ලැබේ.

(අ) 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ විධිවිධානවලට අනුගත වන පරිදි නව බඳවාගැනීමේ හා උසස්වීමේ පරිපාටිය විගණන අවස්ථාව වූ 2018 අගෝස්තු වන විටත් අනුමත කරගෙන නොතිබුණි.

(ආ) ඉදිරිපත් කළ තොරතුරුවලට අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ ස්ථිර කාර්ය මණ්ඩලය 803 ක් වූ අතර ඒ තුල වූ අතිරික්ත කාර්ය මණ්ඩලය 302 ක් විය.

(ඇ) සංස්ථාවේ ප්‍රධාන මාණ්ඩලික තනතුරු 03ක් එනම්, අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මුදල්) හා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ඉංජිනේරු) යන

තනතුරු වර්ෂ 03ත් 09ත් අතර කාලයක සිට පුරප්පාඩුව පවතී. එමෙන්ම නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ඉංජිනේරු), අධ්‍යක්ෂ ඉංජිනේරු (මැදිරි), අධිකාරී ඉංජිනේරු හා ඉංජිනේරු යන තනතුරුවල පුරප්පාඩු 08 ක් අවුරුදු 01 සිට අවුරුදු 04 දක්වා පුරප්පාඩුව පවතී. ඉංජිනේරු අංශයේ කාර්යභාරය ගුණාත්මක ලෙස ඉටු නොවීමට මෙම පුරප්පාඩු සලකා තිබූ බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ අනුමත නොවන තනතුරු 47 ක් සඳහා කාර්ය මණ්ඩලය 227 දෙනෙකු සේවයේ නියුක්ත කර තිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ පවත්නා බඳවා ගැනීමේ පරිපාටියේ 06 වන ඡේදයට අනුව අභ්‍යන්තර අයදුම්කරුවකු ඉංජිනේරු තනතුරට පත් කිරීමේදී සංස්ථාවේ පළමු ශ්‍රේණියේ කාර්මික සහකාර තනතුරේ වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු වුවද, 1985 වර්ෂයේදී හා 2002 වර්ෂයේදී පළමු ශ්‍රේණියේ කාර්මික සහකාර තනතුරේ වසර 05 ක සේවා කාලය සම්පූර්ණ නොකළ නිලධාරීන් දෙදෙනෙකු ඉංජිනේරු තනතුරට බඳවාගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

4.13 වෙළඳපොල කොටස

ලංකා අලෙවි පර්යේෂණ කාර්යාංශයේ (LMRB) වාර්තාව අනුව ගුවන් විදුලි නාලිකා 29 ක් අතරින් 2017 සැප්තැම්බර් වන විට ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව විසින් පවත්වාගෙන යන ප්‍රධාන දේශීය සිංහල සේවා 08 න් සිංහල ජාතික සේවය 10 වන ස්ථානයේ සේවා පැවති අතර අනෙකුත් සේවා 7 ට ඊට පහල ස්ථානවල පැවතුණි. ප්‍රාදේශීය සේවා අතුරින් රුහුණු සේවය 24 වැනි ස්ථානයේ පසුවිය.

5. තිරසාර සංවර්ධනය

5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද ලිපිය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය, ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළයුතුව පවතින අතර, සමාලෝචිත වර්ෂයට අදාළව

සංස්ථාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

(ආ) ඉහත පරිදි වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සංස්ථාව විසින් දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක, එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද, ඉලක්ක මත ළඟා වීම් මැන බැලීම් සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

6.1 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

6.1.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රාග්ධන දායකත්වයෙන් සිදු කරනු ලබන ප්‍රසම්පාදනයන් සඳහා පමණක් වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබුණ ද, පුනරාවර්තන දායකයෙන් සිදුකරනු ලබන හා සංස්ථා අරමුදල් වලින්ම සිදුකරනු ලබන ප්‍රසම්පාදනයන් ද ඇතුළත් වන ලෙස අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහාවත් වන ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. මේ නිසා වර්ෂයකට වැඩි කාලයක් ගතවන ව්‍යාපෘතිවලට අදාළ ප්‍රසම්පාදනයන් හා ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කරන ලද එහෙත් මේ දක්වා කමිටු නිර්දේශ ක්‍රියාත්මක නොකළ ප්‍රසම්පාදනයන් කිසිදු ඇගයීමකට ලක් නොවී තිබුණි.

(ආ) 2016 හා 2017 වර්ෂවලදී ප්‍රධාන කාර්යාලයේ සම්බන්ධතා මැදිරි නවීකරණය හා හපුතලේ FM සම්ප්‍රේෂණාගාරයේ නවීකරණය සඳහා පිළිවෙලින් රු.මිලියන 80 හා රු.මිලියන 193.75 ප්‍රසම්පාදනයන් සැලසුම් කර තිබුණ ද, 2017 අවසන් වන විටත් පිළිවෙලින් රු.මිලියන 43 හා රු.මිලියන 88.7 ප්‍රසම්පාදන පමණක් ඉටු කිරීමෙන් පිළිවෙලින් රු.මිලියන 37 හා රු.මිලියන 105.05 ක ප්‍රසම්පාදන සැලසුම් කළ පරිදි ඉටුකර නොතිබුණි.

(ඇ) වාර්ෂිකව රු.මිලියන 200 ආසන්න වටිනාකමකින් යුත් ප්‍රසම්පාදන කාර්යයන් සංස්ථාව විසින් සිදුකරනු ලැබුවද ප්‍රසම්පාදනය සඳහා වෙනම අංශයක් සංවිධානය නොවීම අභ්‍යන්තර පාලනය දුර්වල වීමට වඩාත් බලපා තිබුණි. මේ අනුව ප්‍රසම්පාදනයේදී වැරදි සිදුවීමේ අවදානම අඩු කිරීම සඳහා ප්‍රතිපත්ති, පිළිවෙත්, පරිචයන් හා සංවිධාන ව්‍යුහයන් වැනි අභ්‍යන්තර පාලන ක්‍රම හඳුන්වා දීම සිදුකර නොතිබුණි.

6.2 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2015 වර්ෂයේ වාර්ෂික වාර්තාව විගණන අවස්ථාව වූ 2018 අගෝස්තු 31 වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

6.3 නොවිසඳී ඇති විගණන ඡේද

2016 විගණන වාර්තවේ වූ නොවිසඳී ඇති ඡේදයන් පහත පරිදි වේ.

(අ) පුත්තූර්හි ඇන්ටනා කුළුන ඉදිකිරීමේ කටයුතු ඉදි කිරීමේ මූල්‍ය හා තාක්ෂණික හැකියාව නොසලකා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලින් බැහැරව 2011 ජූලි 16 දින හස්ත කර්මාන්ත මණ්ඩලයට පවරා තිබුණි. ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම වෙනුවෙන් අත්තිකාරම් ලෙස හස්ත කර්මාන්ත මණ්ඩලය වෙත රු. 9,126,933 ගෙවා තිබූ අතර ඉදිකිරීම් කටයුතු සිදු කිරීමෙන් තොරව කොන්ත්‍රාත්තුව අතහැර දමා තිබුණි. ගෙවූ අත්තිකාරම් මුදලින් රු. 4,348,041 පමණක් සංස්ථාවට ආපසු ගෙවීම නිසා රු.4,778,892 ක පාඩුවක් සිදුවී තිබුණි.

(ආ) 1996 වර්ෂයේදී මීටර් 60 ක් හා මීටර් 100 ක් උස ඇන්ටනා කුළුනු 2ක් ගෙන්වීම සඳහා රු.23,119,683 ක් වැයකර තිබුණු අතර, කුළුනු සවිකිරීම සඳහා පෞද්ගලික ආයතනයකට අත්තිකාරම් ලෙස රු.2,568,000 ක් ගෙවා තිබුණි. සවිකළ යුතු ස්ථාන තීරණය කර නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් එම කුළුනු සවිකර නොතිබූ අතර, ඒකල භූමියේ අනාරක්ෂිතව පැවතුණි.

(ඇ) සංස්ථාව විසින් රු.860,000 ක් ගෙවා මිලට ගෙන තිබුණු නිවාස දෙකක් (අනුරාධපුර හා මහනුවර) සඳහා පැවරුම් සහතික ලබාගෙන නිසි පරිදි අයිතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 යෙහි 07 ඡේදය අනුව යම් දේපළකින් අනාගත ප්‍රතිලාභ ආයතනය තුළට ගලා ඒ නම් සහ එම දේපළ පිරිවැය විශ්වාසදායක ලෙස ගණනය කළ හැකි නම් එය වත්කමක් ලෙස හඳුනා ගත යුතු වුවත් ජනමාධ්‍ය අමාත්‍යාංශයෙන් ලැබී තිබූ රු.2,200,000 ක රක්ෂිත වටිනාකමක් සහිත අංක 058-6222 දරන මෝටර් රථය 2014 සිට සංස්ථාව විසින් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණද එය ස්ථාවර වත්කමක් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) වසර 10 කට වඩා වැඩි කාලයක සිට අබලන්ව ධාවනයෙන් ඉවත් කර ඒකල සම්ප්‍රේෂණාගාර භූමියේ ගාල් කර තිබෙන මහවැලි අධිකාරියෙන් ලබා දෙන ලද අංක ශ්‍රී 60-355 දරන වාහනය 2010 වර්ෂයේදී රු. 150,000 කට ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර තිබුණ ද මේ දක්වා එහි අයිතිය නිරවුල්ව සංස්ථාවට පවරා ගැනීමට කටයුතු නොකිරීම නිසා එය අපහරණය කිරීමට පවා නොහැකිව අකර්මන්‍යව තිබුණි.

(ඊ) 1989 වර්ෂයේදී ජපාන රූපවාහිනී සහ ජපාන ගුවන් විදුලි ආයතනයේ (NHK) ආධාර ඇතිව ආරම්භ කරන ලද ව්‍යාපෘති අවසානයේදී සම්ප්‍රේෂණාගාර ගොඩනැගිල්ල හා සියලුම යන්ත්‍රෝපකරණ 1993 වර්ෂයේදී ගුවන් විදුලි සංස්ථා ප්‍රධාන කාර්යාලයට භාර දී තිබුණි. එම ඉඩම හා ගොඩනැගිලි 2011 ජූලි 29 දිනැති තක්සේරු වාර්තාව අනුව රු.960,000,000 කට තක්සේරු කර තිබුණද කිසිදු වත්කමක් ගිණුම්ගත කර නොතිබුණු අතර, ව්‍යාපෘතියට අදාළ කිසිදු ලිපි ගොනුවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. .

(උ) ගිවිසුම ප්‍රකාරව බදු කුලී නොගෙවීම නිසා සංස්ථාවට අයත් නුවරඑළිය "නිවහන" නිවාඩු නිකේතනයේ බදුකරුට විරුද්ධව නඩු පැවරීමෙන් බදුකරු නිවහනින් ඉවත් කර තිබුණ ද 2005 වර්ෂයේ සිට 2014 වර්ෂයේ පෙබරවාරි දක්වා ගිවිසුම් ප්‍රකාරව අයවිය යුතු රු.5,106,500 ක බදුකුලී සහ බදු ගැණුම්කරුගෙන් දේපළෙහි අයිතිය නැවත ලබා ගැනීම සඳහා 2010 වර්ෂයේ සිට දරා තිබුණු රු.2,151,206 ක නඩු ගාස්තුව අයකර ගැනීම සඳහා සංස්ථාව විසින් විගණන අවස්ථාව වූ 2018 අගෝස්තු 31 දක්වාම නෛතික ක්‍රියාමාර්ගවලට අවතීර්ණ වී නොතිබුණි.

(ඌ) අඹේවෙල ගුවන්විදුලි විකාශනාගාරය ඉදිකිරීම සඳහා 1984 වර්ෂයේදී රජය විසින් නුවරඑළිය හා වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශවලට අයත් අක්කර 30 ක පමණ භූමි ප්‍රමාණයක් වෙන්කර දී තිබූ නමුත් බදු ගිවිසුමක් මගින් නීත්‍යානුකූලව මෙම භූමිය පවරා ගැනීමට කටයුතු කර නොතිබූ අතර, 2017 දෙසැම්බර් 31 දක්වාම යෝජිත කාර්යය සඳහා උපයෝගී කරගෙන නොතිබුණි. මෙම භූමි ප්‍රමාණයෙන් නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයිති අක්කර 6 ක පමණ භූමි කොටස සඳහා බදු ගිවිසුම අත්සන් කිරීමට කටයුතු කර තිබියදී ප්‍රාදේශීය ලේකම් විසින් "විදුලංකා" නමැති පෞද්ගලික ආයතනයකට මෙම ඉඩමේම කොටසක් බදු දීමට කටයුතු කර තිබුණි. තවද වැලිමඩ ප්‍රාදේශීය ලේකම්ට අයිති ඉතිරි අක්කර 24 ක පමණ භූමි ප්‍රමාණය සඳහා බදු අයිතිය ලබා ගැනීමට සංස්ථාව අපොහොසත්ව තිබූ අතර, සංස්ථාව විසින් ඉඩමේ ඇති සංචාරක බංගලා දෙක පමණක් පවත්වාගෙන ගොස් තිබුණි.

(එ) එෆ් එම් සම්ප්‍රේෂණාගාරයක් ඉදිකිරීම සඳහා 1990 වර්ෂයේදී රු. 50,000 කට මිලදී ගෙන තිබූ හෙක්ටයාර් 1.503 ක වපසරියකින් යුත් කලටුවාවේ පිහිටි ඉඩම විගණන දිනය වූ 2018 සැප්තැම්බර් 3 දින දක්වා යෝජිත කාර්යයට යොදවා නොතිබුණි. එයින් පර්වස් 19.77 ක කුළුණක් ඉදිකර ලංකා බෙල් ආයතනය විසින් 2011 වර්ෂයේ සිට භුක්ති විඳිමින් පැවතියද ඒ සඳහා මාසිකව රු.15,000 බැගින් ගෙවීමට එම ආයතන එකඟ වී තිබුණද මේ දක්වා නීත්‍යානුකූල බදු ගිවිසුමකට එළඹීමට නොහැකි වීම නිසා 2011 වර්ෂයේ සිට ආයතනයට ලැබිය යුතු බිම් කුලී ආදායම් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඒ) නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් සමඟ ඇති කර ගත් තිස් අවුරුදු බදු ගිවිසුමකින් ලබා ගෙන තිබූ නුවරඑළිය "නිවහන" නිවාඩු නිකේතනය දරන දේපළේ බදු කාලය 2015 ඔක්තෝබර් මස අවසන් වී තිබූ අතර එදින සිට දේපළේ අයිතිය ප්‍රාදේශීය ලේකම් සතු වුවද එය නොසලකා 2015 ජූනි 01 දින සිට අවුරුදු තුනක කාල සීමාවකට මාසයකට රු.290,000 ක බදු කුලියකට නිවාඩු නිකේතනයක් පවත්වාගෙන යාම සඳහා ගැණුම්කරුවකුට බද්දට දී තිබුණ අතර, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි බදු කුලිය රු. 725,000 විය. මෙලෙස සංස්ථාවට හිමිකමක් නැති දේපළක් බදු දීම මතභේදාත්මක කරුණක් ලෙස නිරීක්ෂණය විය.

(ඔ) ගුවන් විදුලි සේවා ස්වයංක්‍රීයකරණ සඳහා 2008 වර්ෂයේ සිට අවස්ථා කීපයකදී එකතුව රු.3,212,113 ක මුදලක් වැය කර තිබුණ ද, 2017 දෙසැම්බර් වන විටද එම සේවාවෙන් ලැබිය යුතු පහසුකම් ලබාගැනීමට හැකි වන පරිදි එම මෘදුකාංගය ක්‍රියාත්මක වී තිබුණේ සේවා 03 කට පමණි. මෙනිසා මෘදුකාංග ලබා ගැනීමට විශාල මුදලක් වැය කර තිබුණ නමුත් බොහෝ කාර්යයන් මේ දක්වා ස්වයංක්‍රීයකරණය කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඕ) ගුවන් විදුලි සංස්ථාවට අයත් අක්කර 125 ක සීදුව ඉඩමෙන් පර්චස් 10 බැගින් වූ කැබලි 1027 ක් ගුවන් විදුලි සංස්ථාවේ එකඟත්වයකින් තොරව 2000-2001 කාල පරිච්ඡේදය තුළ කටාන ප්‍රාදේශීය ලේකම් විසින් ජනතාව අතර බෙදා දී තිබුණි. 2018 සැප්තැම්බර් 3 විගණන දිනය දක්වාම ඉඩමේ අයිතිය සංස්ථාව සතුව පැවතුණද එන්දි අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ක) 2016 ඔක්තෝබර් 19 දින සිට 2016 ඔක්තෝබර් 27 අතර දිනක ආරක්ෂක අංශය භාරයේ තිබියදී බලාගාර අංශයේ භාවිතයේ තිබූ රු. 425,000 වටිනා පවර් ලොගර් මිණුම් උපකරණය අස්ථානගත වී තිබුණු අතර, ආරක්ෂක අංශයේ කට උත්තරය අනුව මෙම යන්ත්‍රය එම අංශය තුළ තිබියදී අස්ථානගත වී ඇති බව සනාථ වී තිබියදීත් සිදුවූ අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් 2018 සැප්තැම්බර් 05 විගණිත දින වන විටත් අයකරගෙන නොතිබුණි

7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

පද්ධති හා පාලන ක්ෂේත්‍ර	නිරීක්ෂණ
(අ) වත්කම් පාලනය	(i) සංස්ථාවට විසින් මිලදී ගෙන ඇති ඉඩම් සඳහා නීත්‍යානුකූල ඔප්පු ලබාගැනීමට කටයුතු නොකිරීම. (ii) සංස්ථාවට හිමි භුක්ති විඳින ඉඩම් ආරක්ෂා කරගැනීමට නොහැකි වීම හා ඉඩම් විශාල ප්‍රමාණයක් ප්‍රයෝජනයට ගෙන නොතිබීම.

(iii) සංස්ථාවට හිමිකම ඇති භුක්ති නොවිඳින ඉඩම් බාහිර පාර්ශවයන් නීති විරෝධී ලෙස අත්පත් කරගෙන සිටීම .

(iv) ඉඩම් හා ගොඩනැගිලි භෞතිකව සත්‍යාපනය කර නොතිබීම.

(v) ස්ථාවර වත්කම් බොහොමයක පිරිවැය හා පවත්නා ස්ථානය වෙන වෙනම හඳුනාගත නොහැකි වීම නිසා පැරණි වත්කම් බොහොමයක් විකුණා තිබුණත් ඒවා පොත් වලින් ඉවත් කර නොතිබීම.

(vi) වාහන පිළිබඳ භෞතික සත්‍යාපනයක් සිදුකර නොතිබීම.

(ආ) ලැබිය යුතු ගිණුම්

(i) වර්ෂ 42 කට වඩා පැරණි ණය ශේෂ අය නොවී පැවතීම.

(ii) ණයගැති පාලන ගිණුම් හා උපලේඛන අතර වෙනස හඳුනාගෙන සැසඳීමට කටයුතු කර නොතිබීම.

(ඇ) තොග පාලනය

(i) තොග ආගණනයේදී හඳුනාගත් තොග ඌනතා හා අතිරික්තයන් සමීක්ෂණ මණ්ඩලය විසින් වාර්තාගත කර නොතිබීම.

(ii) තොග අයිතම පිළිබඳ දත්තයන් පරිගණකගත නොකිරීම නිසා තොග වාර්තා ලබා ගැනීමට වැඩි කාලයක් ගතවීම.

(ඈ) ගෙවිය යුතු ගිණුම්

(i) ණයහිමි පාලන ගිණුම් හා උපලේඛන අතර වෙනස හඳුනාගෙන සැසඳීමට කටයුතු කර නොතිබීම.

(ii) වසර 02ත් 10 ත් අතර නොගෙවූ උපචිත වියදම් පැවතීම හා එම උපචිත වියදම්වල වගකීම් කාලය ඉක්මවා ඇති හෝ තථ්‍ය වගකීමක් නොමැති වියදම් විශ්ලේෂණය කර නිරවුල් කිරීමට කටයුතු නොකිරීම.

(iii) බදු වගකීම් හා වර්ෂයට අදාළ බදු නිසි පරිදි හඳුනාගෙන එම බදු වගකීම් නිසි දිනයට නිරවුල් කිරීමට කටයුතු නොකිරීම හා එම හිඟ බදු මත අධිභාර ගෙවීම සිදුවීම.

(ඉ) කාර්යය මණ්ඩල පරිපාලනය

(i) බඳවාගැනීමේ පරිපාටියක් අනුමත කරගෙන නොතිබීම.

(ii) අනුමත නොවුණු තනතුරු සඳහා දිගින් දිගටම බඳවාගැනීම නිසා සේවක අතිරික්තයක් ඇතිවීම.

(iii) විධිමත් පරිදි සම්මුඛ පරීක්ෂණ පවත්වා තිබියදීත් තනතුරට අවශ්‍ය නියමිත සුදුසුකම් නොමැති අය අවලංගු කරන ලද සම්මුඛ පරීක්ෂණ මත බඳවා ගැනීම.

(ඊ) ගිණුම්කරණය

(i) සංස්ථාවේ ගිණුම්කරණ ක්‍රමය යාවත්කාලීන කර නොතිබීම.

(ii) වත්කම්, වගකීම්, ආදායම්, වියදම් ගිණුම්වල ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය වීම.

(iii) ගිණුම්කරණයේදී ප්‍රධාන මූලාශ්‍ර ලියවිල්ලක් වන ජර්නල් වවුචර්වල අංක, වටිනාකම්, සංලක්ෂය සඳහන් කිරීමේදී අඩුපාඩු පැවතීම.

(උ) ප්‍රසම්පාදන

(i) සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබීම.

(ii) විකාශනාගාරයක් නවීකරණය කිරීමේ කොන්ත්‍රාත්තුවක් පැවරීමේදී අඩුපාඩු සහිතව කටයුතු කර තිබීම.

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

2017 විගණකාධිපති වාර්තාව සඳහා සංස්ථාවේ පරිකථනය

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිලිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ඉහත සඳහන් කරුණ පිලිබඳව ඔබගේ අංක එම්ඊඩී/ඒ/එස්වල්බීසී/1/17/477 හා 2018.09.20 දිනැති 14 (2) (සී) කෙටුම්පත් වාර්තාව සම්බන්ධයෙනි.

මෙම වාර්තාව සම්බන්ධයෙන් විගණන අධිකාරිය සමග සංස්ථා නිලධාරීන් 2018.09.21 සහ 25 දිනයන් හි සිදුකළ සාකච්ඡාවේ දී සකස් කළ වාර්තාවට වැඩිමනත්වයි.

වාර්තාවේ 1.2, 1.3 වගන්ති හි සඳහන් කරුණුවලට එකඟ වෙමි.

2.2.1 මෙම ජේදයේ සඳහන් තොරතුරු 2017.12.31 දිනට අවසන් ගිණුම් අනුව නිවැරදි ය. නමුත් 2016 ට සාපේක්ෂව 2017 වර්ෂයේ රාජ්‍ය ප්‍රදාන ගැලපීමට පෙර මෙහෙයුම් අලාභය අඩු වී ඇත. රජය වෙනුවෙන් ක්‍රියාත්මක වන රාජ්‍ය ගුවන්විදුලිය භාණ්ඩාගාර ප්‍රතිපාදන මත පවත්වා ගෙන යනු ලබන බව සලකා සංස්ථාවේ පැවැත්ම පිළිබඳ අවිනිශ්චිත භාවයක් ඇතයන මතයට එකඟ විය නොහැකි ය.

2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

(අ) ප්‍රමිත අංක 01

ගිණුම් මාරු කිරීමට කටයුතු කිරීමට කටයුතු කර ඇත. 2018 වර්ෂයේ අවසාන ගිණුම්වල වට්ටෝරු භාණ්ඩ සටහන යටතේ හෙළිදරව් කරනු ලැබේ.

(ආ) ප්‍රමිත අංක 07

i 2018 වර්ෂයේ දී අවසන් ගිණුම් වාර්තා මගින් නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත.

ii 2018 වර්ෂයේ අවසන් ගිණුම් මගින් ජංගම වගකීම් යටතේ දැක්වීමට කටයුතු කරනු ඇත.

(ඇ) ප්‍රමිත අංක 17

<u>නුවරඑළිය ඉඩම</u>

මෙය අඹේවෙල පිහිටි නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් බිම් ප්‍රදේශයකි. එම බිම් කොටස එනම් හෙක්ටයාර් 2.520 කොටස ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවට බදුකරයක් මත ලබාදීමට ගරු ඇමතිතුමා අනුමත කර තක්සේරුව නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් සංස්ථාව වෙත දන්වා ඇත. ඒ අනුව එම මූලික මුදල වන රු.1,248,000/- 2013.11.21 දිනැති අංක 072938 දරන ලංකා බැංකු චෙක්පත මගින් ගෙවා ඇත. ඉන් පසුව 2014.08.29 දිනැති නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් විසින් මෙම ඉඩම නැවත මැනුම් කිරීමට අවශ්‍ය වී ඇති බවත්, ඒ සඳහා හේතුවන්නේ වින්ඩ් පවර් පුද්ගලික සමාගම වෙත 2014.02.21 දින හෙක්ටයාර් 2.3583 ක් ලබා දී ඇති බැවින් නුවරඑළිය ඉඩම් කොටසින් එම ආයතනයට ලබා දී ඇති කොටස ඉවත්කර ඉතිරි කොටස පමණක් සංස්ථාවට බදු ලබාදීම පිණිස බවත් දන්වා ඇත. මේ සඳහා නුවරඑළිය ප්‍රදේශීය ලේකම් දැනුම් දීම මත සංස්ථාව විසින් 2016.08.04 දිනැති අංක 686015 දරන ලංකා බැංකු චෙක්පත මගින් රුපියල් 59746.30 මුදලක් නුවරඑළිය ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත ගෙවා ඇත. ඒ අනුව වර්තමානය වන විට පවතින ඉඩම් ප්‍රමාණය මත මුදල නැවත තක්සේරු කළ යුතුයි. මේ සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කටයුතු කරමින් ඇති අතර, හිඟ බදු මුදලක් සම්බන්ධයෙන් දැනුවත් වීමක් නැත. විගණනය සඳහන් කර ඇති පරිදි හිඟ බදු මුදලක් නොමැති බව දන්වා සිටිමි.

<u>කුච්චවේලි ඉඩම</u>

මෙම ඉඩම ඩොයිෂවෙල් ව්‍යාපෘතිය පවත්වාගෙන යාම සඳහා සංස්ථාවට පවරා ඇත. 2009 වර්ෂයේ බදු කාලය දීර්ඝ කිරීම සඳහා බදු අයිතිය සංස්ථාව විසින් ඉල්ලා ඇත. ඒ අනුව බදු ගෙවීම සඳහා නැගෙනහිර පලාත් ඉඩම් කොමසාරිස් විසින් දැනුම් දිම් කර ඇත. මෙම බදු මුදල ඉවත් කිරීම සඳහා කටයුතු කර දෙන ලෙස මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම් මගින් ඉල්ලීම් කර ඇත.

<u>හුන්නස්ගිරිය ඉඩම</u>

හුන්නස්ගිරිය විකාශනාගාරය පිහිටි ඉඩම සඳහා රාජ්‍ය වැවිලි සංස්ථාවට විගණනය සඳහන් කර ඇති බදු මුදල් ගෙවීමට ඇත.

ii ගිවිසුම් නොමැති නිසා තොරතුරු පිළිබඳ සටහනක් යෙදීම 2018 වර්ෂයේ අවසන් ගිණුම් මගින් සිදුකරනු ඇත.

(ඈ) ප්‍රමිත අංක 19

i. 2018 වර්ෂයේ ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත.

ii. ගිණුම් වෙනස් කිරීමට කටයුතු කර ඇත.

iii. 2018 වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත.

(ඉ) ප්‍රමිත අංක 21

i. 2018 වර්ෂයේ අවසන් ගිණුම් මගින් නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත.

ii. 2018 වර්ෂයේ අවසන් ගිණුම් මගින් නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත.

2.2.4 ගිණුම්කරණ අඩුපාඩු

(අ) 2018 අගෝස්තු 31 නිවැරදි කර ඇත.

(ආ) 2018 වර්ෂයේ අගෝස්තු 31 ගිණුම් නිවැරදි කර ඇත.

(ඇ) 2018 වර්ෂයේ ජනවාරි, පෙබරවාරි මාස වනවිට මෙය ප්‍රාදේශීය කාර්යාල මගින් ජර්නල් සටහන් යොදා නිවැරදි කරයි. මෙය සාමාන්‍ය ක්‍රියාවලියකි.

(ඈ) මේ පිළිබඳ පරීක්ෂණයක් පැවැත්වෙන බැවින්, එම වාර්තාවේ නිර්දේශ මත වත්කමෙන් ඉවත් කිරීමට කටයුතු කිරීමට නියමිතය.

(ඉ) ගොඩනැගිල්ල රු.250,000/- මිලට ගෙන ඇත. ගොඩනැගිල්ල පවතින ඉඩම ප්‍රාදේශීය ලේකම්ගෙන් බදු ලබාගැනීමට කටයුතු කරයි.

(ඊ) විගණන නිරීක්ෂණ නිවැරදිය.

(උ) මෙම ගිණුම්කරණ ක්‍රමය නිවැරදි කර ඇත.

(ඌ) රජරට ජංගම ගිණුම හා මුදල් පොත අතර වෙනසට හේතු හඳුනා ගෙන ජර්නල් සටහන් මගින් නිවැරදි කරන ලදී.

(එ) මෙම ශේෂය 2017 වර්ෂයේ නොවැම්බර් මස ලැබීම් මුදල් පොතට ඇතුළත් කර ඇත.

(ඒ) 2018 වර්ෂයේ අප්‍රේල් මස මෙම වෙනස හඳුනා ගෙන නිවැරදි කරන ලදී.

(ඔ) 2018 වර්ෂයේ බැංකු සැසඳුම නිවැරදිව ගැලපීම් කරනු ඇත.

(ඕ) මෙය බැංකුවේ දෝෂයකි. බැංකුව මේ සම්බන්ධයෙන් කටයුතු කරයි. බැංකුව අවස්ථා දෙකක දී සංස්ථා බැංකු ගිණුමෙන් අයකර ගෙන ඇත. ඉතිරි ගිණුම් නිවැරදි කර ඇත.

(ක) ගිණුම්වලින් අදාළ වටිනාකම (ඉඩම් ගිණුමෙන්) ඉවත් කළ යුතුය. 2018 අවසන් ගිණුම් මගින් නිවැරදි කරනු ඇත.

(ග) 2018 වර්ෂයේ කාර්තු ගිණුම් වාර්තා මගින් මේ වන විටත් නිවැරදි කර ඇත.

2.2.5 අසම්භාව්‍ය බැරකම්

නොවිසඳූ නීතිමය ගැටළුවක් බැවින්, ශේෂ පත්‍ර සටහනක් මගින් හෙළිදරව් කිරීමට නියමිතය.

2.2.6 නොසැසඳු පාලන ගිණුම්

(අ) 2018 වර්ෂයේ අවසන් ගිණුම් මගින් නිවැරදි කිරීමට නියමිතය.

(ආ) උපලේඛන ණයගැති ශේෂය ණයගැති පාලන ගිණුමේ ශේෂය අතර වෙනසක් නැත. ත්‍රිකුණාමල ව්‍යාපෘතියේ ණයගැති ශේෂය මේ දක්වා තිබීම වෙනසට හේතුවයි.

2.2.7 පැහැදිලි නොකළ වෙනස්කම්

(අ) සංස්ථා මණ්ඩලය විසින් පත්කල ගිණුම් නිවැරදි කිරීමේ අනු කමිටුව මගින් නිරීක්ෂණය කර නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

(ආ) මේ සම්බන්ධයෙන් අදාල ලිපි ලේඛන නොමැති නිසා ණය නිරවුල් කිරීමට අපහසුය.

(ඇ) මේ සම්බන්ධ අදාල ලිපි ලේඛන නොමැත.

2.2.8 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) විගණන නිරීක්ෂණ නිවැරදිය

(ආ) මූල්‍ය ගැටළු සම්බන්ධ පත්කළ කමිටුවට ඉදිරිපත් කර ඇත.

(ඇ) වෙළඳ ණයගැතියන් ශේෂ සනාථ කළ ද, නොකළ ද සංස්ථාවේ ගිණුම් අනුව පවතින ශේෂ අයකර ගැනීමට අදාල කටයුතු අලෙවි අංශය මගින් ඉටු කරයි.

2.2.9 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) ඉඩම් - සංස්ථාව සතු ඉඩම් සම්බන්ධ වර්ගීකරණය කළ ලේඛනය විගණනයට ඉදිරිපත් කර ඇත.

(ආ) ගොඩනැගිලි - ගොඩනැගිලි ලේඛනය සකස් කරමින් පවතී.

(ඇ) ප්‍රධාන කාර්යාලයීය නව ගොඩනැගිල්ල - මෙම ගොඩනැගිල්ල නාගරික සංවර්ධන අධිකාරිය මගින් ඉදිකරන ලද අතර සැලසුම හැර ඉතිරි ලේඛන ඉදිරිපත් කර නැත.

(ඈ) වසර 10කට අධික කාලයක සිට ගිණුම්වල පවතින - මේ පිළිබඳ ලක්හඬ ආයතනයට දන්වා වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු ශේෂ (ලක්හඬ ශාඛා ඇත ගිණුම)

(ඉ) ගෙවීම් වවුචර් විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.

(ඊ) ඉන්දියානු රාජ්‍ය බැංකු ගිණුම් ශේෂය - මේ සම්බන්ධ බැංකු ප්‍රකාශනය ඉදිරිපත් කර ඇත.

2.3. නීතිරීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

(අ) ප්‍රාදේශීය සේවා මගින් ගෙන්වා ගැනීමට ප්‍රමාදවීම හා මූල්‍ය දුෂ්කරතා නිසා මෙම ප්‍රමාදය ඇති වේ.

(ආ) මෙම චෙක්පත් අවලංගු කිරීමට කටයුතු කර ඇත.

(ඇ) වාර්ෂිකව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කරයි.

(ඈ) ස්ථාවර වත්කම් ලේඛනය පරිගණක ගත කර යාවත්කාලීන කරමින් පවත්වාගෙන යයි.

(ඉ) පරිගණක උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යයි.

(ඊ) i. මුදල් අංශය සම්බන්ධ නව පරිගණක මෘදුකාංගය හඳුන්වා දුන් පසු මෙම ගැටළුව විසඳීමට නියමිතය.

ii. 2018 වර්ෂයේ පත්කරන වාර්ෂික කමිටුව මගින් වාහන භෞතිකව පරීක්ෂා කිරීමට නියමිතය.

(උ) i. 2006 වසරේ කළමනාකරණ චක්‍රලේඛය මගින් සංස්ථාවේ අධ්‍යක්ෂවරුන් සඳහා H-M වැටුප් ක්‍රමය යෝජනා කර ඇති නමුත් සංස්ථාව බඳවා ගැනීම් පටිපාටිය සකස් කර අදාල කටයුතු නොකර තිබීම නිසා සංස්ථා අධ්‍යක්ෂවරුන්ට එම වැටුප් ක්‍රමය ගෙවීම් නොකරයි. නමුත් සංස්ථා අධ්‍යක්ෂවරුන් සඳහා සංස්ථා වාහන මගින් ප්‍රවාහන පහසුකම් සපයා තිබුණි. සංස්ථා වාහන මගින් අධ්‍යක්ෂවරුන්ට ප්‍රවාහන පහසුකම් සැපයීමේ දී යන පිරිවැය සලකා බලා 2017.12.01 දින සිට සංස්ථාවේ සියලුම අධ්‍යක්ෂවරුන්ට නිවසේ සිට සංස්ථාවට පැමිණීමටත්, නැවත නිවසට යාම සඳහාත් ලබා දී තිබූ ප්‍රවාහන පහසුකම් ලබානොදීමටත්, ඒ වෙනුවෙන් රු.20,000/- ක දීමනාවක් ගෙවීමටත් සංස්ථා මණ්ඩලය තීරණය කර ඇත.

ii. 2017.11.23 වන දින පැවති සංස්ථා මණ්ඩල රැස්වීම් අංක 2017/13 හි තීරණ අංක 13 අනුව සංස්ථා බඳවා ගැනීම් පටිපාටිය අනුමත කරවාගෙන 2006 චක්‍රලේඛය අනුව වැටුප්තල වෙත අන්තර්ග්‍රහණය කර, කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2015 අනුව ප්‍රවාහන දීමනාව රු.50,000/- සමඟ ඉන්ධන දීමනාව ගෙවන තෙක් සංස්ථාවේ අධ්‍යක්ෂවරුන් සඳහා රු.20,000/- දීමනාවක් පමණක් ගෙවීමට තීරණය වී ඇත.

(ඌ) විගණනය විසින් සඳහන් කර ඇති වාහන සියල්ල ම ධාවනයෙන් ඉවත්කර ඇත. රාජ්‍ය මුදල් චක්‍රලේඛ 2/2015 අනුව අපහරණය කිරීම සඳහා අදාළ වාර්තාව මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කර ඇත.

3 මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

(අ) ඉතා පැරණි ණය ශේෂ අයකර ගැනීමේ හැකියාවක් සහ ද්‍රවශීලතාවයක් නොමැති බව පිළිගන්නා අතර, අයකරගත නොහැකි ණය ගිණුම්වලින් ඉවත් කිරීම සඳහා කටයුතු කරමින් ඇත.

(ආ) විගණන නිරීක්ෂණ නිවැරදිය

(ඇ) විගණන නිරීක්ෂණ නිවැරදිය

3.3 සංස්ථාවට එරෙහිව හෝ සංස්ථාව විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධීන්

(අ) විගණන නිරීක්ෂණ නිවැරදිය

(ආ) විගණන නිරීක්ෂණ නිවැරදිය නීති අංශයේ උපදෙස් අනුව ඉදිරි කටයුතු කරනු ඇත.

(ඇ) විගණන නිරීක්ෂණ නිවැරදිය

(ඈ) මහා අධිකරණයට ඉදිරිපත් කර නඩුව නිෂ්ප්‍රභා කර ඇත.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

4.1.1 සැලසුම් කිරීම

(අ) අභ්‍යන්තර විගණන සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම වෙන වෙනම ලේඛන ලෙස ඉදිරිපත් කර ඇත.

(ආ) 2016 - 2020 දක්වා සංයුක්ත සැලැස්ම සකස් කර සංස්ථා මණ්ඩලයට ඉදිරිපත් කර ඇත. සංස්ථා මණ්ඩල අනුමතියෙන් පසු අදාල ආයතන වෙත ඉදිරිපත් කිරීමට නියමිතය.

4.1. 2 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

ක්‍රියාකාරී සැලැස්ම සැලසුම් කරන ලද ගිණුම්කරණ මෘදුකාංග පුහුණු වැඩසටහන් වලින් බොහෝ පුහුණු වැඩසටහන් ඉටුකර ඇත.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

(අ) මෙම තත්ත්වය මගහරවා ගැනීම සඳහා 2014 වර්ෂයේ සිට ප්‍රත්‍යාගණනය කටයුතු කරයි. අදාළ කමිටුව මගින් ලබාගෙන වාර්තාව අනුව නිවැරදි කළ හැක.

(ආ) 2018 වර්ෂයේ සිට භාවිතයට නොගන්නා භාණ්ඩ ඉවත් කිරීමට පෙර ඒවායේ පිරිවැය හා ක්ෂය වටිනාකම හඳුනාගෙන වත්කම් ඉවත් කිරීමේ ගිණුමට ගැලපීමට කටයුතු කිරීමට නියමිත ය.

(ඇ) විගණන නිරීක්ෂණ නිවැරදි ය.

(ඈ) විගණන නිරීක්ෂණ නිවැරදි ය.

(ඉ) මේ සම්බන්ධ පරීක්ෂණයක් පැවැත්වෙමින් ඇත.

4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

මේ පිළිබඳ පරීක්ෂා කර බලා 2018 වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරයි.

4.4 දෘශ්‍ය අක්‍රමිකතා

C1 - C12 සම්බන්ධතා මැදිරි සඳහා Mixer 12 ක අවශ්‍යතාවය සැලසුම්කර තිබුණ ද, සැලසුම ක්‍රියාත්මක කිරීමේ පහසුව තකා (C1 - C12) මැදිරි දිනපතා විකාශන කටයුතු සඳහා භාවිතා වන සම්බන්ධතා මැදිරි සියල්ල එකවර අලුත්වැඩියා කිරීමේ අපහසුතා නිසා පියවර දෙකකින් වර්ෂ දෙකක දී කිරීමට සිදු විය. ඒ අනුව ටෙන්ඩර් කැඳවීම ද දෙවරකට සිදු විය. ඒ අනුව මැදිරි අංක C1 - C12 දක්වා පළමු අදියර වශයෙන් 2016 දී ටෙන්ඩර් කැඳවීම කළ අතර, දෙවන අදියර වශයෙන් 2017 දී C1 - C6 සහ පාලක මැදිරි නවීකරණය කරන ලදී. ඒ සමඟ ම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන්ට අනුව උපකරණ මිල දී ගැනීම ද කරන ලදී. මේ අවස්ථා දෙකේ දී ම පිරිවිතර වෙන වෙන ම සකසන ලදී. දෙවන අදියරේ දී Mixer සඳහා පිරිවිතර යාවත්කාලීන කරන ලදී.

4.5 අරමුදල් ඌණ උපයෝජනය

විගණන නිරීක්ෂණය නිවැරදිය. ප්‍රායෝගික ගැටළු නිසා එම වියදම් ගෙවීම ප්‍රමාද වී ඇත.

4.6 නිෂ්ක්‍රීය /ඌන උපයෝජිත වත්කම්

(අ) ඇමරිකන් හඬ පාවිච්චි කරන ලද කෙටි තරංග ට්‍රාන්ස්මීටර යන්ත්‍රයක් 2017 වර්ෂයේ පරිත්‍යාග වශයෙන් ලැබුණු බව සත්‍යයකි. නමුත් වර්තමානයේ ත්‍රිකුණාමල විකාශනාගාරයෙන් විකාශය වන ගුවන්කාලය අඩු වී ඇත. එයට හේතුව වන්නේ මේ දක්වා වැඩසටහන් ලබාදුන් Feeba D. W. Ray යන ආයතන තම වැඩසටහන් නවතා දැමීමයි. මෙම ට්‍රාන්ස් මීටර් යන්ත්‍රය සවි කිරීම සඳහා අධික වැය බරක් දැරීමට සිදුවේ. ඉහත තත්ත්වය මත මෙය ඵලදායී නොවන ආර්ථික ක්‍රියාවකි.

(ආ) විගණනය සඳහන් කරන නිසාන් වර්ගයේ මෝටර් කාර් රථය 1995 නිෂ්පාදිත මෝටර් රථයකි. ඉතා පැරණි මෙම රථය ධාවනයෙන් ඉවත්කර අපහරණය කිරීමට යෝජනා කර ඇත.

4.7 අනාර්ථික ගනුදෙනු

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ පොත් අනුව ගෙවිය යුතු බදු මුදල් ලෙස පෙන්වා ඇති මුදල නිවැරදි ය. දැනට බදු සහනයක් ලබාගැනීමට අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීමට නියමිත ය.

4.8 හඳුනාගන්නා ලද පාඩු

(අ) මෙය අවිනිශ්චිත ශේෂයක් නොවන නිසා අවිනිශ්චිත ගිණුමට ඇතුළත් කළ නොහැක. මෙම ශේෂය අනිවාර්යයෙන් ම සංස්ථාවට අයවිය යුතු මුදලක් නිසා විවිධ ණයගැතියන් ලෙස දක්වා ඇත.

(ආ) ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත් කරන ලදී.

(ඇ) පරීක්ෂණ සිදුවෙමින් පවතී.

4.9 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්/ දේපලවල ව්‍යාපෘති ආරම්භ කිරීම.

(ආ) ගුවන්විදුලි සංස්ථාව විසින් භුක්ති විඳින ලද මෙම ඉඩම් කොටස නිදහස් දීමනා පත්‍රයක් මගින් ලබාදෙන ලෙස ඉල්ලා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත.

(ආ) කඳුරට සේවය ආරම්භ කරන ලද දින සිට මේ දක්වා මෙම ඉඩම තුළ පවත්වාගෙන යයි. රජයේ ඉඩමක් වන මෙම ඉඩම සංස්ථාවට පවරා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කරමින් ඇත. මේ වනවිට මැනුම් කටයුතු අවසන් කර ඇත.

(ඇ) මෙම වාහනය ආයෝජන මණ්ඩලය වෙත භාරදීමට කටයුතුර කර ඇත.

4.10 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් ආයතනයේ සම්පත්

අමාත්‍යවරුන්ගේ ඉල්ලීම අනුව සේවකයන් අමාත්‍යාංශවලට මුදාහැර ඇත. විගණන නිරීක්ෂණ නිවැරදි ය.

4.11 කාර්ය මණ්ඩල පරිපාලනය

(අ) බඳවා ගැනීම් හා උසස්වීම් පටිපාටිය සකස් කරමින් ඇත.

(ආ) 2018 වර්ෂයේ නව සේවක සංයුතියක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කර ඇත.

(ඇ) බඳවා ගැනීම් පටිපාටිය අනුමතවීමෙන් පසුව මෙම තනතුරු ස්ථිර පදනමින් බඳවා ගැනීමට නියමිත ය.

(ඈ) 2018 වර්ෂයේ නව සේවක සංයුතියක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කර ඇත.

(ඉ) අධිකාරි ඉංජිනේරු වී. එච්. එෆ්. සහ මැදිරි සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා බඳවා ගැනීමට කටයුතු කර ඇති අතර, අනෙකුත් තනතුරු තවමත් පුරප්පාඩුව පවතී.

(ඊ) විගණන නිරීක්ෂණ නිවැරදි ය.

(උ) අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබූ නිසා මෙම පත්වීම් ලබා දී ඇත.

4.12 වෙළඳපොල කොටස

විගණන නිරීක්ෂණ නිවැරදි ය.

5. තිරසාර සංවර්ධනය

තිරසාර සංවර්ධනය අරමුණු ලඟා කර ගැනීම.

(අ) මේ සම්බන්ධයෙන් සංස්ථාව මහජනතාව දැනුවත් කිරීම සඳහා වැඩසටහන් ප්‍රචාරයට යොදයි.

(ආ) ගුවන්විදුලියේ කාර්යභාරය වන්නේ ශ්‍රාවකයින්ගේ දැනුම කුසලතා හා ආකල්ප ධනාත්මකව සාධනය කිරීම සඳහා කටයුතු කිරීමයි. ඒ සම්බන්ධයෙන් සංස්ථාව 2017 වර්ෂයේ දී තම විෂය පථයට අදාල කටයුතු කර ඇත.

6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

6.1 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

6.1.1 ප්‍රසම්පාදනයන්

අ) ප්‍රාග්ධන හා අයභාර ලෙස වියදම් පුරෝකථනය කරමින් ප්‍රසම්පාදන සැලැස්ම සකස්කොට විගණනයට ඉදිරිපත් කර ඇත.

(ආ) විගණන නිරීක්ෂණ නිවැරදිය.

(ඇ) i විගණනය සඳහන් කර ඇති අවස්ථා දෙකක දී ම සංස්ථාව විසින් සකස් කළ පිරිවිතර හා

ii සමාන වන ලෙස සැපයුම්කරුවන් උපකරන සපයා තිබූ බව සත්‍යයකි. නමුත් සංස්ථාව ලංසුකරුවන් ඉවත් කරගෙන පිරිවිතර සැකසූ බව පිළිගත නොහැකිය.

(ඈ) පිරිවිතර සැකසීමේ දී පුහුණු කිරීමක් ප්‍රසම්පාදක මණ්ඩලය මගින් ඉල්ලා නොසිටින ලදී. නමුත් AEQ සමාගම මගින් පුහුණුව ලබාදීම යෝජනා කරන ලදී. ආරම්භයේ දී පුහුණුව සඳහා වියදම සහ නවාතැන් පහසුකම් පමණක් නොමිලේ සැපයීමට ඔවුන් යෝජනා කළ අතර, (ගුවන් ගාස්තු ගුවන්විදුලිය මගින් සැපයිය යුතු විය.) පසුව ගුවන්විදුලිය මගින් කරන ලද ඉල්ලීම පරිදි ගුවන් ගාස්තු ගෙවීමටද AEQ සමාගම කැමැත්ත ප්‍රකාශ කරන ලදී. ගුවන්විදුලියට කළ යුතුව තිබුණේ සහභාගි වන නිලධාරීන් සඳහා ආහාර වියදම් සැපයීම පමණි. කෙසේ වුවද ගුවන්විදුලිය මගින් AEQ සමාගමෙන් පුහුණුවක් කිසිම අවස්ථාවක ඉල්ලා සිටියේ නැත.

(ඉ) 2017 ජනවාරි 25 දාතමින් AEQ සමාගමේ විකුණුම් කළමනාකරු විසින් ඉදිරිපත් කරන ලද ලිපියේ සියලු වියදම්

ඔවුන් දරන බව සඳහන් කර ඇත්තේ හුදෙක් වීසා ලබගැනීමේ පහසුව තකා ප්‍රංශ තනාපති කාර්යාලයට (ස්පාඤ්ඤ වීසා නිකුත් කරනු ලබන්නේ ප්‍රංශ තනාපති කාර්යාලය මගිනි.) ඉදිරිපත් කිරීම සඳහා පමණි. එමගින් වීසා ලබා ගැනීම පිණිස පුහුණුව සඳහා සහභාගි වන නිලධාරීන් ප්‍රංශ තනාපති කාර්යාලයට සැපයිය යුතු ආදායම් පිළිබඳ වාර්තා අවම කිරීම පිණිසය.

(ඊ) 2018 වර්ෂයේ මැයි මාසයේ මහජන බැංකුව වෙත මුදල් ලැබී ඇත.

(උ) නව සේවක සංයුතිය සඳහා යෝජනා කර ඇත.

6.1.2 ප්‍රමාද වූ ව්‍යාපෘති

මේ සම්බන්ධ ගිණුම්කරණ මෘදුකාංගය ක්‍රියාත්මක වෙමින් ඇත.

6.2 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2015 වර්ෂයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර ඇත.

6.3 නොවිසඳී ඇති විගණන ඡේද

(අ) විගණන නිරීක්ෂණ නිවැරදි ය.

(ආ) විගණන නිරීක්ෂණ නිවැරදි ය.

(ඇ) මෙම නිවාස අධිකාරිය මගින් ඔප්පු ලබාදෙන අවස්ථාවේ පවරාදීමට නියමිත ය.

(ඈ) මෙය ජනාධිපති ලේකම් කාර්යාලයට අයත් වාහනයකි. ආපසු භාර දී ඇත.

(ඉ) මහවැලි අධිකාරියට ලබාදීමට කටයුතු කර ඇත.

(ඊ) ව්‍යාපෘතියට අදාළ ලේඛන නොමැති බැවින් ගිණුම් ගත කර නැත.

(උ) නීති අංශය මගින් කටයුතු කිරීමට නියමිතය.

(ඌ) විගණන නිරීක්ෂණ නිවැරදි ය.

(එ) නීති අංශය ගිවිසුම් අත්සන් කිරීමට නියමිත ය.

(ඒ) විගණන නිරීක්ෂණ නිවැරදි ය.

(ඔ) ව්‍යාපෘතිය තවදුරටත් කෙරීගෙන යයි.

(ඕ) වන්දි ඉල්ලුම් කර ඇතත් ක්‍රියාත්මක වී නැත.

(ක) පරීක්ෂණයක් පැවැත්වෙමින් ඇත.

6.4 සමාජ වගකීම් ඉටු කිරීම

විගණන නිරීක්ෂණ නිවැරදි ය.

6.5 පද්ධති හා පාලනයන්

(අ) i සංස්ථාවේ පුද්ගලිකව මිලදී ගෙන ඇති ඉඩම් සඳහා ඔප්පු ලබාගෙන ඇත. නමුත් ගුවන්විදුලියේ කාර්යයන් සඳහා රජය විසින් පවරා දී ඇති ඉඩම් සඳහා රජය ගුවන්විදුලියට ඔප්පු ලබා දී නැත. ඉඩම් පවරා ගැනීමේ දී සමහර අවස්ථාවල ඉඩම් හිමියන්ට වන්දි මුදල් ගෙවා ඇත්තේ සංස්ථාව විසිනි.

ii සංස්ථාවට මධ්‍යම තරංග විකාශනාගාර පවත්වා ගෙන යාම සඳහා විශාල ඉඩම් ප්‍රමාණයක් තිබුණ ද, එම තාක්ෂණය අවසන් වූ පසු ගුවන්විදුලි කාර්යයන් සඳහා ප්‍රායෝජනයට ගෙන නොමැත.

iii ගුවන්විදුලි කාර්යයන් සඳහා භුක්ති විඳිමින් සිටියත් එම කාර්යයන් අවසන් වූ පසු රජයේ දේපලක් ලෙස අදාළ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් මගින් පාලන.....

iv. ලංකාව පුරා ගුවන්විදුලිය භුක්ති විඳින ලද ඉඩම් විශාල සංඛ්‍යාවක් ඇත. භෞතිකව සත්‍යාපනය කිරීම ඵලදායී නොවන්නේ ගුවන්විදුලි කාර්යයන් සඳහා යොදා නොගන්නා නිසාවෙනි.

v. වත්කම් පරිපාලනයේ දුර්වලතා නිසා සංස්ථාවට පාඩු සිදු වී ඇත යන වගන්තිය පිළිගත නොහැක.

(ආ) ඉතාමත් පැරණි භාණ්ඩවල පිරිවැය හඳුනා ගැනීමේ අපහසුව නිසා ඉවත් කළ භාණ්ඩ වටිනාකම ගිණුම්වලට ගැලපීමට නොහැකිය.

(ඇ) i. අදාළ මූලික ලේඛන නොමැති නිසා අයකර ගැනීමට අපහසු බැවින් භාණ්ඩාගාරයේ අනුමතිය මත ඉවත් කිරීමට නියමිත ය.

ii. 2018 අවසන් ගිණුම්වලින් නිවැරදි කිරීමට නියමිත ය.

(ඈ) i. තොග ආගණනයේ දී හඳුනා ගත් ඌණතා හා අතිරික්ත වාර්තා ගත කර ඇත.

ii. නව පරිගණක මෘදුකාංග පද්ධතිය ක්‍රියාත්මක කිරීමෙන් පසු නිවැරදි වේ.

(ඉ) 2018 වර්ෂයේ වාහන පිළිබඳ භෞතික සත්‍යාපනය කිරීමට නියමිත ය.

(ඊ) i. හඳුනාගෙන නිවැරදි කර ඇත.

ii සංස්ථාවේ මූල්‍ය තත්ත්වය අනුව ගෙවීම් ප්‍රමාද වී තිබූ වියදම් නිරවුල් කර ඇත.

iii විගණන නිරීක්ෂණ නිවැරදි ය.

(උ) i බඳවාගැනීම් පටිපාටිය සකස් කරමින් ඇත.

ii සේවා අවශ්‍යතාවය මත බඳවාගෙන ඇත.

iii මේ සම්බන්ධයෙන් අධ්‍යයනයක් කර වැඩ පැවරීමට නියමිත ය.

iv විධිමත් සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල මත බඳවා ගෙන ඇත.

(ඌ) i නව ගිණුම්කරණ පද්ධතියක් හඳුන්වා දී ඇත.

ii මෙම ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

iii නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

(එ) i වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කිරීම.

ii විකාශනාගාර නවීකරණය කිරීම ප්‍රසම්පාදන නීතිරීති අනුව සිදුවේ.



ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව, කොළඹ 07
இலங்கை ஒலிபரப்புக் கூட்டுத்தாபனம், கொழும்பு 07
Sri Lanka Broadcasting Corporation, Colombo 07